

# බෞද්ධඥනාලෝකය

# හෙවත්

# ධාතුමනසිකාර දීපනිය.

# BAUDDHA GNANALOKAYA

OR

## DHATUMANASIKARA DEEPANIYA

BY

BHADANTA SIRIDHAMMA THERO.

WISUDDHARAMAYA

MALIGAWATTA, COLOMBO

---

PUBLISHED BY

J. D. FERNANDO

AND

A. A. GABO SINGHO.

---

PRINTED AT THE

GRANTHAPRAKASA PRESS, COLOMBO.

---

2460.

1916.

# සංඥාපනය.

"ධාතුමනසිකාරදීපනී" නම්වූ මෙම ග්‍රන්ථය අප බෞද්ධ මහා ජනතාවට මේ ලැබී තිබෙන බුද්ධශාසනයාගේ සාරාංශයවූ ධාතුවක්ෂුස නොහොත් "මමය මාගේ" යයි නොගතයුතු පස්ය, දියය, ගිනිය, සුළඟය, ආකාශය, විඤ්ඤාණය යන ධාතුෂට්කය "මමය මාගේය" යි වරදවා දැඩිසේ ගැනීමෙන් අනවරාග්‍ර සංසාරයෙහි පටන් අධ්‍යාත්මිකසන්තානයෙහි නොකඩව පවත්වාගෙන එන්නාවූ සත්කායදෘෂ්ටි මූලක ක්ලේශාන්ධකාර සියල්ලක් විධ්වංසනයකිරීමෙන් ශරීරය පිළිබඳ ධාතුලක්ෂණ ධර්මලක්ෂණ දක්නාවූ ඥානාලෝකය උපදවාගතයුතු අයුරු දක්වා ලියනලද්දකි.

බුද්ධෝත්පාදකාලය වනාහි සකල සත්පුරුෂයන්ටම සත්කායදෘෂ්ටි ආදී ක්ලේශගිනි නිවාගැනීමට සුදුසු කාලයයි. මනුෂ්‍යයන් විසින්ද මනුෂ්‍ය යස ඓශ්වර්ය සම්පත් හැරදමා සත්කායදෘෂ්ටි ආදී ක්ලේශගිනි නිවාගනු පිණිස උත්සාහකටයුතු කාලයනම් මේ බුද්ධෝත්පාද කාලයමැයි. දෙවියන් විසින්ද දිව්‍ය යසඓශ්වර්ය සම්පත් හැරදමා සත්කායදෘෂ්ටි ආදී ක්ලේශ ගිනි නිවාගනු පිණිස උත්සාහකටයුතු කාලයනම් මේ බුද්ධෝත්පාද කාලයමැයි. බ්‍රහ්මයන් විසින්ද බ්‍රහ්ම යසඓශ්වර්ය සම්පත් හැරදමා සත්කායදෘෂ්ටි ආදී ක්ලේශගිනි නිවාගනු පිණිස උත්සාහකටයුතු කාලය මේ බුද්ධෝත්පාද කාලයමැයි.

මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්ම යසඓශ්වර්ය සම්පත් සංසාරකාන්තාරයෙහි සැරිසරායන සත්වයන්ට නැවත නැවත ලැබීම ධර්මතාවකි. ඒ ලෞකික මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්ම යසඓශ්වර්ය සම්පත් වනාහි සත්කායදෘෂ්ටි ආදී ක්ලේශාග්නියට හිතවූ සත්කායදෘෂ්ටි ආදී ක්ලේශාග්නිය දියුණුකරන්නාවූ ජරා මරණ ගින්නෙන් දවා හළුකරනුලබන තණපරඬැල් රැසකට බඳු නිසරු සම්පත් කොටසක්ය. මේ භවයෙහිම හමුවූ සම්පත් කොටසක්ද නොවේ. මේ ලැබීතිබෙන බුද්ධෝත්පාදකාලයවනාහි අනවරාග්‍ර සංසාරයෙහි පටන් අප බෞද්ධ මහා ජනතාවගේ සිත්සතන්හි දල්වී දල්වී එන්නාවූ සත්කායදෘෂ්ටි නිරය ගිනි නිවාගැනීමට යෝග්‍යවූ කාලයවන්නේය. එහෙයින් පරම දුලභවූ බුද්ධෝත්පාදයෙන් යුක්තවූ අගනා කාලය මුළුල්ලෙහිම රූපශබ්දාදි වස්තු

කාම නමැති තණපරබැල් දම දමා කාමතෘෂ්ණාගින්න තැපි මෙන්ම නොසිඳ ශාසනමාමක ධර්මාමකවූ සකල සාධුජන යන් විසින්ම මේ ධාතුමනසිකාරදීපනියෙහි ප්‍රකාශවන්නාවූ පෘථිවි ආදි ධාතුෂට්කය උද්ග්‍රහණාධාරණයෙන් පුරුදු පුහුණු කොට භාවනානුයෝගීවීමෙන් ස්වකීය සන්තානානුගත සත්කායදෘෂ්ටි ආදි කෙලෙස් ගිනි නිවා පරම රමණීය අමෘත මහානිර්වාණ අභයපුරයට පැමිණීම පිණිස උත්සාහකටයුතු.

## ආචාර්ය සිරිධම්ම ස්වාමිපාදයන්වහන්සේ

මුන්වහන්සේ පිළිබඳ කරුණු ස්වල්පයක් පහළකිරීම කාලානුරූපයයිහැඟිගියහෙයින් උන්වහන්සේගේ ශාසනික සොහොයුරුතුමෙක්වන බදුල්ලේ ගෞරවනීය "ඤාණවිලාසාභ" ස්වාමිපාදයන්වහන්සේගේ සහායත්වයෙන් බුරුමරටින් එවූ ලියුම් කියුම් හා දනගත් කරුණු අනුසාරයෙන් සංග්‍රහකරවා ගන්නාලද මෙම ලුහුඬු වෘත්තාන්තය මෙහි සඳහන්කරන්නෙමු

මුන්වහන්සේ සෙංකඩගල නගරයට ආසන්න පාතදුම්බර අරංගල නම් ග්‍රාමය ජන්මභූමිකොට ඇත්තේවිය. බාලවියෙහි පැවිදිකරවනු කැමතිවූ පියතුමන්වන "දොන් බබාඅප්පුහාමි" වෙදමහතාණන් විසින් තමන් කල්‍යාණ මිත්‍රත්වයෙන් ඇසුරු කරනුලැබූ මාතලේ කුඹියන්ගොඩ විජයනන්දනාරාමාධිපතිව වැඩවිසූ සුපෙසල ශික්ෂාකාමී නාරංපනාවේ "ඉන්දජෝතාභ" මහා ස්ථවිරපාදයන්වහන්සේ වෙත බාරදෙනලදින් ප්‍රව්‍රජ්‍යා භූමියට පමුණුවා හෙරණ බණදහම් පුරුදු පුහුණුකොට නික්මවා වදාළේය.

නැවත එසින් නික්ම එවකට ගාල්ලේ විජයානන්ද පරිවෙණාධිපතිව වැඩවිසූ සත්කීර්තිමත් ගෞරවාර්හ පයාගල "ශ්‍රී සුමන තිස්ස" ස්ථවිරස්වාමිපාදයන්වහන්සේ වෙත එළඹ උන්වහන්සේ උපාධ්‍යාචාර්ය කරගනිමින් වාගීශ්වර පඬිතුමන්ගේ හා ඤාණසාකාංශ උප ගුරුතුමන්ගේද ආධාරයෙන් ශබ්දශාස්ත්‍රය සහිත බණදහම් ඉගනීමෙහි නොපසුබස්නා වීර්යයෙන් යෙදී අධ්‍යාපන විභාගයකින්ද සමත්වීභාවයට පැමිණ උගණිමින් එන අතර ආචාර්යෝත්තමවූ යථෝක්ත ශ්‍රී සුමනතිස්ස ස්ථවිර යන්වහන්සේට වැළඳි රෝගාබාධය ගැන ව්‍යාවෘතවෙන්ට සිදුවිය.

ඉන්පසු උන්වහන්සේගේ රෝගය අසාධ්‍යබවට පැමිණ ස්වර්ගස්ථවී වදාළබැවින් බාලකාලපටන්ම අභිමතාර්ථ සංසිද්ධි කරණයෙහි නුවණ හා නොපසුබස්නා වීර්ය ආදි ගුණ ඇතිවූයෙන් ධර්මවිනයෝද්ග්‍රහණාභිලාෂීව බුරුමරටට යාම පිණිස අදහස උපදවා තමවැඩිමහල්සොහොයුරුතුමන්ගේ ආධාරඇතිව

ශ්‍රී බුධ වර්ෂ 2489 ක්වූ වප්මස පුරදියවක්නම් තිථියලත් සඳුදින ලක්දිවින් පිටත්ව බුරුමරාජ්‍යයට පැමිණ “රැන්ගුන්” නුවර “මහා ධම්මදීපිකාරාම”යෙහි වැඩවදාරණ “සාසනාලඞ්කාර සද්ධම්මාභිවංස සිරිපවර කවිධජ මහා ධම්මරාජාධිරාජගුරු”මහා නායක ස්වාමීන්ද්‍රයාණන්වහන්සේ උපාධ්‍යායකොටගෙන දෙසියනමක් පමණ කාරක මහා සංඝයා මධ්‍යයෙහි මහණ උපසම්පදාලැබ උන්වහන්සේම කලක් ඇසුරුකරමින් උපසපන්වූ භික්ෂූන් විසින් අවශ්‍යයෙන්ම ප්‍රගුණකටයුතු “භික්ෂු භික්ෂුණී උභය ප්‍රාතිමොක්ෂ ඛුදුසික්ඛ මූලසික්ඛ” යන විනයපොත් සතර ප්‍රගුණකොටගෙන නැවත “මණ්ඩලේ” නුවර මහා විසුද්ධාරාමාධිපති “විසුද්ධාචාර කවිධජාධිපති සිරිපවර මහා ධම්මරාජාධිරාජගුරු” ශ්වෙජින්වංශික සංඝනායක ස්වාමීන්ද්‍රයාණන්වහන්සේ ආදී ආගමධාරී සුපේසල ශික්ෂාකාමී මහොත්තමයන්වහන්සේලාගේ සමීපයෙහි ශබ්දශාස්ත්‍රය සහිත පර්ය්‍යාප්ති ධර්මය පුරුදු පුහුණුකොට අණ්ඩුව විසින් ධර්මශාස්ත්‍රයන් පිළිබඳව පවත්වනුලබන පාධම්විභාගයට බැඳී තුන්වෙනිවර දක්වා සමත්කම්ලැබ රාජහස්ත හා පුදපඩුරු ලැබීමෙන් සම්භාවනීයබවට පැමිණ එරටදිම සියගණන් භික්ෂුසාමණේරයන්වහන්සේලාගේ ධර්මාචාර්ය්‍යවරයෙක්ව උගන්වමින් සිටිනාතර රත්නපුරේ ජයසුනනාදාරාමාධිපති දෙවගොඩ “දේවානන්ද” ස්ථවිරස්වාමිපාදයාණන්වහන්සේගේ හා ඒ ප්‍රදේශයෙහි රදළ මහතුන් ඇතුළු සැදැහැවතුන්ගේ ආරාධනාලැබ ආචාර්ය්‍ය උපාධ්‍යායන්වහන්සේලාට සැලකොට අවසර හා සන්දේශද ලබාගෙන ශ්‍රී. බු ව 2455 ක්වූ උඳුවප්මස පුරසතවක්නම් තිථියලත් ගුරුදින අනේකවාසික ශිෂ්‍යපිරිසක්ද කැටිව ලක්දිවට පැමිණ ගාල්ලේ විජයානන්ද පිරුවන්හි දායකමහතුන්ගේ අයදුමෙන් එහි වැඩමවා ටිකදිනක් පසුකර රත්නපුරයට පැමිණ අවුරුද්දක් පමණ ශාසනසඞ්ග්‍රහයකොට සිත්වූ පරිදි ශිෂ්‍යපිරිසක් ලබාගැනීමේ දුෂ්කරතාව ගැන මෙනෙහිකරමින් සිටිනාතර බුරුමරටින් ස්ථවිරයන්වහන්සේලා කීපනමක් ඇතුළු ගිහිපිරිසක් දළදාවන්දනාව පිණිස වැඩමවනබව දැනුම්දී එව් බැවින් ඒ සඳහා කොළඹට වැඩමවන්ට සිදුවිය. ඒ අතර කොළඹ නගරයෙහි වාසයකරන අප ටිකදෙනෙකු විසින් ආවාස උපස්ථාන සලස්වා ආරාධනාකරනලදින් තමන්වහන්සේගේ උත්තමාධ්‍යාශය සඵලවීමට සුදුසු ආරාධනාවක්බව සලකා රත්නපුරේ දායක මහතුන්වෙත ලියා යවා වැඩිසතුටක් නොලත් නමුත් සිත්වූ පරිදි ශාසනසඞ්ග්‍රහයක්කිරීමේ අදහස නිසා එම ආරාධනාව පිළිගත්කල්හි“විසුද්ධාරාම”යන නමින් තාවකාලික

ආවාසයක් තනවාදී උපස්ථම්භිතවූයෙන් මේ දක්වා පස්අවුරුද්දක් පමණ තමන්වහන්සේ වෙත පැමිණෙන ගිහි පැවිදි සමූහයට බුද්ධවචනය හා ශබ්දශාස්ත්‍රය ඉගැන්වීමෙන්ද සැම ඉරුදිනවල හා පොහෝදිනවල ධර්මශ්‍රවණාභිලාෂීව පැමිණෙන ජනසමූහයාට ධර්මදේශනාකිරීමෙන්ද නොයෙක් දිශාභාගවලින් පැමිණෙන ආරාධනා පිළිගෙණ ඒ ඒ පළාත්වලට වැඩමවා ධර්මදේශනාකිරීමෙන්ද, සරණගමන විනිශ්චය, ධාතුකර්මස්ථාන සඞ්ග්‍රහව, චමථවිදර්ශනාභාවනා දීපනිය, ආදී පුස්තක පඞ්ක්තියක් ලිහිල් භාෂාවෙන් ලියා විසුරුවාහැරීමෙන්ද ශාසනාභිවෘද්ධියට හේතු ක්‍රියාවන්හි ව්‍යාවෘතව වැඩවදාරන්නේය.

මේ "ධාතුමනසිකාරදීපනිය" යථෝක්ත සිරිධම්මස්වාමිපාද යන්වහන්සේ විසින් ඉරුදිනවල දේශනාකරනලද ධාතු දේශනාවන් ශ්‍රවණයකිරීමෙන් ප්‍රසන්නවූ අප විසින් අවශේෂ අප බෞද්ධ ජනතාවටද එයින් ප්‍රයෝජනලැබේවායි සලකා යාඥාකොට උන්වහන්සේ ලවා ඒ දේශනාවන් එකතුකොට සඞ්ග්‍රහකරවා ගන්නාලද්දකි

මේවිගට,

ජේ. ඩී. ප්‍රණාන්දු

සහ

ඒ. ඒ. ගබෝසිංඤෝ

යන අපි දෙදෙන වම්හ.

10. 8. 1916. දිනදීය.

# ශුද්ධිපත්‍රය.

---

| පිට. | පේළි. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 2 | 2 | සියළු | සියලු |
| ,, | 32 | ආධ්‍යාත්මික | අධ්‍යාත්මික |
| ,, | 37 | ධාතු | ධාතුහු |
| 5 | 26 | පඨකාතිය | පඨක්‍යාතිය |
| ,, | 28 | තුතීයට | තුතියට |
| 8 | 2 | ශරීරකොටස් | ශරීර කොඨාසයන් |
| 10 | 12 | ගස් | ගස්වල |
| 12 | 24 | තෙමාගනු<br>ලැබේ | තෙමනුලැබේ |
| 14 | 3 | අවාසනවි | අවසානවී |
| ,, | 26 | හටන්ගත් | හටගත් |
| 15 | 20 | උත්කෘෂ්ඨත්‍ය | උත්කෘෂ්ටත්‍යය |
| ,, | 21 | සූරභිඃ | සූරිභිඃ |
| ,, | 36 | බහන් | බහන් |
| 17 | 12 | පිටිකොන්දේ | පිටකොන්දේ |
| 18 | 25 | කුක්ෂිගතීයෙදී<br>-පෙ-සැලකිය<br>යුතු | මේ හෘදයමාංසයට මදක් උඩදී දෙ<br>අංසයෙන් තදවී වකුගඩුව පිහිටා<br>තිබේ. සමහරුන්ගේවකුගඩුව අතේ<br>මාපටඟිල්ලේ අගපුරුක පමණ මහ<br>ත්ය. සමහරුන්ගේ වකුගඩුව පයේ<br>මාපටඟිල්ලේ අගපුරුක පමණ මහ<br>ත්ය. සටහන එකනටුයේ හටගත්<br>අඹපල දෙකක් හා සමානය. වර්ණ<br>වශයෙන් තෙලඹු ගෙඩියකට බදු<br>ලා රත්පැහැයෙන් යුක්තයි. |
| 20 | 21 | කොෂ්ඨාබහ්‍ය<br>න්තර | කොෂ්ඨාභ්‍යන්තර |
| ,, | 28 | මෙහි | මේ ශරීරයෙහි |
| 22 | 3 | උත්පල | උත්පල |
| 28 | 11 | මෙසේසින් | මෙසෙසින් |
| ,, | 38 | පිරිසිදී | පිරිසිඳී |
| 30 | 1 | කිකිප්‍රියෙකුගේ | කිකිප්‍රියකගේ |
| ,, | 17 | යෙන් | ය. |
| 32 | 8 | යුක්ත | යුක්තවූ |

| පිට. | ලෙ. | ශුඩ. | ශුඩ. |
|---|---|---|---|
| 32 | 23 | ශාන්තපප්‍රණීත | ශාන්තප්‍රණීත |
| ,, | ,, | කරන්නාහුමය | කරගන්නාහුමය. |
| 34 | 6 | එහෙසින් ඒ | ඒ. |
| 35 | 11 | ශෙලෂම | ශෛලෂම |
| 36 | 27 | සැරව | සැරවන[illegible] |
| 39 | 9 | වූවත් | වුවත් |
| ,, | 12 | සැලකියයුතු | දතයුතු |
| ,, | 30 | සැලකියයුතු | දතයුතු |
| 41 | 14 | පාචකාග්නි ජනිත | පාචකාග්නියෙන් ජනිත |
| ,, | 20 | පිටම | පිට |
| ,, | 22 | ඇතුල්ම | ඇතුල් |
| 44 | 33 | ආපොකොටස් | ආපොකොට්ඨාස |
| 47 | 4 | දරුණු | දරුණුවූ |
| 52 | 5 | මාත්‍රයකි | මාත්‍රයයි |
| ,, | 6 | මාත්‍රයකි | මාත්‍රයයි |
| 57 | 12 | ඇවත්ති | ඇවැත්ති |
| 58 | 31 | කරනුලබන | කරන |
| 60 | 11 | ධාතු | ධාතුව |
| ,, | 24. | ධාතුද | ධාතුකොට්ඨාසද |
| 63 | 12 | ස්ත්‍රීයෙක | ස්ත්‍රියක |
| ,, | 13 | කිමපවා | කිමද |
| ,, | 14 | කියත්නෙක | කියත්නහුය |
| ,, | 21 | මහභූතයන් | මහාභූතයන් |
| ,, | 22 | පුරුෂයෙක | ස්ත්‍රියක පුරුෂයෙක |
| 70 | 26 | අපිනුඅසා | අපිනුඅස, |
| 73 | 3 | සැළිදෙක | සැළිදෙක ගෙන |
| 75 | 36 | විජජු | විජ්ජු |
| 76 | 11 | අපායික | ආපායික |
| 79 | 24 | ඔතප්ප | ඔතප් |
| 88 | 12 | ඒත්ත | චිත්ත |
| 95 | 20 | අඩිමො | අඩි |
| 96 | 18 | නාලද | නාවූ |

මේ වනාහි එකාකාර අශුඩ ස්ථානයන්ගෙන් එකක් බැගින් ගෙන ශුඩිය දක්වා ලියනලද්දකි.

# බෞද්ධාලෝකය

හෙවත්

# ධාතුමනසිකාර දීපනිය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

පඨව්‍යාපො ච තෙජොච, වායොකාස මනො'තිදං,
නෙසො හමස්මිනෙතං මෙ, එවං තත්‍ථ විරජ්ජති.

එවං විරත්තං ඛෙමත්තං, සබ්බසඤ්ඤො ජනා'තිගං,
අනෙවසං සබ්බධානෙසු, මාරසෙනාපි නාජ්ඣගං.

(මාතෘකා උද්දෙශගාථායි.)

ඉමයි අත්‍ථ දක්වනුලැබේ:—ලොකෙ, ලොකයෙහි; පඨවිච, (තදගතිය ලක්‍ෂණකොට ඇති) පෘථිවිධාතු කොට සක්ද; අත්‍ථි, ඇත; ආපොච, (අබන්‍ධනගතිය ලක්‍ෂණ කොට ඇති) ආපොධාතු කොටසක්ද; අත්‍ථි, ඇත; තෙජොච (ශීතොෂ්ණගතිය ලක්‍ෂණකොට ඇති) තෙජොධාතු කොටසක්ද; අත්‍ථි, ඇත; වායොච, විත්‍ථම්භනය හෙවත් (පුම්බ වීම්ගතිය) ලක්‍ෂණකොට ඇති) වායොධාතු කොටසක්ද; අත්‍ථි) ඇත; ආකාසමනොච, (පිරිසිඳිම්ගතිය ලක්‍ෂණකොට ඇති) ආකාශධාතු කොටසක් හා (දැනීම්ගතිය ලක්‍ෂණකොට ඇති, විඥානධාතු කොටසක්ද; අත්‍ථි, ඇත; එසො, මේ ධාතුපුඤ්ජය තෙම; අහං න අස්මි, මම නොවෙමි; (ශරීරය නම් පස්ය, දියය, ගිනිය, සුළංය, ආකාශපරිච්ඡෙදය, දැනීමය යන සවැදෑරුම්වූ ධාතුමාත්‍රයමුත් මමයයි මානයෙන් උන්නතව ගැනීමට කෙනෙක් හෝ පුද්ගලයෙක් නොවේය යනු භාවයි.) එතං, මේ ධාතුපුඤ්ජය; මෙ, මාගේ; න (සන්තකං) සතුදෙයක් නො වේ. (මාසතුයයි ගැනීමට සෑහෙන ද්‍රව්‍යරූසක්ද නොවේය යනු භාවයි.) ඉති, මෙසේ; යො, යම් ඥාණවන්තයෙක්; පස්සති, (ධාතු ස්වභාව දක්නාපිණිස) බලයිද; එවං, මෙසේ (බලා) තත්‍ථ, ඒ ධාතුපුඤ්ජය කෙරෙහි; විරජ්ජති, නොඇලෙයිද; එවං, මෙසේ කියනලද නයින්; විරත්තං, නොඇලෙන්නාවූ;

සබ්බසංයොජනාතිගං, සියලු සංයොජනයන් ඉක්මවූ; ඛෙමත්තං, සියළු භයින් නිසියවූ නිවන්සැප අත්පත්කළාවූ; තං, ඒ ක්‍ෂීණාවනතපුද්ගලයා; සබ්බඨානෙසු, (සසරසැරිසරා යන සත්වයන්ගේ වාසභූමිවූ) සියලු එක්තිස්තලයන්හිම; අන්වෙසං, පීඩාකරනු පිණිස සොයා යන්නාවූ; මාරසෙනාපි, (ජාතිය ජරාව මරණය ආදිකොට ඇති මාරසෙනාවෝද; නාජ්ඣගා, අල්වාගැනීමට නොපොහොසත්වෙත්මය.

මේ මතු විස්තරකරනුලබන ධාතුමනසිකාර නිද්දේශයාගේ සංක්‍ෂෙප උද්දෙශගාථා දෙකේ අර්ථයෝජනායි.

අනන්තදුකින් මිරිකි මිරිකී සසර සැරිසරා යන සත්වයන්ට මහානුභාවසම්පන්න නෛර්‍යාණික සර්වඥශාසනයක් ඉදිරියට මුණගැසී කල්‍යාණමිත්‍රසෙවනයෙන්ද යුක්තවූ මිනිසත්බවක් මහා කල්පලක්‍ෂයකිනුත් අසඞ්ඛ්‍යයකිනුත් සම්මුඛකරගැනීම දුෂ්කරමය.

එහෙයින් එබඳු ශාසනයක් ඉදිරියට මුණගැසී කල්‍යාණමිත්‍ර සෙවනයෙන්ද යුක්තව වාසයකරන සකල සත්පුරුෂයන්ට අයත් කෘත්‍යයනම් සියසතන්හි අනවරාග්‍ර සංසාරය මුළුල්ලෙහි මමය මාගේය කියවමින් පැවත එන ආත්ම වාදූපාදාන සත්කාය දෘෂ්ටිසනාන්ධකාරය විධ්වංසනයකිරීමෙහි පොහොසත්වූ ධාතු ඥානාලෝකය උපදවාගැනීමයි.

එබැවින් මෙකල ඒ ධාතු ඥානාලොකය උපදවාගනු කැමති සකල සත්පුරුෂයන් විසින්ම යට දක්වනලද ධාතුමනසිකාර මාතෘකා ගාථාදෙක අරුත් අදහස් සමග පුහුණුකිරීමෙන් මෙතැන්පටන් ප්‍රකාශවන්නාවූ විස්තරයබලා කෙශාදි ශරීර කොඨාස සිත්හි ධාරණයකොටගෙන සියලු දුක් කෙළවරකිරීමෙන් නිවන් පසක්කරනු පිණිස ධාතුමනස්කාරය වැඩීමෙහි උත්සාහවත් වියයුතු.

යට සංක්‍ෂෙපයෙන් දක්වනලද සවැදෑරුම් ධාතුඋද්දෙශයන් අතුරෙන් පළමුකොට පෘථිවිධාතු උද්දෙශයාගේ නිද්දේශය කියනුලැබේ.

## 1. පෘථිවිධාතු නිද්දේශය.

පෘථිවි ධාතුතොමෝ බාහිර පෘථිවිධාතුය ආධ්‍යාත්මික පෘථිවි ධාතුය කියා දෙවැදෑරුම්.

එයින් සත්වසන්තානයෙන් පිට බහිද්ධා සන්තානයෙහි මහ පොළොව මහමෙර සක්වළපව් හිමවත්පව් ගඟකොළුවන පඳුරු ගෘහ විමාන ආදී තදගති මොලොක්ගති ලක්‍ෂණකොට ඇති සියලුම ද්‍රව්‍යයෝ බාහ්‍ය පෘථිවිධාතුනම් වෙත්.

සත්වසන්තානයෙහි 1 කෙස්, 2 ලෝම්, 3 නිය, 4 දත්, 5 සම්, 6 මස්, 7 නහර, 8 ඇට, 9 ඇටමිදුලු, 10 වකුගඩුව, 11 හෘදය මාංසය, 12 අක්මාමාංසය, 13 දලබුසිව්ය; 14 බඩදිව, 15 පපු ගඩුව, 16 අතුණු, 17 අතුණුබහන්, 18 නොපැසුණු ආහාර, 19, ආහාරමල, 20 මොල, යන මේ විසි(20)කොටස අධ්‍යාත්මික පෘථිවිධාතු නම්වෙත්.

මේ අධ්‍යාත්මික පෘථිවිධාතු විසි (20) කොටස එකක්පාසා **වර්ණය, සණ්ඨානය, පිහිටි ස්ථානය, පර්‍යන්ත පරිච්ඡේදය** යන සතරාකාරයෙන් පිරිසිද දැනගතයුතු. කෙසේද? යත්.

### 1. කෙසා, (හිසකෙස්.)

මේ කෙශයෝ වනාහි වර්ණ වශයෙන් බොහෝසේ කාලවර්ණයෙන්ද සණ්ඨාන වශයෙන් එක්රියන් ප්‍රමාණකොට කපනලද නූල් රැසකට බඳු සටහනින්ද යුක්තවෙත්. පිහිටි ස්ථාන වශයෙන් ශීර්ෂවෙෂ්ඨන චර්මයෙ (හිසවසා සිටි සමෙ) හිපිහිටා තිබෙත්. පර්‍යන්ත පරිච්ඡේද වශයෙන් පිටවී සිටි කොටස ආකාශයෙන්ද ඇතුල්වීසිටි කොටස ශීර්ෂචර්මයෙන්ද පිරිසිඳ පිහිටාතිබේ.

මෙසේ මේ කෙශයෝනම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍යන්ත පරිච්ඡේදයෙන්ද අවශෙෂ කොට්ඨාස යන් කෙරෙන් වෙන්වූ තදගතියෙන් යුත් එක්තරා අධ්‍යාත්මික පෘථිවිධාතු මාත්‍රයකි.

### 2. ලෝමා, (ලෝම්.)

මේ ලෝමයෝ වර්ණ වශයෙන් බොහෝසේ කාලවර්ණයෙන්ද සණ්ඨාන වශයෙන් අගලට දෙකට කපනලද නූල් රැසකට බඳු සටහනින්ද යුක්තවෙත්. පිහිටි ස්ථාන වශයෙන් අතුල් පතුල් හැර සෙසු ශරීරචර්මයෙහි සමහරතැනක අධික වශයෙන්ද සමහරතැනක මඳ වශයෙන්ද සැමතන්හිම පිහිටා තිබෙත්. පර්‍යන්ත පරිච්ඡේද වශයෙන් පිටවීසිටි කොටස ආකාශයෙන්ද ඇතුල්වී සිටි කොටස ශරීර චර්මයෙන්ද පිරිසිඳ පිහිටා තිබේ.

මෙසේ මේ ලෝමයෝනම් වර්ණයෙන්ද. සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍යන්ත පරිච්ඡේදයෙන්ද අවශෙෂ කොට්ඨාස යන් කෙරෙන් වෙන්වූ තදගතියෙන් යුත් එක්තරා අධ්‍යාත්මික පෘථිවිධාතු මාත්‍රයකි.

### 3. නඛා, (විසි නියපොතු.)

මේ නියපොතු වර්ණවශයෙන් ශ්වෙතවර්ණයෙන්ද සණ්ඨාන වශයෙන් පිළිපොතුවලට බඳු සටහනින්ද යුක්තයහ. පිහිටි ස්ථාන වශයෙන් අතේ සහ පයේ ඇඟිලිඅග පිහිටා තිබෙත්. පරිච්ඡේද වශයෙන් පිටපැත්ත ආකාශයෙන්ද ඇතුළත නහර දලබුසිව්වලින්ද පිරිසිඳ පිහිටාතිබෙත්.

මෙසේ මේ නියපොතුනම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍යන්ත පරිච්ඡෙදයෙන්ද අවශෙෂ කොට්ඨාසයන් කෙරෙන් වෙන්වූ තදගතියෙන් යුත් එක්තරා ආධ්‍යාත්මික පෘථිවිධාතු මාත්‍රයකි.

### 4. දන්තා, (දත්.)



(එක්මුල් දෙමුල් තුන්මුල් දත් සටහන්.)

මේ දත් වර්ණ වශයෙන් ශ්වෙත වර්ණයෙන් යුක්තයි. සණ්ඨාන වශයෙන් විනිශ්චය මෙසේයි. ඉදිරියෙන් පිහිටි දත් සතර සහ ඊළඟ දළ (දත්) දෙකත් එක් මුලින් යුක්තයි. ඒ දළ දෙකට අනතුරුව පිහිටි අකුදත් දෙක මුල්දෙකකින්ද ඊළඟ පිහිටි මහඅකුදත් තුන මුල් තුනකින්ද යුක්තයි. සමහරුන්ගේ අකුදත් දෙමුල්ව බෙදී එකට බැඳීතිබෙත්. මේ සියලුම දත් පිටින් පෙණෙනතරම් කොටසක් විදුරුමසතුලට වදිමින් ක්‍රමයෙන් සිහින්වී ගොස් මුලහුල්වී තිබෙත්. සණ්ඨාන වශයෙන් මේ සියල්ලම මැටිකෝව ගැටියක අර්ධචන්ද්‍රාකාරයෙන් සිදුවනලද ලබුඇට පෙළකටබඳු සටහනින් යුක්තවෙත්. ඒ ඒ දත් සටහන් වනාහි වෙන වෙනම පිහිටි දත් ගැන කල්පනාකිරීමෙන් දත යුතුවෙත්. පිහිටි ස්ථාන වශයෙන් මුඛය තුළ දෙඇන්දේ පිහිටා තිබෙත්. පර්‍යන්ත පරිච්ඡෙද වශයෙන් වනාහි කොංපුවෙන් ඇදී තිබෙන කොටස් මුඛවාරගත ආකාශයෙන්ද නොඇදී තිබෙන කොටස් දෙඅංසයේ විදුරුමස්වලින්ද මුඛයේ උඩු යටි ඇටතට්ටුවලින්ද පිරිසිඳ පිහිටා තිබෙත්.

මෙසේ මේ දත්නම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍යන්ත පරිච්ඡෙදයෙන්ද අවශෙෂ කොට්ඨාසයන් කෙරෙන් වෙන්වූ තදගතියෙන් යුත් එක්තරා ආධ්‍යාත්මික පෘථිවි ධාතු මාත්‍රයකි.

### 5. තචො, (සම.)

මේ වනාහි සිවිය සමය කියා දෙකකට බෙදීතිබේ. මුළු ශරීරයෙහි සිවියගලවා එකතුකළහොත් ලොකු තිබ්බටුගෙඩියක් පමණවේ. මනුෂ්‍යයෝ මේ සිවියට කුණුහමයයි ව්‍යවහාරකරති, ඉන්යට පිහිටි සම තුනී එළුසමක් පමණ ඝනාය

වර්ණ වශයෙන් සිවියේ වර්ණය ඒ ඒ අයගේ ශරීරවර්ණය දැකීමෙන්ම දතහැකිය. සම වනාහි ශ්වේතවර්ණයෙන් යුක්තයි. කටුඅතු ආදියෙන් සිරීමෙන් හෝ ගින්නෙන් දැවීමෙන් පිට සිවිය ගැලවීගියවිට ඒ ශ්වේතවර්ණය ඇසටද පෙනේ. මේ සිවි සම් දෙකම එකක්කොට ගෙන භාග්‍යවතුන්වහන්සේ “තචො” යන නමින්ම වදාළබැව් සැලකියයුතු.

මේ සිවි සම්දෙකේම සටහන් වනාහි ස්වකීය සමින්ම වටලාගෙන තිබෙන ශරීරබිම්බය ගැන කල්පනාකිරීමෙන් හෝ අත් පා ආදි අවයව පිහිටුවා සකල ශරීරය වැසෙනසේ මසන ලද ඇඳුමකට උපමාකොට බැලීමෙන් හෝ දතහැකියි.

ස්ථාන වශයෙන් මුළුශරීරය වසා සිටි දළඹු සිවියට පිටින්ද පරිච්ඡේද වශයෙන් ඇතුළු දළඹු සිවියෙන් හා පිට ආකාශයෙන්ද පිරිසිඳි පිහිටා තිබේ.

මෙසේ මේ සමනම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍ය්‍යන්ත පරිච්ඡේදයෙන්ද අවශේෂ කොට්ඨාසයන් කෙරෙන් වෙන්වූ තදගතියෙන් යුත් එක්තරා ආධ්‍යාත්මික පෘථිවිධාතු මාත්‍රයකි.

### 6 මංසං, (මස්.)

මේ මාංසය වනාහි වර්ණ වශයෙන් කැලමලක් හෝ බිඹු පලක් (කෝවක්කාගෙඩියක්)සේ ඝන රක්තවර්ණයෙන් යුක්තයි. සණ්ඨාන වශයෙන් මේ මස් සමහරතැනක දික්හැඩහුරුකමින්ද) සමහරතැනක ස්ථූලවූ පිඩු ආකාරයෙන්ද සමහර තැනක පැතලි ආකාරයෙන්ද සමහරතැනක ගොලාකාරයෙන්ද පිහිටා තිබේ.

පිහිටි ස්ථාන ඇසින් බලාද අතගාද දතහැකි. නුවණින්ද සලකා බැලියයුතු. ඉලඇට පඞ්ක්තියට සහ කොඳුඇට පඞ්ක්තියටත් ඇතුලතින් පිටින් පිහිටි මාංසපටල පැතලි ආකාරයෙන් ඉතා තුනීයට පිහිටා තිබෙත්.

පරිච්ඡේද වශයෙන් සියලු මාංසයම පිටපැත්ත දළඹු සිවියෙන්ද ඇතුල්පැත්ත ඇට නහර දළඹු සිවි යන තුන්වගීයෙන්ද පිරිසිඳි පිහිටා තිබේ.

මෙසේ මේ මාංසයනම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍ය්‍යන්ත පරිච්ඡේදයෙන්ද අවශේෂ කොට්ඨාසයන් කෙරෙන් වෙන්වූ තදගතියෙන් යුත් එක්තරා ආධ්‍යාත්මික පෘථිවි ධාතු මාත්‍රයකි.

## 7. නහාරූ, (නහර.)



(නහර සටහන් දක්වන ඡායා රූපය.)

මේ වනාංහි පිහිටි ස්ථාන වශයෙන් හිස් මුදුන පටන් දෙඅත දෙපය කෙළවර දක්වාං සකල ශරීරයෙහිම පැතිර පිහිටි පාංවිවිධාංතු කොංඩාංසයකි. පාංත්‍රයක් වසාං සිටි දූල් පසුම්බියක් සේ හිස් කබල වසාං සිටි ක්‍ෂුද්‍රානුක්‍ෂුද්‍ර නහර ජාලංව ගළවාං වයව බැස මහනහර විස්සකට බෙදී සිරුරේ ඉදිරිපසින් හාං පිටිපසින්ද දෙඅංසයෙන්ද එයින් පහ පහ බැස ගොස් තුනාවියේදී එකට බැඳී ගෙතීමෙන් සමහරක් එහිම කෙළවරවීතිබෙත්. සමහරක් එහිදී නැවතද නහර විස්සකට බෙදී දෙපයේ ඉදිරිපසින් හාං පිටිපසින් එයින් පහ පහ බැගින් පතුල් අග දක්වාං බැස ගොස් තිබෙත්. දෙඅංසයෙන් බැස්සාවූ මහ නහරවලින් බාංහුව මූලදී අතු නහර දසය බැගින් බෙදී වෙන්වී එයින් පහ පහ බැගින් ඉදිරිපසින් පිටිපසින් දෙඅත්අග දක්වාං බැස ගොස් තිබෙත්.

මෙසේ දෙපයේ විස්සක්ද දෙඅතේ විස්සක්ද මැද කයේ විස්සක්ද යන සම සැටක්වූ මහනහරින් මේ ශරීරකූඩුව බිඳ නොවැටෙන පිණිස බඳිනලද්දේය.

මේ නහරවලට කණ්ඩරනහරයයි ව්‍යවහාරකරනබව සැලකියයුතු.

එහෙයින් සමන්තපාසාදික භාවයෙන් අග්‍රස්ථානාන්තරලාභී ආයුෂ්මත් උපසේන මහරහතන්වහන්සේ විසින් "සට්ඨිකණ්ඩර සම්බන්ධො"යි වදාරනලදී.

එහි අර්ථ, අයං කායො, (දෙතිස් කුණපයකින් පරිපූර්ණවූ) මේ කය; සට්ඨිකණ්ඩර සම්බන්ධො, සමසැටක් කණ්ඩරනම් මහනහරින් මොනවට බඳිනලද්දේය.

තවද මේ ශරීරයෙහි ආහාර ශුක්‍ර ලේ කිරි ආදී ද්‍රවරස ධාතූන් විසුරුවා හරිමින් සිරුර පොෂ්‍යකරවන්නාවූ නහර වර්ගයක්ද ඒ ඒ කායාංග වාචාංගයන් කර්මණ්‍යභාවයට පමුණුවා ප්‍රාණවත්කරවන්නාවූ නහරවර්ගයක්ද ඇත්තේය. ඒවනාහි කුහර සහිත නහර වර්ගයකි. කියනලද ද්‍රවරසධාතූන් ඇදගැනීමට හා පිඹහැරීමට ප්‍රමාණවූ වාතයකින්ද යුක්තවූයෙන් ඒ නහර වර්ගය ධමනීනහරයයි ව්‍යවහාරකරනුලැබේ. එහෙයින්ම ප්‍රතිසම්භිදා ප්‍රාප්ත සඞ්ඝදාසනම් ක්ෂීණාශ්‍රවයන්වහන්සේ විසින් "ධමනිං ජෙත්තු මත්තනො"යි වදාරනලදී.

එහි අර්ථ-අත්තනො, තමාගේ; ධමනිං, (ලේ වාත ගමන් කරන ශිරා) ධමනී නහරය; ජෙත්තුං, සිඳිනු පිණිස; ඛුරෙං, ක්ෂුරය; (දැලිපිහිය) පරිනිතො, අභිමුඛව පමුණුවනලද්දේය; ඉතුරු නහර කුහර රහිත නූල් නහරබව සැලකියයුතු. එහෙයින් ඒ සඳහා ආයුෂ්මත් උපසේන මහරහතන්වහන්සේ විසින්ම "නහාරු සුත්තනිබන්ධනො"යි වදාරනලදී.

එහි අර්ථ-පූතිකායො, කුණුශරීරය;. නහාරු සුත්තනිබන්ධනො, සූත්‍රනහරයෙන් නොහොත් නහර නමැති නූලින් නිරවශෙෂයෙන් වෙළා බඳිනලද්දකි.

මෙසේ කණ්ඩරනහරය ධමනීනහරය සූත්‍රනහරයයි කියා නහර තුන්වර්ගයකි. ඒ තුන්වර්ගයම වර්ණ වශයෙන් ශ්වෙත වර්ණයෙන් යුක්තයි. සංස්ථාන වශයෙන් ක්ෂුද්‍රාතික්ෂුද්‍ර වේවැල් රූසකාවබඳු සටහනින් යුක්තයි. පරිච්ඡෙද වශයෙන් ඒ ඒ නහර අන්තයෙන්ම පිරිසිඳි පිහිටාතිබෙත්.

මෙසේ මේ නහරනම් වර්‍ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පරිච්ඡින්නපරිච්ඡේදයෙන්ද අවශෙෂ ශරීරකොටස් කෙරෙන් වෙන්වූ තදගතියෙන් යුත් එක්තරා ආධ්‍යාත්මික පෘථිවි ධාතු මාත්‍රයකි.

## 8. අඨි, (ඇට.)



(ඇට පිහිටි ආකාර දක්වන ඡායාරූපය)

මේ වනාගී ගෙරින්ගේ ඇට හා සමානව සුදුපැහැයෙන් යුත් කොටසකි. පිහිටි සටහන කොළඹ මහා ආරෝග්‍ය ශාලාව ආදී තන්හි තිබෙන ඇටසැකිලි හා සර්ව ප්‍රකාරයෙන්ම සමානයි.

ඇස්බැම කෙළින් උකුණුවල දක්වා උඩ හිස්කබලේ මොළ ගලවා දමූව හොත් එය ලබු කැටයකට සමාන වේ. ඝනකමිනුත් ලබුකැටයක් පමණම ඇතිබව සැලකියයුතු. දෙඅංසයේ නලල්කෙළවරආවාටවල අක්ෂිමාංසය දක්වා පිරී සිටි මාංසය කොපූල්(හොඬු)වලින් පහලටද බැස ගොස්තිබේ. ඒ කපෝල මාංස ගලවා දමූවහොත් හොඬුඇට කබලූ ආකාරයෙන් පෙනී යනවා ඇත. අක්ෂිමාංස ගලවා දමූවහොත් අක්ෂිආවාට දෙක මදගලවාගත් තල් කුරුම්බා ඇගි දෙකක් හා සමානව පෙනී යනවා ඇත. ඒ අක්ෂිආවාටද ක්‍රමයෙන් සිහින්වෙමින් ගොස් ඇතුළතදී මොළ ගුහාවට සම්බන්ධවී තිබෙත්. නාසිකා සිදුරු දෙක අඟලක් පමණ ගියතැන පටන්

තරමක පුළුල් පැතලි ආකාරයෙන් දෑඟුලක් පමණ උඩට නැග නැවත පහලට හැරී රහඳිවට ඇතුළතින් ගොස් ශ්‍රවා කුහරයට සම්බන්ධවී තිබේ. නමුත් ඒ සිදුරුවල උඩ මොල ගුහාවට සම්බන්ධවීයාමක් නොමැතියි. මොල පිණ්ඩයට යටින් අතිශයින් සියුම්වූ ඡිද්‍ර සහිත ඉතාතුනී පොතු ඇට තට්ටුවක් පිහිටාතිබේ. මොලදියවී කුණුවීමෙන් සෑදෙන සොටු ඒ ඇටතට්ටුවේ සිදුරුවලින් නාසිකාවාටයට බැසගනී. කන් සිදුරුදෙක මොලගුහාවට යටින් ගොස් නැවත පහලට හැරී රසඳිවට පැත්තකින් ශ්‍රවානාලය හා සම්බන්ධවී තිබේ. යටිතල්ල පිහිටි ඇටය කනමුලට මෙපිටදී කොටසක් බෙදී වෙන්වී කනට ඉදිරියෙන් උඩුඅතට හැරීයාමෙන්ද අනිත් කොටස හක්කේ කෙළවරදී උඩුපැත්තට තරකැවීයාමෙන්ද මුහුණු ඇටය හා සම්බන්ධව නහරයෙන් බැඳී ගෙනී තිබේ.

මේ යටිතල්ල පිහිටි ඇටයටත් මුහුණුඇටයයි කියනලද උඩුතලු ඇටයටත් අතර පිහිටි මුවසිදුර කිසිවක් නැති හිස් ස්ථානයකි.

මෙසේ කියනලද නයින් හිස්ඇටයේ විස්තර අවබෝධකට යුතු. මේ මුළු හිස්ඇටයම සන්ධිස්ථානවලින් ගලවා වෙන්කර තහොත් හිස්කබල් ඇටසතරය. කම්මුල්ඇට දෙකය. යටිදත්ඇත්ද පිහිටි තලුඇට එකය. කියා සත්කඩක්කොට වෙන්කළහැක්කේය. එහෙයින් ඒ ඒ පාළිප්‍රදේශයන්හි **"සතකඩා මෙ එලෙ මුඛා,–මුඛාඑලතු සතකඩා"** යනුවෙන් අභිශාප පූර්වක ව්‍යවහාරය පැවතඑනබව පෙනේ.

සටහන් වශයෙන් හිස්කබල් ඇටසතර තුනට හතරට පැළුණු පොල්කැටයක් හා සමානයි. දෙඅංසයේ කම්මුල් ඇට දෙක ඇස්ස වසා සිටි තල්ගෙඩියක මුදුන්වැස්මේ පොතුවලට බඳු සටහනින් යුක්තයි. උඩුහකු ඇටයයි කියාද හොඬු ඇටයයි කියාද ව්‍යවහාරවන මුහුණු ඇටය සහ යටිතලු ඇටයත් අතගා බැලූවිටද නුවණින් විමසා බැලූවිටද දතහැකිවේ. බෙල්ලේ පිටි ඇට සත අගලට පමණ කපා බැද එකිනෙක පිළිවෙළින් අමුනා තබනලද ආදමස්කෑලි පෙළකට බඳු සටහනින් යුක්තයි. බෝටුවේ ඉදිරිපසින් පිහිටි මාදුඇට සටහනවනාහි අතගා බැලූවිට දතහැකිවේ. පහත නඟුටු ඇටේ පටන් බෙලිඇට පඩකතිය දක්වා පිහිටා තිබෙන කොඳුඇට පුරුක්සතලොස එකිනෙක වියටක් පමණ දුරින් ඉරටයක අමුනා කෙලින් තබනලද හිස්වූ නූල්රෝද පෙළකට බඳු සටහනින් යුක්තයි. මහතින් කකුලේ මාපටගිලි පමණ මහතයි. මෙසේ

කියනලද නයානුසාරයෙන් ඉලඇට පපුඇට ආදි සෙසු ඇට සටහන්ද වෙන් වෙන් වශයෙන් ගෙන නුවණින් මෙනෙහිකට යුතු. පිහිටි ස්ථාන වශයෙන් කියනලද ඇට සියල්ලම සුප්‍රකටයි. පරිච්ඡේද වශයෙන් වනාහි මිදුලු සහිත ඇට ඇතුළත මිදුලුවලින්ද පිටත මාංසනහර දෙවර්ගයෙන්ද සමහරතැනක ඇටවලින්ද පිරිසිඳ පිහිටා තිබෙනබව සැලකියයුතු.—

මෙසේ මේ ඇටනම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍යන්ත පරිච්ඡේදයෙන්ද අවශෙෂ කොට්ඨාසයන් කෙරෙන් වෙන්වූ තදගතියෙන් යුත්එක්තරා ආධ්‍යාත්මික පෘථිවීධාතු මාත්‍රයකි.

## 9 අට්ඨිමිඤ්ජං. (ඇටමිදුලු)

කිරල බඩඉරිඟු ආදි ගස් මදවලටබදු ඇටතුළ පිහිටි මදවර්ගය ඇටමිදුලු නමි. වර්ණ වශයෙන් සමහරක් සුදුපැහැයෙන්ද සමහරක් රතුපැහැයෙන්ද යුක්තයි. සණ්ඨාන වශයෙන් දිග ඇටයකනම් දික් ආකාරයෙන්ද ලුහුඬු ඇටයකනම් ලුහුඬු ආකාරයෙන්ද ස්ථූල ඇටයකනම් ස්ථූල ආකාරයෙන්ද වටවූ ඇටයකනම් වටවූ ආකාරයෙන්ද පැතලි ඇටයකනම් පැතලි ආකාරයෙන්දැයි මෙසේ ඒ ඒ ඇට සටහන් ආකාරයෙන්ම ඇටමිදුළුද පිහිටාතිබෙනබව සැළකියයුතු.

පිහිටි ස්ථාන වශයෙන් තුනීඇට සහ ඔළුඇටත් හැර සෙසු කොයි ඇටතුළත් මිදුලු පිරීතිබෙන බව සැලකියයුතු. අන්තිම නගුටු ඇටේ පටන් හිස් මොල දක්වා වැටීතිබෙන කොඳුඇට පඞ්ක්තිය සෑදුව පිහිටීමෙන් එහිතුළ පිරිසිටි මිදුළු වැටිය මොලයහා එකාබද්ධවී තිබේ. පරිච්ඡේද වශයෙන් ඒ කොඳු ඇටමිදුලු වැටිය උපරිම අන්තය මොලයෙන් පිරිසිඳිනලදී. එහි ශෙෂාන්ත සහ සෙසු ඇටමිදුළුද ඒ ඒ ඇටවල පර්‍යන්තයෙන්ම පිරිසිඳ පිහිටාතිබෙත්.—

මෙසේ මේ ඇටමිදුලුනම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍යන්ත පරිච්ඡේදයෙන්ද අවශෙෂ කොට්ඨාසයන් කෙරෙන් වෙන්වූ තදගතියෙන් යුත් එක්තරා ආධ්‍යාත්මික පෘථිවීධාතු මාත්‍රයකි.

(10) වකුගඩුව, (11) හෘදයමාංසය, (12) අක්මාව, (13) දළබුව, (14) ඇලදිව, (15) පපුගඩුව, (16) අතුණු, (17) අතුණුබහන්, (18) නොපැසුණු ආහාර, (19) පැසුණු ආහාර, (20) මොල, යන ඇතුල් කොටස් එකොළොස පහසුවෙන් තේරුම්ගැනීම පිණිස සුදුසු පිළිවෙළකින් උදුර උදුරා විස්තර කරනුලැබේ.

මේ ශරීර කුඩුවනම් කියනලද ඇට රැසින් හංවනලදුව නහරින් බඳිනලදුව සමහර තැනක තුනීවූද සමහර තැනක ඝනවූද සමහර තැනක මට සිලුටුවූද පූණුමැටි බදාමකට බඳු මාංසයෙන් ලේපනය කරනලදුව ඊට පිටින් දළඹු සිවියෙන්ද ඊට පිටින්සමින්ද ඊටත් පිටින් කුණුහමයයි කියනලද සිවියෙන්ද වැසී පෘථිවිධාතු රැසකින් සෑදී තිබෙන ධාතු කුඩුවකි —

දැන් මේ ශරීර කුඩුව උඩුකුරුව හොවා ඒ ඒ කොංඨාසවල විස්තරය කියනු ලැබේ.

යට කොංදුඇට පඞ්ක්තියේ පටන් මතු පපුඇට පඞ්ක්තිය දක්වා මේ අතර උදර කුහරය පසඟුලක් පමණ පළලය ඒතාක්දුර කොංදු ඇට පඞ්ක්තිය උදර කුහරය තුළට නෙරවී අවුත් තිබේ.

## 15. පපඵාසං (පපුගඩුව.*)



පපුගඩුවේ ඡායා රූපය.

මෙය පිහිටි අන්දම මතු අක්මා මාංස විස්තර යෙහි දක්වනු ලබන ඡායාරූපය සම්බන්ධ හෘදය ගණියෙහි 'ප' 'ප' යන අකුරු දෙක දරණ කොටස් බලා තේරුම් ගතයුතු.

මේ වනාහි තන පිහිටි තැනට සතරඟුලකින් පමණ උඩදී පටන් ගෙන අංසයකට එක බැගින් දෙ අංසයේ පිහිටි මස්ගඩු දෙකකි.

හෙද කොංදු ඇට පඞ්ක්තියේ සැපී ඉල ඇට කෙළවර දක්වා බැස ගොස් වම් අංසයේ පපුගඩුව අගදී දෙකටත් දකුණු අංසයේ පපුගඩුව තුනටත් බෙදී තිබේ. ඒ බෙදුණු කොටස් ගෙන වම් අංසයේ පපුගඩු දෙකය දකුණු අංසයේ පපුගඩු තුනයයි මෙසේ පපුගඩු පඤ්චකායක්කොට ගෙනද ව්‍යවහාරකළහැක්කේය.

* මීටම පෙනහල්ල කියාද පෙන පපුව කියාද ව්‍යවහාරකරති.

ඒ පපුගඩුව වර්ණවශයෙන් ඉතා නොඉදුණු දුඹුස් දිඹුල් ගෙඩියකට බඳු වර්ණයෙන් යුක්තයි. සටහන් වශයෙන් විස මව දික් හැඩේට කපාගන්නාලද මාංසපටලයකට බඳු සටහනින් යුක්තයි. තවද මේ පපුගඩු මාංසය දියකැවුමක්සේ නොමට නොසිලිටු මාංසයක්දවේ.

පරිච්ඡේද වශයෙන් පපුගඩුවේම සතර අන්තයෙන් පිරිසිඳ පිහිටා තිබේ.

**පාචකාග්නියයි** කියනලද ආහාර පැසවන ගින්න ආමාශයයි කියනලද ආහාර බොක්කේ බහුලකොට පවති. ඒ පාචකාග්නි වේගයෙන් ආමාශය නැවත නැවත වියලෙන සුළුවේ.

එසේ වියලීමක් පාසා ආමාශය තෙම්මට තරම් පොහොනා ආපෝරස හා ආහාර රස උරා තබා ගැනීමේ පොහොසත්කමක් මේ පපුගඩුවට ඇත්තේය.

එහෙයින් පපුගඩුව මූදුපෙණ පිඩක්සේ විරළවූද වැටකොළු ගෙඩියක ඇතුළතට බඳු අභ්‍යන්තරයෙන්ද යුක්තවූ මෘදු මාංසයකැයි සැලකියයුතු.

යටකීසේ උරාගන්නාලද ආපෝරසයෙන් හා ආහාර රසයෙන් ආමාශය තෙමන්ට යාමෙන් පපුගඩුවද නැවත නැවත වියලෙන සුළුවේ. පපුගඩුව වියලීමෙන් සත්වයන්ට පැන් පිපාසය හටගනී. පැන් පානයෙන් ඒ පිපාසය සංසිඳවා නොගතහොත් මරණයද පැමිණියහැකි බව සැලකියයුතු.

තවද මේ පපුගඩුව ක්ෂුද්‍ර ධමනි නහරවල උපකාරයෙන් සිරුර මැද පිහිටි මහා ධමනි නහරයෙන් උරාගන්නාලද ලෙයින්ද නැවත නැවත තෙමාගනු ලැබේ.

එසේ උරාගැනීමෙන් ඒ මහා ධමනි නහරයේ ලේ මඳවූ විටද සත්වයන්ට මරණය පැමිණිය හැක්කේය.

නානාවිධ ආපෝ රසයන්ට හා නානාවිධ ආහාර රසයන්ට ආධාර ස්ථානවූ හෙයින්ම මේ පපුගඩු මාංසය අන්‍ය මාංස පමණ රසවත් මාංසයක්ද නොවේ.

මෙසේ මේ පපුගඩු මාංසයනම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍යන්ත පරිච්ඡේදයෙන්ද අවශේෂ කොට්ඨාසයන් කෙරෙන් වෙන්වූ තද ගතියෙන්යුත් එක්තරා ආධ්‍යාත්මික පෘථිවි ධාතු මාත්‍රයකි.

## 16. අන්තං (අතුණු), 17. අන්තගුණං (අතුණු බහන්.)



අමාශය සමග අතුණුබහන්යයි කියනලද බඩ වැල් දරණය.

මෙය පිහිටි අන්දම මතු අක්මා මාංස විස්තරණයෙහි දක්වනු ලබන ජායාරූපය සම්බන්ධ කුක්ෂි ගර්භයෙහි ‘ප’ ‘බ’ යන අකුරුදෙක දරණ කොටස්බලා තේරුම්ගත යුතු එයින් ‘ප’ යන්නෙන් පක්වාශයත් ‘බ’ යන්නෙන් අතුණු බහන්යයි කියන ලද සිහින් බඩවැල් දරණයත් දක්වයි.

මේ ‘අන්තං අන්තගුණං’ යන වචන දෙකින්ම ප්‍රකාශ කරනලද්දේ ගලවාටයෙහි පටන් ගුද මාර්ගය දක්වා පිහිටි බඩවැලයි. එයින් බඩ වැලේ දරණ නොගැසුණු කොටස අතුණු නම්වේ.

දරණ ගැසුණු කොටස සිවි පටලයකින් බැඳී පවත්නා හෙයින් අතුණු බහන් නම්වේ.

මෙහි සිවි පටලනම් ගව මස් ආදි මස් වර්ග කපා වෙන් කිරීමේදී දකින්ට ලැබෙන සොටු හා සමානව ඇදී ඇදී එන ද්‍රව්‍ය කොටසයි.

මින්මතු සිවිපටලයයි ව්‍යවහාරවන තැන්හිදු මේ නයින්ම අරුත් අදහස් තෙරුම්ගත යුතුයි.

මෙසේ කියනලද බඩවැල ගලවාටයෙන් පටන්ගෙන හෘදය ගර්භයේදී පපුගඩු දෙකට අතරෙන් කොංදු ඇට පඞ්ක්තිය අනුව තන පිහිටි ප්‍රමාණයේ සිට තරමක් පහලට බැස ගිය තැන් පටන් ආමාශයයි කියනලද ආහාර බොක්ක සෑදෙමින් ගොස් තිබේ. මේ ආමාශයට මදක් උඩදී තරමක කුඩා කුහරයක් සෑදී තිබේ. ඒ වනාහි නැළියක් පමණ සෙමට ආධාර ස්ථානවූ හෙයින් ශ්ලේෂ්ම කොෂයයි ව්‍යවහාර කරනු ලැබේ.

ආමාශයයි කියනලද ආහාර බොක්ක නාභියෙ සිට තුනඟලක් පමණ උඩදී කෙළවරවී තිබේ. ඒ ආමාශය කෙළවරවූ තැන සිට නැම්ලි එක්විස්ස (21) ක් පමණ වනතුරු උදර ගර්භයෙහි දකුණු අංසයේ අන්තිම දක්වාත් වම්අංසයේ අන්තිම

දක්වාත් බඩවැල දරණ වැටි වැටී ගොස් කෙළවරදී අතුණු වැටිය පැදකුණුකොට පහතට බැස ඉබි ඔළුවක්සේ ගුදමාර්ගය සෑදීමෙන් අවසානවී තිබේ.

ඒ ගුදමාර්ගයට සතරරියනක් පමණ උඩසිට බඩවැල අතේ වැලමිටි සන්ධියෙන් උඩ බාහුව පමණ මහතය. මේ වනාහි පක්වාශයයි කියනු ලැබේ. එයිනුත් උඩ බඩවැල් දරණය කකුලේ මාපටගිලි පමණ මහතය. ආමාශයට පැමිණි ආහාර පැසීගියවිට එතනින් පිටවී බඩවැල් දරණයදිගේ ක්‍රම ක්‍රමයෙන් දිර දිරාගොස් පක්වාශයට බැස වැඩියත් දිරා පරම දුර්ගන්ධ ජේගුප්ෂිත භාවයට අතිශයින් පිළිකුල් බවට පත්ව ගුදමාර්ගයෙන් පිටවීයනබව දතයුතු.

පක්වාශයෙහි දිරූ ආහාර පිරීගියවිට සත්වයන්ට මලබරවෙයි. එවිට ඒ මල පහනොකර ඉවසාහුන්නාහොත් නොයෙක් රෝග හටගන්වද පිළිවන.

යම්කිසි හෙතුවකින් මල පහනොවී නැවතුනාහොත් මරණයද පැමිණිය හැක්කේය.

අතුණුය අතුණුබහන්යයි දෙකොටසක්කොට ව්‍යවහාර කරනලද මේ බඩවැල වර්ණ වශයෙන් සුණුවැලි බදාමකට බඳු සුදුමැලි පැහැයෙන් යුක්තයි.

ආමාශයාගේ පිට පැත්ත මට සිලුටුය. ඇතුලත කොස්කටු වක්සේ කණ්ටකාකාර සටහනින් යුක්තයි. ඒ ආමාශයෙන් උඩ කොටස සමඟසා එල්වනලද නයි ශරීරයක් හා සමානයි.



අමාශයේ සටහන.

මෙය පිහිටි අන්දම මතු අක්මා මාංස විස්තරයෙහි දක්වනු ලබන ජායාරූපය සම්බන්ධ කුක්ෂි ගර්භයෙහි 'අ' යන අකුර දරණ කොටස බලා තේරුම්ගතයුතු.

ආමාශය වනාහි දෙකොණින් ගෙන මිරිකනලද ජලසාටිකාවක (දියරෙද්දක) හටත්ගත් සුළං කෝෂයක් හා සමානයි. ඉන් පහල බඩවැල් දරණය ලේඹරුවක සම ගලවා බහාලනලද නයි දරණයක් හා සමානයි.

පරිච්ඡෙද වශයෙන් බඩවැලේම සතර අන්තයෙන් පිරිසිඳී පිහිටා තිබේ.

ගලවාටයෙහි පටන් ගුද මාර්ගය දක්වා ස්ත්‍රීන්ගේ බඩවැල ස්ත්‍රීන්ගේ රියනෙන් සතළොස් (17) රියනක් පමණද පුරුෂයන්ගේ බඩවැල පුරුෂයන්ගේ රියනෙන් විසි * (20) රියනක් පමණද දිගයයි සැලකියයුතු.

මෙසේ කියනලද බඩවැලේ ආමාශය සමග උඩ කොටස කිසි බැඳීමක් නොමැති හෙයින් සාමාන්‍යයෙන් අතුණුයයි ව්‍යවහාරකරනු ලැබේ. ඉන් පහල බඩවැල් දරණ කොටස වට්ටුවෙන් වට්ටුව සිවියකින් බැඳී තිබෙන බැවින් අතුණු බහන්යයි ව්‍යවහාරකරනු ලැබේ.

එහෙයින් අන්තගුණං යන්නෙහි ගුණ ශබ්දය කාමගුණං යන්නෙහි ගුණ ශබ්දයමෙන් බන්ධනාර්ථ වාචකයයි සැලකිය යුතු.†

අන්තංගුණන්ති බන්ධන්ති අන්තගුණං, යං, යම් අතුණු වැටියක්; අන්තං, ඒ ඒ අතුණු වැටියක්; ගුණන්ති බන්ධති, සිවියෙන් බැඳගනීද; ඉති, එහෙයින්; තං, ඒ එක එක අතුණු වැටියක්; අන්තගුණං, අතුණුබහන නම් වේ.

* පුරුෂයන්ගේ බඩවැල තමන්ගේ අතින් තිස්දෙරියන (32) ක් යයිද ස්ත්‍රීන්ගේ බඩවැල ස්ත්‍රීන්ගේ අතින් විසිඅට(28)රියනක්යයිද පුරාණ අර්ථකථාවල කියනලදී. ඒ එකලට සිටි ධන්‍ය පුණ්‍ය ලක්ෂණ සම්පන්න ස්ත්‍රී පුරුෂයන්ගේ වශයෙන්ගෙන උත්කෘෂ්ඨ න්‍යායෙන් කියනලද්දකැයි සැලකියයුතු.

“උත්තාඃ සාර්ධාස්තු යො ව්‍යාමාඃ, පුංසා මන්ත්‍රාණි සූරභිඃ
අර්ධව්‍යාමෙන හීනානි-ස්ත්‍රීණා මන්ත්‍රාණි නිර්දිශෙත්”

යුනුවෙන් වෛද්‍යක මතයෙන් පුරුෂයන්ගේ බඩවැල බඹතුනහමාරක් යයිද ස්ත්‍රීන්ගේ බඩවැල බඹතුනක්යයිද කියනලදී. මනුෂ්‍ය ශරීරයෙහි බඩවැල් ආදී සියලු අවයව මැරුණයින් පසු කොටවීයාම ස්වභාවයකි. මෙකල දොස්තර්වරු එබඳු මෘත ශරීර කපා බඩවැල් මැනබලා සමහරක් විසිඑක් (21) රියන් තෙලෙස (13) ඟුල් පමණ දිගයයිද සමහරක් අටළොස් (18) රියන් දහසය (16) ඟුල් පමණ දිගයයිද කියති. බඩවැල සම්බන්ධව කියනලද මේ කොයි කොයි දිග ප්‍රමාණත් ජනක කර්මයන්ගේ සහ සෘතු ආහාරයන්ගේ ශක්තියේ හැටි හැටියට ඒ ඒ කාලවල ඇතිවූ මනුෂ්‍යයන්ගේ වශයෙන් කියා තිබෙන බව පෙනේ. ඒ එසේමය බීජශක්ති ප්‍රමාණයේ සැටියට පැලවීමෙන් පෘථිවි ආපොරස ආශ්‍රයෙන් වැඩිදියුණුවන වෘක්ෂලතාවන්ට බඳුව ජනකකර්ම ශක්තිප්‍රමාණයේ සැටියට හටගෙන සෘතු ආහාර ආශ්‍රයෙන් පොෂ්‍යවන බඩවැල් ආදී රූප පිණ්ඩයන්ගේ සියලු කල්හි සියලු සත්වයන්ට සමප්‍රමාණයෙන්ම ඇතිවීමක් කොයින්ද?

† බඩවැල බැඳී සිටි සිවිපටලයට අතුණුබහන්යයි ව්‍යවහාරකරන බව අටුවාවෙන් පෙණෙන නමුත් ශාරිපුත්‍ර අපදාන පාළ්‍යාගත නයින් මෙහි අතුණු බහන් බෙදා දක්වීමු.

අනන්තං, අතුණු; අනන්තගුණං, අතුණුබහන්; මෙසේ අනන්ත අනන්තගුණ ශබ්දයන්ගේ වචනාර්ථ සහ ව්‍යවහාරාර්ථද ඉගෙන අතුණු අතුණුබහන් දෙකොටස පැහැදිලිව තේරුම්ගතයුතු. කුක්ෂිවාතය කුපිතවීමෙන් බඩ පැලුණහොත් තට්ටුවෙන් තට්ටුව බැඳී පවත්නා බඩවැල් දරණියම පිටත නික්මෙන බව දතයුතු.

එහෙයින් ධර්ම සෙනාධිපති ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ විසින් ථෙර ගාථා පාළියෙහි:-

"සචෙපි මෙ අනන්තගුණං නික්ඛමිත්වා බහිචරෙ
නෙව භිදෙඤ්ඤ ආජීවං චජමානොපි ජීවිතං".

අර්ථ:—ආවුසෝ, ඇවත්නි ! මෙ, මාගේ, අනන්තගුණං, අතුණු බහන්; බහි, පිටත; නික්ඛමිත්වා, නික්ම; යදිපිචරෙ, ඉදින් හැසිරෙන්නේවී නමුදු; ජීවිතං,ජීවිතය; චජමානොපි, හරනේවී නමුදු; අහං, මම; ආජීවං, ජීවිකාශුද්ධිය හෙවත් ආජීව පාරිශුද්ධි ශීලය; නෙව භිදෙඤ්ඤ, නොබිඳිමි. යනුවෙන් අනන්ත බන්ධනයවූ බඩවැල් දරණියම පිටත නික්මෙනබව වදාරනලදී.

මෙසේ කියනලද අතුණු සහ අතුණුබහන්නම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍යන්තපරිච්ඡෙදයෙන්ද අවශෙෂ කොට්ඨාසයන් කෙරෙන් වෙන්වූ තද ගතියෙන්යුත් එක්තරා අධ්‍යාත්මික පෘථිවි ධාතු මාත්‍රයකි.

## 14 පිහකං, (බඩදිව.)

මේ වනාහි වම්පසෙහි තනය පිහිටි තැන සිට දෑඟුලක් පමණ පහළදී පවත්ගෙන ඇල කෙළවර දක්වා පමණ ගොස් ඇතුල් ඇලපතට සේත්තුවී පිහිටා තිබේ. පළලින් දෑඟුලක් පමණ පළලය. දිගින් සතඟුලක් පමණ දිගය. වර්ණ වශයෙන් කාලවර්ණයෙන් යුක්තයි. සණ්ඨාන වශයෙන් ගව දිවකට බඳු සටහනින් යුක්තයි. පරිච්ඡෙද වශයෙන් බඩදිවේ පර්‍යන්ත පරිච්ඡෙදයෙන්ම පිරිසිඳ පිහිටා තිබේ. උදර ගර්භයවූ බඩතුළ පිහිටි හෙයින් මීට බඩදිවයයි කියාද එහිදු ඇතුල් වම් ඇලපතට සේත්තුවී පිහිටි හෙයින් ඇලදිවයයි කියාද ව්‍යවහාර කරනු ලැබේ.

යම්කිසි හෙතුවකින් මේ බඩදිව එල්බ වැටුණි නම් ඉදුමුණි නම්නොයෙක් රෝගද එසේම බඩදිවට යම් තැලුමක් හෝ රිදුමක් හෝ වීනම් මරණයද පැමිණිය හැක්කේය.

මේ බඩදිවපිහිටි අන්දම මතු අක්මා මාංස විස්තරයෙහි දක්වනු ලබන ඡායාරූපය සම්බන්ධකුක්ෂි ගර්භයෙහි වම් අංසය කෙළවර 'ඇ' යන අකුර දරණ කොටස බලාතේරුම්ගතයුතු.

මෙසේ මේ ඇලදිවනම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්යන්ත පරිච්ඡේදයෙන්ද අවශේෂ කොඨාසයන් කෙරෙන් වෙන්වූ තදගතියෙන්යුත් එක්තරා අධ්‍යාත්මික පෘථිවි ධාතු මාත්‍රයකි.

## 10 වක්කං, (වකුගඩුව.)

මේ වකුගඩුවේ විස්තර විභාගයට ප්‍රථමයෙන් හෘදය ගර්භ කුක්ෂි ගර්භ වයෙහි ලේස මාත්‍ර විස්තරයක් දක්වනු ලැබේ.

පපුනැට්ටේ අගදී තරම් ඇතුල් ශරීර කුහරයෙහි දළබු සිවියක් හටගෙන තිබේ. ඒ දළබුසිවිය ආමාශයයි කියනලද ආහාර බොක්කට උඩින් ඒ අමාශයෙහි ගෑවෙමින් උඩුවියනක් සේ හාත්පස සතර අන්තය දක්වා ගොස් ඇල දළබුව හා සමගද පිටිකොන්දේ ඇතුල් දළබුව හා සමගද එකටබැඳී තිබේ.

මේ දළබුවෙන් ශරීරයාගේ ඇතුල් කුහරය හෘදය ගර්භය උදර ගර්භයයි ගර්භ දෙකකට බෙදී තිබෙනබව දතයුතු.

දිවේ මුලහරියේදී ධමනි නහරයක් පටන්ගෙන බඩවැලට උඩු පැත්තෙන් හෘදය කුහරයට බැසගොස් එහිදී **දෙකම** බෙදී බඩවැල මැදිකොටගෙන දෙපැත්තෙන් පපුගඩුවයයි කියනලද පෙන පපු දෙකට ඇතුල්වී එහිදී නොයෙක් අතට අතු බෙදීයාමෙන් කෙළවරවී තිබේ.

මේ නහරයේ උපකාරයෙන් සත්වයන්ට ආශ්වාස ප්‍රාශ්වාස පැවැත්විය හැකිවී තිබෙනබව සැලකියයුතු. හෙද ග්‍රීවයෙහි ලාඇටපොතු සහ කුඩා නහර කෙඳිත් එකතුවීමෙන් සැදී තිබේ.

ග්‍රීවය අල්වා බැලූවිට දතහැකිවේ. ඒ නහරය කොසෙල් ගෙඩියක් දෙකට පලාගත් පලුවකට බඳු සටහනින් යුක්තයි. හෘදය ගර්භයට බැසගත්තැන් පටන් ඇටයෙන් තුමූසුව තනි නහරයෙන්ම දැඩිවී ගොස් තිබේ.

ආහාර ගිලිනවිට ඒ ආහාර ගල නාළයට ප්‍රවිෂ්ටනොවී ඊට පිටින් පිහිටි මේ ධමනි නහරවාටයට ප්‍රවිෂ්ට වුණිනම් පෙන පපුවෙන් නගින වායු වේගය දැඩිවී ඉක්කාව කැස්ස ගැස්ම ආදී රෝග පීඩා පැමිණිය හැක්කේය. වැරදී ගියහොත් මරණයද පැමිණිය හැකිබව දතයුතු.

එසේම ආහාර අනුභව කිරීමේදී ග්‍රීවාංදූලෙන් වායුවේගයක් උඩට නැඟී නැඟී ඊම දක්නා ලැබේ. ඒ නැඟීමනම් කියන ලද ධමනී නහරවාටයට ආහාර ඇතුල්විය නොදී ඇහිරීමයි.

ක්ෂුද්‍රාන්ත්‍ර ක්ෂුද්‍ර නහර සහ සිව්පටල බොහෝ රැසක් බෙල්ලෙන් පටන්ගෙන පපුගඩු දෙකට මැදින් පිටකොඳු ඇට පඬකතියට තදවි තදවී අතුණුයයි කියනල්ද බඩවැල සමග බැසගොස් උදර ගර්භයට වැටිතිබේ. ඒ සිව් පටලවල ලක්ෂණ යට කියනලද නයින් දතයුතු.

හිස් කබල වෙළා වසා සිටි ක්ෂුද්‍රාන්ත්‍ර ක්ෂුද්‍ර නහර බොහෝ රාශියක් පහලට බැස දෙකන්මුලදී ලේ නහර දෙකක්වීමෙන් ග්‍රීවානලය අන්තිම දක්වා දෙපැත්තෙන් බැස ගොස් නැවත ඒ දෙක එක නහරයක්වීමෙන් එතැන් පටන් බඩවැලත් ක්ෂුද්‍රාන්ත්‍ර ක්ෂුද්‍ර නහර බොහෝ රාශියකුත් සමග උදර ගර්භයට බැස නාභිය පිහිටි ප්‍රමාණයේදී තරම් නැවතත් නහරදෙකක්ව නොයෙක් අතු නහරවලට බෙදෙමින් දෙපයේ අග දක්වා බැස ගොස් තිබේ.

ග්‍රීවා නලය කෙළවර දක්වා දෙපැත්තෙන් බැසගිය නහර දෙක සන්ධිවූ ස්ථානයෙහිදීද අතුනහර දෙකක් බෙදී වෙන්වී නැවත ක්ෂුද්‍රාන්ත්‍ර ක්ෂුද්‍ර නහරවලට බෙදෙමින් දෙඅත කෙළවර දක්වාද බැස ගොස් තිබේ.

එහෙයින් කියනලද නහරය සිරුර සෑම තැනම ලේ ගෙන යන්නාවූ කුඩා මහත් නහර සියල්ලට මුල්වූ ප්‍රධාන මහා ලේ නහරය බව සැලකියයුතු.

මේ නහරය උදර ගර්භයේදී පයේ මාපටගිල්ල පමණ මහතය. හෘදය ගර්භයේදී මේ මහ නහරයෙන් අතේ මාපටැඟිල්ල පමණ සිදුරු සහිත ධමනී (පසිප්ප) නහර නටු දෙකක් හට ගෙන එහි කෙලවර හෘදය මාංස පිණ්ඩය සෑදී තිබේ.

කුක්ෂි ගර්භයේදී මේ නහරයෙන්ම බෙදී වෙන්වූ නහර නටු වක එක නටුවේ හටගත් අඹගෙඩි දෙකකට බඳු දිගින් සතරඟුලක් පලලින් දෑඟුල්හමාරක් ඝනයෙන් අඟල් එකහමාරක් පමණ ඇති මස්ගඩු දෙකක් යටිබඩේ පිටි අංශයෙහි කොඳු ඇටයට දෙපැත්තෙන් පිහිටා තිබේ. ඒ මස්ගඩු දෙකට වකුගඩුයයි කියනු ලැබේ. පැහැයෙන් එරබදු ඇටයකට බඳු මඳ රත්පැහැයෙන් යුක්තයි. සටහන් වශයෙන් අඹගෙඩියකට යළිත් කජු ඇටයකට බොන්චි ඇටයකට බඳු සටහන් ඇත්තේයයි සැලකියයුතු.

පරිච්ඡෙද වශයෙන් ස්වකීය වකුගඩු පර්යන්තයෙන්ම පිරිසිඳි පිහිටා තිබේ.

මෙසේ මේ වකුගඩුවනම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍යන්ත පරිච්ඡේදයෙන්ද අවශේෂ කොට්ඨාස යන් කෙරෙන් වෙන්වූ තදගතියෙන්යුත් එක්තරා අධ්‍යාත්මික පෘථිවී ධාතු මාත්‍රයකි.

## 11. හදයං (හෘදය මාංසය.)



හෘදයමාංස සටහන.

යට කියනලද පරිද්දෙන් පිහිටියාවූ හෘදය මාංස පිණ්ඩය මකුළුවන්ගේ බීජකෝෂය (බිජු සැව)කට බඳු ඉතා සියුම් සිනිඳු ශ්වේතවර්ණ දළඹු සිවියකින් වැසී අගකොණථන ස්ථානයට පමණ දික්ව වම් පාර්ශ්වයට හැරී පිහිටා තිබේ. මහතින් හස්ත මුෂ්ටියක් (අත් ගුටියක්) පමණ මහතය.

වර්ණ වශයෙන් පියුම් පතක පිට පැත්තේ වර්ණයට බඳු වර්ණ යෙන් යුක්තයි.

සටහන වනාහි නෙළුම් කැකුළක් හා සමානයි.

පරිච්ඡේද වශයෙන් ස්වකීය පර්‍යන්තයෙන්ම පිරිසිඳී පිහිටා තිබේ.

මේ හෘදය මාංසපිණ්ඩය දෙඹගෙඩියක් ඇතුල්කිරීමට තරම් කුහරයක් ඇති මස්කඩුවකි. එහි අඩපතක් පමණ ලේද පිහිටා තිබේ. ඒ ලෙය පැතිරගෙන හෘදයවස්තු * රූප පරම්පරාව පවතිනබවද ඒ හෘදයවස්තු රූප ආශ්‍රයෙන් මනොධාතු මනො විඥානධාතු සඞ්ඛ්‍යාත චිත්ත චෛතසික ධර්මයන් පහළවන බවද “අර්ථකථා” යෙහි කියනලදී.

* මෙම හෘදයවස්තු රූපය ධම්මසඞ්ගණී ප්‍රකරණයෙහි නොවදාරා පට්ඨානප්‍රකරණයෙහි වදාරනලදී.

කවරහෙතුවකින්ද?යත්. “අත්ථි රූපං චක්ඛුවිඤ්ඤාණස්සවත්ථු අත්ථි රූපං චක්ඛුවිඤ්ඤාණස්ස නවත්ථු අත්ථි රූපං චක්ඛුවිඤ්ඤාණස්ස ආරම්මණං–අත්ථි රූපං චක්ඛුවිඤ්ඤාණස්ස නආරම්මණං–පෙ–අත්ථිරූපං කායවිඤ්ඤාණස්ස වත්ථු–අත්ථි රූපං කායවිඤ්ඤාණස්ස

එබැවින් මේ හෘදය මාංස පිණ්ඩය චිත්ත චෛතසික ධර්මයන් ලගින ගුහාවක් මුත් පුද්ගලයෙක් සත්වයෙක් නොවේමය.

භාග්‍යවතුන්වහන්සේ විසින්ද දම්පියා පෙළේ:—

“දූරඞ්ගමං ඒකචරං, අසරීරං ගුහාසයං,
යෙ චිත්තං සඤ්ඤමෙස්සන්ති, මොක්ඛන්ති මාර බන්ධනා”

---

**නවත්ථු අත්ථි රූපං කායවිඤ්ඤාණස්ස ආරම්මණං-අත්ථි රූපං කායවිඤ්ඤාණස්ස නආරම්මණං”** යනුවෙන් පඤ්චවිඤ්ඤාණයන් සම්බන්ධව වස්තු ආරම්මණ වශයෙන් දුක දෙක දෙක බැගින් ලැබෙන්නාක්මෙන් මනොවිඤ්ඤාණය සම්බන්ධව **“අත්ථි රූපං මනොවිඤ්ඤාණස්ස වත්ථු-අත්ථි රූපං මනොවිඤ්ඤාණස්ස නවත්ථු”** යන වස්තුදුකය මුත් **“අත්ථි රූපං මනොවිඤ්ඤාණස්ස ආරම්මණං-අත්ථි රූපං මනොවිඤ්ඤාණස්ස නආරම්මණං”** යන ආරම්මණ දුකය නොලැබෙන හෙයිනි.

මෙසේ වදාරනලද හෘදයවස්තු රූපය සම්බන්ධව පෙර පටන් නොයෙක් දෙනා නොයෙක් මත උපදවා තිබේ. එසේම ඒ මත නිරාකරණයෙන් **ටීකානුටීකාචාර්‍ය්‍යවරයන්** විසින් බුද්ධ මතානුගත **අට්ඨකථාචාර්‍ය්‍ය** මතයම ප්‍රමාණකර තිබෙනබැව්ද පෙනේ. එයින් මෙහි **පරමත්ථදීපනී** ටීකාචාර්‍ය්‍ය **ඤාණාලඞ්කාර** මහා ස්ථවිරයන්වහන්සේ විසින් සංග්‍රහකරන ලද හෘදය වස්තු රූපවිනිශ්චය පමණක් දක්වනු ලැබේ.

වස්තු රූපයනම් මනොධාතු මනොවිඤ්ඤාණධාතු දෙදෙනාගේ නිශ්‍රය වස්තු භාවය ලක්ෂණකොට ඇති රූපයකි.

හේ වනාහි හෘදය කොශාභ්‍යන්තරගත අඩපතක් පමණ ලේ ධාතුව සිතාර පහලවන්නේයයි සැලකියයුතු.

ඒ හෘදයවස්තු රූපය දෙශනා දුක භෙදය රක්නා පිණිස **දම්සඟුණු** පෙළේ නොවදාරා **පට්ඨානප්‍රකරණයෙහි** වදාරනලද්දේය.

කෙසේ වදාරන ලද්දේද?යත්. **“වත්ථු කුසලානං ඛන්ධානං නිස්සයපච්චයෙන පච්චයො වත්ථු අකුසලානං ඛන්ධානං නිස්සයපච්චයෙන පච්චයො”** යනාදි වශයෙනි.

මෙහි චක්ෂු ශ්‍රොත්‍ර ඝ්‍රාණ ජිහ්වා කාය හෘදයයන ෂඩ්විධ වස්තු රූපයන්ගෙන් අන්‍යවූ වස්තු රූපනම් දෙයක් නැත්තේය.

එයිනුදු චක්ෂුරාදි ප්‍රසාද වස්තු රූපයෝ පස්දෙන කුශලා කුශලාදි නාම ධර්මයන්ගේ නිශ්‍රයෝම නොවෙත්.

එහෙයින් කුශලා කුශලාදි නාම ධර්මයන්ගේ නිශ්‍රය භාවයෙන් ගෙන **පට්ඨානප්‍රකරණයෙහි** වදාරනලද වස්තු රූපයනම් ප්‍රසාදවස්තු රූපයන්ගෙන් අන්‍ය වස්තු රූපයක්මය හෙවත් හෘදයවස්තු රූපයමබව දතයුත්තේයයි විනිශ්චයකරනලදී. හදයවත්ථු ශබ්දයාගේ විග්‍රහ වාක්‍යද මෙහි දක්වනු ලැබේ.

**“හදන්ති සත්තා තං තං අත්ථංවා අනත්ථංවා පූරෙන්ති එතෙනාති හදයං-හදන්තිවා සත්තා ඉතො නානාවිතක්කෙ ඔස්සජන්ති මුඤ්චන්තීති හදයං-හරන්තිවා පරිහරන්ති තං සත්තා ජීවිතං විය දයන්ති රක්ඛන්තිචාති හදයං වසන්ති නිවසන්ති චිත්තචෙතසිකා ධම්මා එත්ථාති වත්ථු හදයඤ්ච තං වත්ථු චාති හදයවත්ථු.”** මේ “හදයවත්ථු” ශබ්දයාගේ විග්‍රහවාක්‍යයෝයි.

යනුද අඬගුත්තර සඟියෙහි "මච්චුවෙසො ගුහාසයො" යනුද වදාරනලදී.

එහි අර්ථ:—දූරඞ්ගමං, (තැනකින් තැනකට මාරුවීයාමක් නැතත් විෂය ග්‍රහණ වශයෙන්) ඉතා දුරවූද අරමුණුකරා වහා ගමන්කරන්නාවූ; එකචරං, (එකසිතක් ඉපද නිරුද්ධ වීමෙන්ම අන් සිතක් ඉපදීම ඒ සිත නිරුද්ධවීමෙන් අන් සිතක් ඉපද නිරුද්ධවීම මේ පිළිවෙලින් එක එක බැගින් ඉපද නිරුද්ධවීම ස්වභාවකොට ඇති හෙයින්) හුදකලාව හැසිරෙන්නාවූ; අසරීරං, (නාම අරූපී ධර්ම බැවින් වට දිග් සතරැස් ආදි සණ්ඨාන වශයෙන් ගැනීමට) ශරීරයක් නැත්තාවූ; ගුහාසයං, (සතර මහා භූතයන්ගේ සමූහයක්වූ) හෘදය ගුහායෙහි වස්තු රූපාශ්‍රයෙන් පවත්නාවූ; චිත්තං,(වන වඳුරෙකුට බඳු නොයෙක් අරමුණෙහි විසිර පවත්නා) චිත්තය; යෙ, යම් ස්ත්‍රී පුරුෂ කෙනෙක්; සඤ්ඤමෙස්සන්ති, (නොඋපන් කෙලෙසුන් නොපිපැද්දදී ප්‍රමාද දොෂයෙන් උපන් කෙලෙසුන් දුරුකොරෙමින්)සංව... යෙහි පිහිටුවද්ද. තෙ, ඔව්හු; මාරබන්ධනා, (මාරබන්ධනය කියනලද) ත්‍රෛභූමික දුඃඛ වෘත්තයෙන්; මොක්ඛන්ති, මිදෙනාහුය. අයං කොධො, මේ ක්‍රොධය; ගුහාසයො, හෘදය ගු... යෙහි වස්තු රූපාශ්‍රයෙන් පහළවන්නේය. මච්චුවෙසො, මි... වෙශාපෙක්ෂට ධර්මයකි. යනු අර්ථයොජනාදී.

හෘදය කොෂගත ලේද එය ආශ්‍රය කරමින් පවත්නා චිත්ත චෛතසික ධර්මයන්ගේ ආනුභාවයෙන් නානාප්‍රකාර අන්දම් වර්ණවත්වෙමින් පවත්නාබව සැලකියයුතු.

ඒ එසේමැයි රාග සහගත සිත් පහළවනවිට හෘදය කො... ගත ලේ ලාක්ෂාරසයකට බඳු ඝන රක්තවර්ණයෙන්ද ද්වෙෂ... ගත සිත් පහළවනවිට දැළිදියට බඳු කාලවර්ණයෙන්ද මො... සහගත සිත් පහළවනවිට මස්සේදූ ජලයට බඳු මඳ රක්ත... වර්ණයෙන්ද විතර්ක සහගත සිත් පහළවනවිට කොල්ලූතැම්බූ ජලයට බඳු අපිරිසිදු රක්තවර්ණයෙන්ද ශ්‍රද්ධා සහගත සි... පහළවනවිට මඳුටවන් පැහැයෙන්ද ප්‍රඥා සහගත සිත් පහ... වනවිට ජාතිරඞ්ග මාණික්‍ය රත්නයක්සේ ලෙලදිදී බැ... ලීමෙන්ද ප්‍රකාශවන්නේයයි දතයුතු.

මේ හෘදය කොෂයෙහි පහළව සිදුරුවීයාමක් නැති බවත් උඩින් ආ නහර පසිප්ප දෙකොන් ශරීර මධ්‍යගත මහ නහර යෙහි පිහිටි ලේ හෘදය කොෂයටද හෘදය කොෂයෙහි පිහිටි ලේ ඒ මහ නහරයටද නිතර ගමන්කරන බවත් ඒ නහර

පසිප්ප මුඛවල ඇරෙමින් වැසෙමින් පැවැත්මට යොග්‍යවූ පරිද්දෙන් පියන් පෙති දෙක බැගින් පිහිටා තිබෙන හෙයින් හෘදය කොෂයතුළ පහළවන **චිත්තජ උත්පල** වායු වෙගයෙන් ප්‍රකෘති කාලයෙහි ඒ පියත්පෙති වැසීම සමප්‍රමාණයෙන් වන බවත් සැලකියයුතු.

පප්පුවේ අත තබා පරීක්ෂාකර බලන්නවුන්ට "ධිං ධිං" යන අනුකරණයෙන්ම හෘදය කොෂයෙන් මහ නහරයටද මහ නහරයෙන් හෘදය කොෂයටද ලේ ගමනා ගමනයෙහි වෙගයත් පියත්පෙති වැසීමෙහි වෙගයත් දතහැකිවේ.

එසේ ගමනා ගමනයකරන ලේ මුළුශරීරයෙහිම පැතිරයන බවද දතයුතු.

හෘදය කොෂයෙහි පවත්නා ලේ ආශ්‍රයෙන් උපදින චිත්ත වෙගය දුර්වලව ඒ චිත්ත වෙගයෙන් හටගන්නා **උත්පල** වායු වෙගය දුර්වලවීනම් පියත්පෙති වැසීම දුර්වලවෙයි.

පියත්පෙති වැසීම දුර්වලවීමෙන් ලේ ගමනා ගමනයද දුර්වල වෙයි. චිත්තවෙගය බලවත්ව ඒ චිත්තවෙගයෙන් හටගන්නා **උත්පල** වායු වෙගය බලවත්වීනම් පියත්පෙති වැසීම බලවත් වෙයි. පියත්පෙති වැසීම බලවත්වීනම් ලේ ගමනා ගමනයද බලවත්වෙයි.

එසේම සිත හෘදය කොෂගත ලේ ආශ්‍රයෙන් උපදින හෙයින් ඒ හෘදය කොෂගත ලේ විපරීතවීමෙන් සිතද විපරීතවිය හැකි බව සැලකියයුතු.

ග්‍රීවාදෑලෙන් නැංගාවූ ලේ නහර මිරිකා ලේ ගමනාගමනය හිරකළහොත් ඊට සම්බන්ධවූ හෘදය කොෂයෙහි පිහිටි ලේද විපරීතව ඒ ලෙය ආශ්‍රයකොට උපදින චිත්ත පරම්පරාව දුර්වලවීමෙන් භවාඞ්ගයට බැසගනී.

එසේ සිත භවාඞ්ගවීයාමට නිද්‍රා නහරය මිරිකීමෙන් නිද්‍රොපගතවීයයි කියාද සිහි නැතිකරන නහරය මිරිකීමෙන් සිහිනැතිවීයයි කියාද මනුෂ්‍යයෝ ව්‍යවහාරකරති.

හෘදය කොෂගත ලෙය ප්‍රමාණයට වඩා කැළඹී විපරීතවී නම් සිහිනැතිවනු පමණක් නොව මරණයද පැමිණිය හැක්කේය.

දොස්තර්වරුන්ගේ සිහිනැතිකරවීමද යම්කිසි බෙහෙත් හුමාලයකින් හෘදය කොෂයෙහි ලෙ විපරීතකොට සිත භවාඞ්ගයට පමුණුවාලීමයි.

ඒ බෙහෙත් හුමාලය සකල ශරීරයෙහි ලේ වාත දෙක ගමන්කරන නහරවලට ඇතුල්වීමෙන් එහි ලේ වාත කුපිතව විපරීතවූ කල්හි ඊට සම්බන්ධව පවත්නා හෘදය කොෂයෙහි පිහිටි **උත්පල වාතයද** කුපිතව චලිතවීමෙන් චිත්තය විපරීත වෙයි උන්මාද භාවයට හෝ පැමිණෙයි.

එසේ උමතුවූවන්ට වාතුම්මත්තකයෝයයි ව්‍යවහාරකරති.

ඒ එසේමැයි **ඝටපණ්ඩිත ජාතකයෙහි රෝහිණෙය්‍ය**නම් පණ්ඩිත ඇමතියාණන් විසින් වාසුදෙව රජුකරා ගොස්:-

''උට්ඨෙහි කණ්හ කිං සෙසි, කො අත්ථොසුපිනෙනතෙ,
යොපි තුය්හං සකොභාතා, හදයං චක්ඛුචදක්ඛිණං,
තස්සවාතා චලයන්ති; ඝටොජප්පති කෙසව.''

යනුවෙන් **ඝටපණ්ඩිත** කුමාරයා හෘදය කොෂගත **උත්පල වාතය** චලිතවීමෙන් උමතුව ''මට සාවාදෙව් මට සාවාදෙව්'' යයි මරහඬදෙමින් හැසිරෙනබව සැලකරනලද්දේය.

(එහි අර්ථ:—කණ්හ, කෘෂ්ණ ගෝත්‍රයෙහි උපන් මහ රජාණෙනි! උට්ඨෙහි, නැගිටුව මැනව; කිං, කවරකාරණයකින්; සෙසි, හෝනෙහිද; සුපනෙන, ශයනයකිරීමෙන්; තෙ, තුඹ වහන්සේට; කො අත්ථො, කවර ප්‍රයෝජනයක්ද; තෙ, තුඹ වහන්සේගේ; හදයස්සුව, හෘදය හා සදෘශවූද; දක්ඛිණං චක්ඛු ච, දකුණු ඇස හා සදෘශවූද; යොසකොභාතා, (ඝටපණ්ඩිත නම්) යම් සිය මළණුකෙනෙක්; අත්ථි, ඇද්ද; කෙසව,(බොහෝ කෙස් ඇති හෙයින්) කෙසවනම්වූ මහ රජාණෙනි! තස්ස, ඒ මල්වූ ඝටපණ්ඩිතයාණන්ගේ; වාතා, (හෘදය කොෂයෙහි හටගන්නා චිත්තජ උත්පල)වාතයෝ තුමූ; චලයන්ති, චලිත වන්නාහුය; තස්මා, එහෙයින්; ඝටො, මල්වූ ඝටපණ්ඩිත කුමරු තෙම; ජප්පති, ''මට සාවාදෙව් මට සාවාදෙව්''යයි මරහඬ දෙමින්හැසිරෙයි. මේ ගාථාවේ අර්ථයෝජනායි.)

**උත්පල වාතය**ම නොව යම් කෙනෙකුගේ හෘදය කොෂගත ලේ කුපිතව විපරීතවීනම් එයිනුදු උන්මාද භාවයට පැමිණිය හැක්කේය. එබඳු උමතුවන්ට රුධිරුම්මත්තකයෝයයි ව්‍යව හාර කරති.

තවද යම්කිසි කාරුණකින් හෘදය කොෂයෙහි ලේ අඩුවීම හෙතුකොටගෙනද උණුවීම හෙතුකොටගෙනද සිතේ දුර්වල කම සිහිසන් නැතිවීම හතිවැටීම සහ මරණයද පැමිණිය හැක්කේය.

එසේම හෘදය කොෂයෙහි ලේ සිහිල්ව ඝනවීමෙන්ද සිතේ දුර්වලකම සිහිසන් නැතිවීම හතිවැටීම සහ මරණයද පැමිණිය හැක්කේය.

අබින් ලේගියම් සුරා රහමෙර මත්පැන් ආදී මද්‍යවගී පරිභොගකිරීමෙන් එය ගලනාලය තුළට වන්කල්හි හෘදය කොෂයෙහි ලේ ඝනබවට පැමිණීමෙන්ද සිතේ දුර්වලකම සිහිසන් නැතිවීම හෝ මරණයද පැමිණිය හැක්කේය.

ලේ ඌෂ්ණව ගත කරන්නාවූ කෑමවගී කජුමද කොළඹ පත්‍රාදිය අනුභවකිරීමෙන්ද හෘදය කොෂයෙහි ලේ ධාතුව ඝනවතු පමණක්නොව ශරීර මධ්‍යගත මහ නහර අනුසාරයෙන් ඊට සම්බන්ධව අක්ෂි මාංස සිසාරා පිහිටි ක්‍ෂුද්‍රානු ක්‍ෂුද්‍ර නහරගත ලේද ඝනවීමෙන් ඇස්පෙඬි බරව ඇසිපියහෙලීමද දුෂ්කරවන්නේය. එසේ ඇස්පෙඬි බරවීයන අන්දමින් උපදින රූප කලාපවූකලි බරගතියෙන් යුක්තවන බැවින් ගරුභාරූපයයිද කක්ශගතියෙන් යුක්තවනබැවින් බරභාරූපයයිද පීනරූප මිධරූපයයිද ව්‍යවහාරකළහැකි බවට පැමිණෙති.

මෙසේ කියනලද නයින් නාමයත් රූපයත් දෙකම දැඩිව බරවීයාමෙන් සිත භවාඞගයට වැටී සිහිසන් නැතිවියහැකි බව දතයුතු.

තවද ශොකය හෝ තැවිල්ල ලක්‍ෂණකොට ඇති වෙෂය හෙතුකොටගෙන උෂ්ණ රූප කලාප පහළවනබවද පිළිකුල හෝ භයවීම ලක්‍ෂණකොට ඇති වෙෂය හෙතුකොටගෙන සිහිල් රූප කලාප පහළවන බවද දතයුතු.

ඒ එසේමැයි භය ජනක අරමුණු ප්‍රතිකූල අරමුණු මුණගැසීමෙන් සිතේ භයක් හෝ පිළිකුලක් හෝ ඇතිවූවිට සකල ශරීරයෙහිම සිහිල් රූප කලාප පහළවීමෙන් හෘදය කොෂගත ලේද ඝන භාවයට පැමිණ සිත දුර්වල වන්නේය. සිහිසන් නැතිවීම හා හතිවැටීමද ඇති වන්නේය. හෘදය කොෂගත ලේ අතිශයින් ඝනවී ගියහොත් මරණයද පැමිණිය හැක්කේය.

මනුෂ්‍යයන් අල්වාගනු කැමති අමනුෂ්‍යයෝද පළමුකොට භයානක රූප දක්වීමෙන් හෝ භයානක ශබ්ද ඇස්වීමෙන් හෝ හෘදය කොෂයෙහි ලේ විපර්‍යාසකොට සිත දුර්වල භාවයට පමුණුවා සිහිමුළාකරවත්. සිහිමුළාවී සිත භවාඞගයට බැසීමෙන් මුඛය විවෘතනවූවිට මුඛයෙන් අතදමා හෘදය කොෂයට ලේ ඇතුල්වන ධමනී නහරයන්ගේ මුඛ වැසීමෙන් ලේ ගමනාගමනය වලක්වා ජීවිත හානිකරත්.

මෙසේ විස්තරකරනලද මේ හෘදය මාංසයනම් වර්‍ණයෙන්ද සණ්ඨානින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍ය්‍යන්ත පරිච්ඡේදයෙන්ද අවශෙෂ කොට්ඨාසයන් කෙරෙන් වෙන්වූ තදගතියෙන්යුත් එක්තරා අධ්‍යාත්මික පෘථිවි ධාතු මාත්‍රයකි.

## 12. යකනං, (අක්මාව.)



මේ ඡායාරූපයෙන් සිරුර ඉදිරිපස පිට තට්ටුව ගලවා දැමූවිට ඇතුල් කොට්ඨාස පෙනීයන ආකාර දක්වයි.
හෘදය ගර්භය.
දෙපැත්තෙන් සිටි 'ඉ' යනු දෙකෙන් ඉලඇට පඞ්ක්තිද 'ප' යනු දෙකෙන් පපුගාබුද 'හෘ' යන්නෙන් හෘදය මාංසයද දක්වයි,

මේ වනාහි දෙතන මැදදි පමණ පවත්ගෙන ආමාශයේ ඉදිරිපාර්ශ්වය ආශ්‍රය කරමින් පිහිටි මාංසයකි. පෙකණියට සතරඟුලක්පමණ උඩදි කොලවරවී තිබේ. ඊට උඩින් හෘදය මාංසපිණ්ඩය පිහිටා තිබේ. එහෙත් හෘදය මාංස අක්මා මාංසපිණ්ඩයන්ගේ එකට ගැටීමක් සැපීමක් නැත්තේය. ශරීරයේ ඇතුල් කුහරය දලබු සිවියකින් පිරිසිඳිනලදින් හෘදයගර්භය කුක්ෂිගර්භයයි ගර්භ දෙකක්ව බෙදී හෘදය මාංස පිණ්ඩය හෘදයගර්භයෙහිද අක්මා මාංස පිණ්ඩය කුක්ෂිගර්භයෙහිද පිහිටාතිබේ.

කුක්ෂි ගණ්ඨිය.

දෙපැත්තෙන් සිටි ‘උ’ යනු දෙකෙන් උකුල් ඇටයද ‘අ’ යනු දෙකෙන් අක්මා මාංසයද ‘ආ’ යන්නෙන් ආමාශයද ‘ඇ’ යන්නෙන් ඇලදිවද ‘ප’ යන්නෙන් පක්වාශයද ‘බ’ යන්නෙන් බඩවැල් දරණියද හෘදය ගණ්ඨි කුක්ෂි ගණ්ඨි දෙකට අතර තිබෙන ‘ද’ යන්නෙන් ගණ්ඨි දෙකේ අතර පිරිසිඳගෙන සිටි දලබු සිවියද දක්වයි.

හෙද වනාංගි වර්ණ වශයෙන් කසිප්පුවල වර්ණයට බඳු ඝනරක්ත වර්ණයෙන් යුක්තයි. සටහන මධ්‍යයෙහි පටන් මූලට ක්‍රමයෙන් ඝනව සිහින්වී ගොස් තිබේ. අගින් තුනීයට පලල්වී ගොස් කොබෝලීල පත්‍රයක ආකාරයෙන් අනතිමවී තිබේ. පරිච්ඡේද වශයෙන් ස්වකීය පර්‍යන්තයෙන්ම පිරිසිඳ පිහිටා තිබේ. ප්‍රඥාවන්තයන්ට සිහින් අක්මා මාංස පටල දෙකක් හෝ තුනක් ඇතිවන බවද ප්‍රඥාවමඳ අයට ඉතා මහතට එකම අක්මා මාංස පිණ්ඩයක් ඇතිවන බවද දතයුතු.

පපුගඩුදෙක සිහින්ව අක්මා මාංසපිණ්ඩය මහත්ව පිහිටි අයගේ දෑල පලල්ව උදරය මහත්වන බවද ළැපැත්ත පටුවී පපුව සිහින්ව මැදින් උස්වී පිහිටනබවද අක්මා මාංසපිණ්ඩය සිහින්ව පපුගඩුදෙක මහත්ව පිහිටි අයගේ දෑල පටුවී උදරය කුඩාවන බවද ළැපැත්ත පලල්ව පපුව මහත්වන බවද සැල කියයුතු. අක්මා මාංසපිණ්ඩය සිහින්ව පපුගඩු දෙක මහත්ව පිහිටි අයට මුඛවාත නාසිකාවාත බලවත්වනු පමණක්නොව දිය පිපාසද අඩුවේ. එසේම දෙඅංසයෙන් මහත් පපුගඩු දෙකක් තදවී සිටි හෙයින් හෘදය මාංසය බලසම්පන්නාවීමෙන් ළය කම්පාව හා හතිවැටීමද අඩුවේ. පක්ෂි ආදි සමහර තිරිසනුන්ගේ අක්මා මාංසයද හෘදය ගණ්ඨියෙහිම පිහිටීමෙන් හෘදය මාංසය අක්මා මාංසයෙන් වැසී යනබවද ඔවුන්ටත් දෙඅංසයෙහි පිහිටි අක්මා මාංසයෙන් තදවී හෘදය මාංසය බලසම්පන්නාවීමෙන් ළය කම්පාව හා හතිවැටීම අඩු වේ.

මෙසේ කියනලද අක්මා * මාංසයනම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍යන්ත පරිච්ඡේදයෙන්ද අවශේෂ කොට්ඨාසයන් කෙරෙන් වෙන්වූ එක්තරා අධ්‍යාත්මික පෘථිවි ධාතුමාත්‍රයකි.

* මේ අක්මා මාංසයට කැවුතු මාංසයයිද ව්‍යවහාරකරත්.

**18. උදරියං, (නොපැසුණු ආහාර),19. කරීසං, (පැසුණු ආහර.)**

සත්වයන් විසින් කනබොනලද ආහාරපාන වර්‍ග ශරීරයතුළ ග්‍රීවයෙහි පටන් ගුද මාර්‍ගය දක්වා යම් පමණ ඇතුල්වී පව තීත්ද ඒ සියල්ලම ආහාරපාන වර්‍ග නොපැසුණු ආහාරය පැසුණු ආහාරයයි දෙකොටසක් වෙති.

ග්‍රීවාකුහරයට ඇතුල්නොවී මුඛගතව සිටි ආහාරය අධ්‍යාත්මික සන්තානයට ප්‍රවිෂ්ටවූයේවී නමුදු ග්‍රීවා කුහරයට බැසනොගත් හෙයින් "උදරියං"යන නාමයෙන් ව්‍යවහාරනොවේ. හුදෙක් භොජන නාමය නොහළ හෙයින් බාහිර ආහාරයෙහි සඞ්ග්‍රහවනබව දතයුතු. එසේම ගුදමාර්‍ගයෙන් පිටවී යන ආහාර මල "කරීසං"යන නාමයෙන් ව්‍යවහාරවනනමුත් ශරීරයෙන් මුක්තවූ හෙයින් අධ්‍යාත්මික කරීස කොට්ඨාසයෙහි සඞ්ග්‍රහයට නොපැමිණේ. බඩවැල තුළ පිහිටි ආහාර අතුරෙන් ග්‍රීවා කුහරයෙහි පටන් ආමාශයෙන් යට බඩවැල් දරණ දසයක් පමණ වනතුරු මේ අතර පිහිටි ආහාර නොපැසුණු අමු ආහාර නම් වෙත්.

එතැන් සිට ගුද මාර්‍ගය දක්වා මේ අතර බඩවැල් දරණ එකොළොසෙක්හිද පක්වාසයෙහිද පිහිටි ආහාර වනාහි පැසුණු ආහාරනම් වෙත්.

මුඛගතව මිශ්‍ර භාවයට පැමිණි ආහාරයෙහි වර්‍ණයද ගුද මාර්‍ගයෙන් නික්මුණු දිරූ ආහාරයෙහි වර්‍ණයද සලකා බැලීමෙන් බඩවැල් කුහරයතුළ නන්වැදෑරුම් විකාර භාවයට පැමිණෙමින් පවත්නා පැසුණු නොපැසුණු අධ්‍යාත්මික ආහාර දෙවර්‍ගයෙහිම වර්‍ණභෙදයද එසේම බඩවැලේ සටහනත් මෙනෙහිකිරීමෙන් ඒ ආහාර දෙවර්‍ගයෙහි සටහනද දතහැකිවේ.

බඩවැල් කුහරයේ ආකාරය සලකාබැලීමෙන්ම දිරූ නොදිරූ ආහාර දෙකොටසේ පර්‍ය්‍යන්ත පරිච්ඡෙදය දතහැකිවේ.

මෙසේ කියනලද මේ පැසුණු නොපැසුණු ආහාර දෙවර්‍ගය නම් වර්‍ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍ය්‍යන්ත පරිච්ඡෙදයෙන්ද අවශෙෂ කොට්ඨාසයන්කෙරෙන් වෙන්වූ තද ගතියෙන් යුත් එක්තරා අධ්‍යාත්මික පෘථිවි ධාතු මාත්‍රයකි.

අණ්ඩමාංසපිඩු දෙක කිකිළියෙකුගේ කුසගත තරමක් මුහු කළ බිත්තරයකට බඳු සුදුමැලිපැහැයෙන් යුක්තයි. සටහන හා පිහිටි ස්ථානය හා පරිච්ඡේදයත් සුප්‍රකටයි.

මේ ආදීන් ස්වරූප වශයෙන් නොවදාරනලද පෘථිවීධාතු කොඨාස සියල්ලම **යෙවාපනක** නාමයෙන් සඞ්ග්‍රහවී තිබෙන බව සැලකියයුතු.

මේ “යෙවාපනක” පෘථිවීධාතු කොඨාසයෝයි.

මෙසේ කියනලද අධ්‍යාතමික පෘථිවීධාතු කොඨාස විස්ස කෙසකොඨාසයෙහි පටන් මත්ථලුඞ්ගකොඨාසය දක්වා අනුලොමවශයෙන්ද මත්ථලුඞ්ග කොඨාසයෙහි පටන් කෙසකොඨාසය දක්වා ප්‍රතිලොම් වශයෙන්ද වාචොංද්ගතව පුහුණු වීම දක්වා මුවෙන් බිණීමෙන් පළමුකොට සජ්ඣායනා කටයුතු.

එසේ සජ්ඣායනා කිරීමෙන් වාචොද්ගතව පුහුණුවී ඇකල්හි කෙස් ලොම් ආදී ඒ ඒ කොඨාසයන් යට කියනලද පරිද්දෙන් වර්ණය සණ්ඨානය පිහිටි ස්ථානය පරිච්ඡේදය යන සතරාකාරයෙන් සංඥාවෙන් හැඳින විඥානයෙන් දැන ඒ දැනගත් හැඳිනගත් පරිදි නොවරදවා නුවණින් පැහැදිලිව පෙණීයන තුරු අනුලොම ප්‍රතිලොම වශයෙන් නැවත නැවත මෙනෙහි කටයුතු. සතරදිනක් පස්දිනක් පමණ මෙනෙහිකොට එපමණින් නොවැටහීනම් දසදිනක් පසළොස්දිනක් පමණ සාමාන්‍යවශයෙන් මෙනෙහිකටයුතු. **යෙවා පනක** පෘථිවී කොඨාසද ඇතුළත්කොටගෙන මෙනෙහිකටයුතු. එසේ මෙනෙහිකරගෙන යනවිට ක්‍රමක්‍රමයෙන් අධ්‍යාත්මික පෘථිවී කොඨාස කොයිවත් වර්ණ සණ්ඨානාදීන්ගේ වශයෙන් වෙන වෙනම පැහැදිලිව පෙණීයනවා ඇත.

නැවත ඤාණ නැමැති හස්තයෙන් බාහිර පස්පිඩක් හා අධ්‍යාත්මික කෙස් වැටියක් ගෙන අත්ලඋඩ තබා මෙනෙහි කරන අයුරු මෙසේයි. මේ බාහිර පස්පිඩ මමය කියා ගැනීමට කෙනෙක් හෝ මාසතුය කියා ගැනීමට දෙයක් හෝ නොවේ. හුදෙක් තදගතිය ලක්ෂණකොට ඇති පෘථිවීධාතු මාත්‍රයක්ම වන්නේය. එමෙන්ම මේ අධ්‍යාත්මික කෙස්වැටියද මමය කියා ගැනීමට පුද්ගලයෙක් නොවන්නේමය. මාසතුය කියා ගැනීමට දෙයක්ද නොවන්නේමය. හුදෙක් තදගතිය ලක්ෂණකොට ඇති පෘථිවීධාතු මාත්‍රයක්ම වන්නේය. මේ කෙස්වැටිය හා පස්පිඩ යන දෙවර්ගයමත් මමය කියා ගැනීමට

පුද්ගලයෙක් නොවන්නේමය. මාසතුය කියා ගැනීමට දෙයක්ද නොවන්නේමය. හුදෙක් තදගතිය ලක්ෂණකොට ඇති පෘථිවිධාතු මාත්‍රයක්මයයිමෙසේ මෙනෙහි කටයුත්තේය.

මේ නයින්ම ඉතුරු ලොම් නිය දත් සම් මස් ආදි එකුන්විසි (19) පෘථිවි කොඨාසයන්ද වෙන වෙනම එක එක බැගින් ගෙන බාහිර පෘථිවි ධාතුයයි කියනලද පස්පිඩ හා සමව පෙණී වැටහී යනතුරු සසඳා මෙනෙහි කරනු. එසේම කලින්කල ක්ෂණ නැමැති ආවුධයෙන් අධ්‍යාත්මික පෘථිවි ධාතු කොඨාසයන් සිඳ බිඳ ඒ ඒ තැන දමා බැලීමෙන්ද කලින්කල එකටගෙන බැලීමෙන්ද මෙනෙහි කරනු. බාහිර පෘථිවිධාතු වෙනුවෙන් පස් පිඩම නොව ගල් මුල් දූවදඬු තණ පරඬැල් ආදි කොයි කොයි වස්තු කොඨාස සමගත් කෙස් ලොම් නිය දත් සම් ආදි අධ්‍යාත්මික පෘථිවිධාතු කොඨාසයන් සසඳා බලමින් මෙනෙහි කරනු.

මෙසේ කියනලද නයින් කෙස් ලොම් ආදි අධ්‍යාත්මික පෘථිවි ධාතු කොඨාසයන් පස් ගල් මුල් ආදි බාහිර ධාතු කොඨාසයන් හා සමග සසඳා බලමින් මෙනෙහිකරගෙන යනවිට අධ්‍යාත්මිකය බාහිරය කියා වෙනසක් නොපෙණී කෙස් ලොම් ආදි අධ්‍යාත්මික පෘථිවි ධාතු කොඨාස සියල්ලම පස් ගල් මුල් දූව දඬු තණ පරඬැල් ආදි බාහිර පෘථිවි ධාතු කොඨාසයන් හා සමානවම ක්ෂණයට විඥානයට පෙණීයනවා ඇත. වැටහී යනවා ඇත. සිතේ ඇඳි යනවා ඇත. එසේ පෙණී වැටහී ඇඳිගියවිට පස් ගල් මුල් දූවදඬු තණ පරඬැල් ආදි බාහිර පෘථිවි ධාතු කොඨාසයන් කෙරෙහි "මේ පස් පිඩ මමය මාගේය, මේ ගල මමය මාගේය. මේ මුල මමය මාගේය මේ දූව මමය මාගේය. මේ දඬු මමය මාගේය." කියා මෙසේ ගැනීමක් යම්සේ ඇතිනොවන්නේද එපරිද්දෙන් කෙස් ලොම් ආදි අධ්‍යාත්මික පෘථිවි ධාතු කොඨාසයන් කෙරෙහිද "මේ කෙස් මමය මාගේය. මේ ලොම් මමය මාගේය. මේ නිය මමය මාගේය. මේ දත් මමය මාගේය. මේසම මමය මාගේය. යනාදිවශයෙන් දැඩිගැනීමක් ඇතිනොවන්නේමය.

එසේ කෙස් ලොම් ආදි අධ්‍යාත්මික පෘථිවි ධාතු කොඨාසයන් කෙරෙහි මමය මාගේය කියා ගැනීම නැතිවීගියවිට මහාපෘථිවියෙහි පිහිටියාවූ පස් ගල්මුල් දූවදඬු ආදි බාහිර පෘථිවි ධාතුකොඨාසයන් කැති උදලු පොරෝ ආදිය ගෙන කපන අය කපමින් සාරන අය සාරමින් කොටන අය කොටමින් ගිනිලන අය ගිනිලමින් සිඳිත් බිඳිත් මුත් එයින් මේ ධාතු මනස්කාරයෙන් යුක්ත සැදැහැවතුන්ට "අහෝ! අහෝ! මිනිස්සු අවුත් අප කැතිවලින් කපත්. අප උදලු වලින් සාරත්. අප පොරෝවලින්

කොටත්. අප ගිනිලත් අහෝ අහෝ මිනිස්සු අවුත් අප සුණුවිසුණු කරත්" යයි මෙසේ මරහඬදීමක් වැළපීමක් යම් සේ ඇතිනොවන්නේද. එමෙන්ම තම අයත්යයි සම්මත කෙස් ලොම් නිය දත් ආදි අධ්‍යාත්මික පෘථිවි ධාතු කොට්ඨාසයන් කැති උදලු පොරෝ ආදිය ගෙන කපන අය කපමින් සාරන අය සාරමින් කොටන අය කොටමින් ගිනිලන අය ගිනිලමින් සුණුවිසුණුකරන අය සුණුවිසුණු කරමින් සිඳිත් බිඳිත් මුත් එයිනුදු මේ ධාතුමනස්කාරයෙන් යුක්ත සැදැහැවතුන්ට අහෝ! අහෝ! මිනිස්සු අවුත් අප කැතිවලින් කපත්. අප උදලුවලින් සාරත් අප පොරෝවලින් කොටත්. අප ගිනිලත්. අහෝ! අහෝ! මිනිස්සු අවුත් අප සුණුවිසුණුකරත්" යයි මෙසේ මරහඬදීමක් වැළපීමක් ඇති නොවන්නේමය.

මෙලෙසින් කෙස් ලොම් ආදි අධ්‍යාත්මික පෘථිවි කොට්ඨාසයන්ද පස් ගල් මුල් ආදි බාහිර පෘථිවි කොට්ඨාසයන්ද තදගති යයි කියනලද ස්තබ්ධ ලක්ෂණ මාත්‍රයමුත් මමය කියයුතු තොනෙක් හෝ මා සතුය කියයුතු දෙයක් හෝ නොවන්නේම යයි පැහැදිලිව ඥානයෙන් දැක කෙස් ලොම් නිය දත් ආදි මේ අධ්‍යාත්මික පෘථිවි ධාතුකොට්ඨාසයන් කෙරෙහි අනවරාග්‍ර සංසාරය මුළුල්ලෙහි මමය මාගේය කියවමින් සන්තානානුගතව පැවත එන්නාවූ සියලු දුශ්චරිතයන්ට මූලාධාරවූ සත්කාය දෘෂ්ටි නැමැති අපායාගාමි බීජයන් හා තෘෂ්ණා සංයොජන රූහැන්ද පහකිරීමෙන් කිසිමකලක සිහිනෙන්වත් නුදුටු විරූපරමරමණීය ශාන්තප්‍රණීත විරාගපදය ප්‍රත්‍යක්ෂ කරන්නාහුමය.

එහෙයින් උද්දෙස ගාථායෙහි "නෙසොහමස්මි නෙතං මෙ එවං තත්ථ විරජ්ජති" යි කියනලදී.

"හත්ථතලෙ ඨපෙත්වාන, පෙක්ඛිත්ව ඤාණ චක්ඛුනා,
යථා ඉදං තථා එතං, යථා එතං තථා ඉදං,
අජ්ඣත්තඤ්ච බහිද්ධාච, පඨවිං වො විරජ්ජථ."

සාධවෙ, සත්පුරුෂවරුනි! වො, (සත්පුරුෂවූ) තෙපි; හත්ථතලෙ, අත්ලෙහි; ඨපෙත්වාන, (අධ්‍යාත්මික බාහිර) පෘථිවි ධාතුවය ඤාණ නැමැති හස්තයෙන් ගෙන තබා; ඉදං, මේ (කෙස් ලොම් ආදි) අධ්‍යාත්මික පෘථිවි ධාතු සමූහය; යථා අහං න අස්මි, යම්සේ මම නොවෙම්ද; තථා, එපරිද්දෙන්; එතං, තෙල (පස් ගල් මුල් ආදි) බාහිර පෘථිවි ධාතු සමූහය; අහං න අස්මි, මම නොවෙමි; එතං, තෙල (පස් ගල් මුල් ආදි) බාහිර පෘථිවි ධාතු සමූහය; යථා අහං න අස්මි, යම්සේ මම නොවෙම්ද; තථා, එපරිද්දෙන්; ඉදං, මේ (කෙස් ලොම් ආදි)

අධ්‍යාත්මික පෘථිවි ධාතු සමූහය; අහං න අස්මි, මම නොවෙමි. ඉති, මෙසේ; ඤාණ චක්ඛුනා, නුවණැසින්; පෙක්ඛිත්වා, බලා; අජ්ඣත්තඤ්ච පඨවිං, (කෙසාදි) අධ්‍යාත්මික පෘථිවි ධාතු සමූහය කෙරෙහිද; බහිද්ධා ච පඨවිං, (පස් ගල් ආදි) බාහිරපෘථිවි ධාතුසමූහය කෙරෙහිද; විරජ්ජථ, නොඇලෙව්.

මෙතෙකින් පඨවි ධාතු නිද්දේශය නිමි.

---

## II. ආපොධාතු නිද්දේශය.

ආපොධාතුතොමෝද බාහිර ආපොධාතු අධ්‍යාත්මික ආපොධාතුන්ගේ වශයෙන් දෙවැදෑරුම්.

එයින් සප්‍රාණික සත්ව සන්තානයෙන් පිට බාහිර සන්තානයෙහි ආබන්ධනය (රූප කලාප එකිනෙක දැඩිසේ බැඳගැනීම) ලක්ෂණකොට ඇති කල්පවිනාශක ජලය පෘථිවි සන්ධාරක ජලය සාගර ජලය ගංගා ජලය විල් ජලය වැව් ජලය පොකුණු ජලය ඇල ජලය දොල ජලය අහස් ජලය ආදි ජලයෝතුමූ බාහිර ආපොධාතුහු නම්වෙත්.

සත්ව සන්තානයෙහි 1. පිත, 2. සෙම, 3. සැරව, 4. ලේ, 5. ඩහදිය, 6. මේදතෙල, 7. කඳුළු, 8. වුරුණු තෙල, 9. කෙළ, 10. සොටු, 11. සදම්දුළු, 12. මුත්‍ර යන දොළොස් කොටස අධ්‍යාත්මික ආපොධාතුහු නම්වෙත්.

මේ ආපොධාතු කොට්ඨාස දොළොස වර්ණය. සටහන. පිහිටි ස්ථානය. පර්‍ය්‍යන්තපරිච්ඡේදය යන සතරාකාරයෙන් පිරිසිඳ දතයුතු. කෙසේද? යත්.

### 1. පිත්තං, (පිත.)

මේ වනාහි කොෂයෙහි පිහිටි පිතය මුළු ශරීරයෙහි විසිර පවත්නා පිතයයි දෙවැදෑරුම්.

පිත පිහිටි කොෂය වනාහි අක්මා මංසයාගේ මූලහරියේදී පටන්ගෙන ඒ අක්මා මාංසයටත් ආමාශයටත් අතර අක්මා මාංසය ආශ්‍රයකරමින් සතරඟුලක් පමණ පහළට එල්බී පිහිටා තිබේ. එහිතුළ පිහිටි පිත කොෂයෙන් බැඳී පවත්නා හෙයින් බද්ධපිතයයි කියනු ලැබේ.

එයින් පිටත් මුළු ශරීරයෙහි පැතිර පවත්නා පිත වනාහි කොෂයකින් නොබැඳී පවත්නා හෙයින් අබද්ධ පිතයයි කියනු ලැබේ.

මේ පිත් දෙකොටසම ඝනවූ මීතෙලකට බඳු පැහැයෙන් යුක්තායහ. කොෂය සමඟ බද්ධපිත කුඩා ලබු ගැටයකට බඳු සටහනින් යුක්තවේ. පරිච්ඡෙද වශයෙන් වනාහි කොෂයෙන්ම පිරිසිඳී පිහිටා තිබේ.

අබද්ධ පිත වූකලී ඇසට ප්‍රකටව පෙණෙන ආපො කොට්ඨාසයක් නොවේ. එහෙයින් ඒ අබද්ධපිත ඇසින් දැක හෝ ඇසින් දක්නාලද්දක්මෙන් සිත්හි කොට හෝ වැඩියයුතුවූ කොට්ඨාසයක් නොවන හෙයින් මේ සූත්‍රාන්තික කොට්ඨාස භාවනාවෙහි ඇතුළත් නොවනබව දතයුතු. ඒ අබද්ධපිත පමණක් නොව එයින් අන්‍යවූ ඇසට නොපෙණෙනතරම් සියුම් පෑවිවි ආපො කොට්ඨාසද **සූත්‍රාන්තික** කොට්ඨාස භාවනාවෙහි ඇතුළත් නොවෙති.

කියනලද පිත් දෙකොටස අතුරෙන් අබද්ධ පිත කුපිතව විපර්‍යාසවීනම් ශරීරයෙහි කැසුමද පණුකැවිලි කුෂ්ට වන පිළිකා ආදී රෝගද ඇස් කරකැවීම ඇස් කහපාටවීම හිස කර කැවීම හිසරදය ආදී රෝගද ඇතිවිය හැක්කේය.

බද්ධ **පිත්ත කොෂයට** අනතුරුව එහි පිත කුපිතව විපර්‍යාස වීනම් රසවශයෙන් අතිශයින් තිත්තරසවූ පිත්වතුර හෘදය කොෂයට ප්‍රවිෂ්ටවීමෙන් හෘදය වස්තු පරම්පරාවගේ නිශ්‍රය ස්ථානවූ ලේ ධාතුව කැළඹීමෙන් ඒ ලේ ධාතු ආශ්‍රයෙන් උපදින චිත්ත පරම්පරාවද කුපිතව විපර්‍යාසවී සත්වයෝ උමතු බවට පැමිණෙන්නාහුය.

එසේ උමතුවන සත්වයෝ **පිත්තුම්මත්තකයෝ**යයි ව්‍යවහාර කරනු ලැබෙත්.

මෙසේ මේ පිත නම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍යන්ත පරිච්ඡෙදයෙන්ද අවශෙෂ කොට්ඨාසයන් කෙරෙන් වෙන්වූ ආබන්ධන ලක්ෂණයෙන් යුත් එක්තරා අධ්‍යාත්මික ආපොධාතු මාත්‍රයකි.

**2. සෙම්හං, (සෙම.)**

මේ වනාහි ආමාශයයි කියනලද ආහාර බොක්කට උඩින් පිහිටි **ශ්ලෙෂ්ම කොෂයෙහි** බහුල වශයෙන්ද ගලවාටයෙහි පටන් ගුද මාර්ගය දක්වා මේ අතර බඩවැලේ දිගටම මද මද වශයෙන්ද මුළු ශරීරයෙහි සෑම තැනම ඉතාමත් මද වශයෙන්ද පිහිටා තිබේ.

ශ්ලෙෂ්ම කොෂය පිහිටි ආකාරය යට බඩවැල විස්තරකිරීමේදී කියනලදී.

කාරුදමනලද ශ්ලෙෂ්ම හැන සලකා බැලීමෙන් ශ්ලෙෂ්ම කොෂයෙහි පිහිටි ශ්ලෙෂ්ම කෙසේවූ ඝන භාවයකින් යුක්තද? කෙබඳු වර්ණයකින් යුක්තද? යනු දතහැකිවේ.

ශෛවාලයෙන් ප්‍රතිච්ඡන්නවූ ජල තලයකට ගලක් ගැසූවිට ඒ ශෛවාලතලය දෙබෑවී නැවත යම්සේ පෑස්සී සම්බන්ධ වන්නේද එපරිද්දෙන් ගලවාටයෙන් ආහාර පිඩක් වැටුණුකල සෙම් හැලද දෙබෑවී නැවත පෑස්සී සම්බන්ධවන්නේය. සමහර කාලයක කොෂයෙහි ශ්ලෙෂ්ම ප්‍රමාණයට වඩා දියාරුවී පවතී. සමහරකාලයක ප්‍රමාණයට වඩා ඝනවී පවතී. ප්‍රමාණයට වඩා සෙම දියාරුවී පවත්නා කල්හිද ප්‍රමාණයට වඩා සෙම ඝනවී පවත්නා කල්හිද ආමාශයෙන් උඩට නගින නපුරු දුර්ගන්ධ හුමාලය හෙතුකොටගෙන සත්වයන්ගේ මුඛයෙන් අතිශයින් ප්‍රතිකූල දුර්ගන්ධය නික්මෙන්නේය.

ශ්ලෙෂ්ම කොෂයෙහි සෙම ප්‍රමාණයට වඩා අතිශයින් අධිකව ඝනවී ගියේවීනම් දුර්ගන්ධය වහනයවනු පමණක්නොව අනුභවකරනලද ආහාරපාන වර්ග යහපත්සේ ආමාශයට නොබැස බඩවැලේ රැඳී නොපැසී නොදිරා සිටිත්වද පිළිවන.

එසේම පපුව බරගතිය. බඩ බරගතිය. බඩ පිපුම අඩස්සිය ආදී රෝගද පැමිණිය හැක්කේය.

ශ්ලෙෂ්ම කොෂයෙහි ශ්ලෙෂ්ම ප්‍රමාණයට වඩා වැඩිවූ කල්හිද කටට නිතර කෙළ ඉනිම සෙම නැගීම හා කියනලද රෝගපීඩාද පැමිණිය හැකි බව සැලකියයුතු. එසේම ශ්ලෙෂ්ම කොෂයෙහි සෙම කුපිතව විපර්යාසවී බොහෝසේ පහළට බැසගිය කල්හිද පහළ බඩවැල දිගේ පිහිටි සෙමද විපර්යාස වීමෙන් බඩරුදාව මදවිරේකය සිදම් විරේකය ආදී රෝග පැමිණිය හැක්කේය. ඒ එසේමය අනුභවකරනලද ආහාරපාන වර්ගයත් අතර නොරැඳී පහළට බැස යාම කරන්නේත් යහපත්සේ පැසවා මල පහවන්නේත් ගලවාටයෙහි පවත් ගුද මාර්ගය දක්වා බඩවැල ඇතුලේ හාත්පස මද මද වශයෙන් පවත්නා සෙමේ උපකාරයෙනි.

පිහිටි ස්ථාන වශයෙන්ද පිහිටි ආකාර වශයෙන්ද සලකා බැලූවිට සෙම් කොටස් දෙකේම සටහන දතහැකිවේ. පරිච්ඡෙද වශයෙන් ඒ සෙම් දෙකොටසම වෙන වෙනම පිහිටි ශ්ලෙෂ්ම කොෂයෙනුත් බඩවැලෙනුත් පිරිසිඳී පිහිටා තිබෙන බව දතයුතු.

ලේ ධාතුව ගමනා ගමනය කරන සකල ශරීරයෙහිම පැතිර පවතින අබද්ධ සෙමවනාහි ඇසට නොපෙණෙන තරම් සියුම් කොට්ඨාසයක් බැවින් මේ සූත්‍රාගතික කොට්ඨාස භාවනාවෙහි ඇතුලත් නොවන්නේය.

අබද්ධ පිත අඩුවී අබද්ධ සෙම වැඩිදියුණුවී ගිය කල්හි හිස කෙස් සුදුවියහැක්කේය. ලොම් සුදුවියහැක්කේය. අබද්ධ සෙම

මදව අබඩ පිත වැඩිදියුණුවී ගිය කල්හි හිසකෙස් කළුවියහැක් කේය. ලොම් කළුවිය හැක්කේය.

මෙසේ කියනලද මේ සෙමනම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍යන්ත පරිච්ඡෙදයෙන්ද අවශෙෂ කොට්ඨාසයන් කෙරෙන් වෙන්වූ ආබන්ධන ලක්‍ෂණයෙන් යුත් එක්තරා අධ්‍යාත්මික ආපොධාතු මාත්‍රයකි.

### 3. පුබ්බො, (සැරව.*)

මේ වනාහි කටු කණු ගල්මුල් ආදියෙහි සැපී සීරී තුවාලවූ කලක හෝ ගඩු වණ පිළිකාදිය ඇතිවූකලක හෝ ශරීරයෙහි හටගන්නේවීනමුත් සියලු කාලයෙහිම ඇතිව පවත්නා කොට්ඨාසයක් නොවේ.

තුවාල ගඩ වණ පිළිකාදිය ඇතිවූ ස්ථානවලද ලේ අධික වීනම් ඒ තුවාල ගඩ වණ පිළිකාදිය ඉක්මනට නොපැසවයි. කැක්කුමද ඇතිකරයි. පැලුවොත් විද්දොත් ලේ ගලයි.

පිත අධිකවීනම් ඒ තුවාල ගඩ වණ පිළිකාදියෙහි කැසුම ඇතිකරයි. කැක්කුම ඇතිකරයි. පැලුවොත් විද්දොත් ඔජස ගලයි. සෙම් අධිකවීනම් ඒ තුවාල ගඩ වණ පිළිකාදිය වහා පැසවයි. හැරව හටගනියි. සිහිල ඇතිකරයි. කැසුම ඇති නොකරයි. කැක්කුම ඇති නොකරයි. සෙම වනාහි සිහිල් ගුණයෙන්යුත් ධාතුවකි තුවාල වණ පිළිකාදිය පැසවනු කැමතිනම් සෙම් වඩන කොසෙල්ගෙඩි ආදිය අනුභවකටයුතු.

මේ හැරව වර්ණ සණ්ඨානාදි වශයෙන් සුප්‍රකටයි. ඇසින් බලාද පිරිසිඳියහැකි කොට්ඨාසයකි. එහෙත් තුවාල ගඩ වණ පිළිකාදියෙහිම පවතින හැරවමුත් එයින් නික්ම පිටවූ හැරව අධ්‍යාත්මික ආපොධාතුවෙහි සඞ්ග්‍රහවට නොපැමිණෙන හෙයින් මේ කොට්ඨාස භාවනාවට නොගතයුතු.

මෙසේ මේ හැරව වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍යන්ත පරිච්ඡෙදයෙන්ද අවශෙෂ කොට්ඨාසයන් කෙරෙන් වෙන්වූ ආබන්ධන ලක්‍ෂණයෙන්යුත් එක්තරා අධ්‍යාත්මික ආපොධාතු මාත්‍රයකි.

### 4. ලොහිතං, (ලේ.)

මේ වනාහි ශරීර මධ්‍යගත මහා ධමනි නහරය පිරී සකල ශරීරයෙහි පැතිර යමින් පවත්නා ආපො කොට්ඨාසයකි.

ඒ මහා ධමනි නහරයෙන් ක්‍ෂුද්‍රානු ක්‍ෂුද්‍රවූ බොහෝ නහර ගණනක් බෙදී වෙන්වී ඒ ඒ ශරීරාවයවයන්ගේ අනතිමය දක්වා ගොස් තිබේ.

---

*මිට පූයායයිද ව්‍යවහාර කරති.

ඒ කුඩා මහත් ධමනී නාහරදිගේ ගමන්කරන ලෙසින් සියලු ශරීරයම නිතර තෙමී යන බව සැලකියයුතු.

දිය ඇලක ගමන්කරන ජලය වැස්සීමෙන් යම්සේ ඒ ඇල දෑලේ බිම තෙමීයේද එපරිද්දෙන් කුඩා මහත් ධමනී නාහර දිගේ ගමන්කරන ලේ වැස්සීමෙන් ඒ නාහර හාත්පස චර්ම මාංසාදිය නිතර තෙමී යන්නේය.

ඒ එසේමැයි මේ ශරීරයෙහි ලේ නාහර නැති තැන්වලද තුවාලකිරීමෙන් ලේ පිටකළහැකි බව කාටත් ප්‍රත්‍යක්‍ෂකාරණ යකි. ඉඳින් එසේ පිට කරන කාලයෙහි ප්‍රමාණයට වඩා අධිකව ලේ පිටවියන්ට හැරියොත් මහා ධමනී නාහරවල ලේ අඩුවියන්ට පිළිවන.

එසේවූවිට හෘදය කොෂගත ලේද අඩුවීමෙන් හතිය සහ ඒ හෘදය කොෂගත ලේ බොහෝකොට අඩුවීනම් මරණයත් පැමිණිය හැක්කේය. එසේම දියපූඩාවන් (දියකූඩැල්ලන්) ලවා කවවා ලේ පිටකරවන කාලවලද ඒ දිය පූඩාවන් ප්‍රමාණයට වඩා අධිකව ලේ උරාගතහොත් ධමනී නාහරවල ලේ අඩුවෙයි. එසේවූවිට හෘදයකොෂගත ලේද අඩුවීමෙන් හතිය ඇතිකරයි. ඒ හෘදය කොෂගත ලේ ධාතුවම බොහෝ කොට අඩුවීමෙන් මරණයද පැමිණිය හැක්කේය. නාහර විද ලේ පිටකරනකල්හිද කියනලද ක්‍රමයෙන් ලේඅඩුවී ගොස් පිටගැස්ම හෝ මරණය පැමිණියහැකි බව සැලකියයුතු.

ඒ එසේමැයි ශරීර මධ්‍යගත මේ මහා ධමනී නාහරදෙක කුඹුරක් මැදින් ගලාබසින කුනානදියක් (කුඩා ගඟක්) හා සමානයි. ඒ නාහර දෙකින් බෙදී වෙන්ව ශරීරය සෑම තන්හිම පැතිරී සිටියාවූ කුඩා මහත් ධමනී නාහර ගංගාවෙන් බෙදී වෙන්ව කුඹුර සෑම තන්හිම පැතිරීගිය කුඩා මහත් ඇලවල් හා සමානයි.

ඒ කුඩා මහත් ධමනී නාහරදිගේ ගමන්කරන ලෙයින් චර්ම මාංසාදි ඒ ඒ කොඨාස තෙමීයාම ඇලවල්දිගේ ගමන්කරන ජලයෙන් ඒ ඒ ලියදි තෙමීයාම හා සමානයි. නැවත නැවත මුවදොරින් ඇතුල්කරනලද ආහාරපානයන්ගේ රස ඔජසින් ජනිත ලෙයින් ශරීර මධ්‍යගත මහා ධමනී නාහරදෙක නැවත නැවත පිරීයාම කලින්කල ඇතිවන වැසි ජලයෙන් ගංගාව පිරීයාම හා සමානයි. සත්ත්වයන්ගේ ශරීරයෙහි අවස්ථාවශයෙන් එකතුවී නවතින සෘතුලේය හැර සතර ශරීරයෙහි ගමනා ගමනය නොකරන අන් ලෙයක් නම් නැත්තේය.

ගංගාවකට අසනන්න ආවාටවල ඒ ගංගා ජලය නිතර ඇතුල් වෙවී පිටවෙවී පවත්නාක්මෙන් හෘදය කොෂ කුහරයෙහි

ශරීර මධ්‍යගත මහා ධමනී නාහරයෙන් ලේ නිතර ඇතුල් වෙවී පිටවෙවී පවතින අන්දම සැලකියයුතු.

මේ ලේ ධාතුව බොහෝකොට නුමුහුකුරාගිය ලාරකත වර්ණයෙන්ද කිසි තැනක මුහුකුරාගිය ඝන රක්ත වර්ණයෙන්ද කිසි තැනක දුඹු උකුගතියෙන්ද යුක්තව පවත්නේය.

සටහන වනාහි ඒ ලේ පිහිටි ස්ථාන හා ලේ ධාතුවේ ආකාරයද සල්කා බැලීමෙන් දතහැකිවේ. පරිච්ඡේද වශයෙන් නිශ්‍රයස්ථානවූ නාහර ආදී වස්තූන්ගෙන්ම පිරිසිඳින ලද්දේය.—

මෙසේ මේ ලේනම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍යන්ත පරිච්ඡේදයෙන්ද අවශේෂ කොට්ඨාසයන් කෙරෙන් වෙන්වූ ආබන්ධනගතියෙන්යුත් එක්තරා අධ්‍යාත්මික ආපොධාතු මාත්‍රයකි.

### 5. සෙදො, (ඩහදිය.)

මේ වනාහි නිතර ශරීරයෙහි නොපවත්නාවූද ඇඟ වෙහෙසීම් ආදී කරුණක් ඇතිවූකල්හිම පහලවී එන්නාවූද ආපොධාතු කොට්ඨාසයකි.

වර්ණ සණ්ඨානාදීන්ගේ වශයෙන් සුප්‍රකටයි. ඇසින්ද දැකියහැක්කේය. අධ්‍යාත්මික බාහිර වශයෙන් කියයුතු වෙනසද හැරව විස්තරයෙහි කීනයින් දතයුතු.—

මෙසේ මේ ඩහදිය නම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍යන්ත පරිච්ඡේදයෙන්ද අවශේෂ කොට්ඨාසයන් කෙරෙන් වෙන්වූ ආබන්ධන ගතියෙන්යුත් එක්තරා අධ්‍යාත්මික ආපොධාතු මාත්‍රයකි.

### 6. මෙදො, (මේදතෙල.)

මේ මේදතෙල වනාහි කහපැහැයෙන් යුත් ආපොධාතු කොටසකි. සමහර ස්ථානයක තරමක් දියාරුගතියෙන් යුක්තවද පවතී. කෙට්ටු උදවියගේ ශරීරයෙහි කෙණ්ඩා ඇටයටත් නහරවලටත් අතරද කලවා ඇටයටත් නහරවලටත් අතරද කොඳුඇට පඞ්ක්තියටත් නහරවලටත් අතරද පිහිටි සිවි ආශ්‍රයෙන් මේදතෙල්මඬු පිහිටා පවතිත්. උදර වැටියෙහිද ආමාශයෙහිද අතුණුබහනෙහිද බහුලවශයෙන් පවතී. ස්ථූල උදවියගේ ශරීරයෙහි වනාහි කියනලද ස්ථානවල පමණක් නොව චර්මයටත් මාංසයටත් අතර දළඹු සිවි ආශ්‍රයෙන්ද පවතී. සණ්ඨාන වශයෙන් චර්මයටත් මාංසවලටත් අතර පිහිටි මේද තෙල්මඬු ඉතා

තුනියට කහ පැහැයෙන් යුත් වස්ත්‍රයකට බඳු සටහනින්ද සෙසු මේදතෙල් මඩු සමහරක් පැතලි ආකාර සටහනින්ද සමහරක් ගෝලාකාර සටහනින්ද සමහරක් දිග් පිඩු ආකාරයෙන්ද පිහිටා තිබෙත්.

මේ ආදී නොයෙක් සටහනින් යුක්තව පිහිටි මේදතෙල් මඩුවල ඒ ඒ සටහන් පිහිටිස්ථාන ගැන කල්පනාකිරීමෙන් දත හැක්කේය. පර්‍යන්ත පරිච්ඡේදයද පිහිටි ස්ථාන ගැනම කල්පනාකිරීමෙන් දතහැකිවේ.

මේ මේදතෙල ඝනභාවයෙන් තදවූ වස්තු කොට්ඨාසයක්වූවත් අව් ගිනි ආදී දැඩි උෂ්ණයක් වැදුණු කල්හි වහාම උණුවී දියාරුගතියට පෙරළෙන හෙයින් ආපොධාතුවෙහි ඇතුළත් කොට වදුරනලද්දේයයි සැලකියයුතු —

මෙසේ මේ මේදතෙල නම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍යන්ත පරිච්ඡේදයෙන්ද අවශේෂ කොට්ඨාසයන් කෙරෙන් වෙන්වූ අබන්ධන ගතියෙන්යුත් එක්තරා අධ්‍යාත්මික ආපොධාතු මාත්‍රයකි.

## 7. අස්සු, (කඳුළු.)

කඳුලුද ශරීරයෙහි නිතරම පවත්නා කොට්ඨාසයක් නොවේ. දුම්වැදීම් ආදී කාරණයක් ඇතිවූවිටකම පහළවන්නාවූ ආපොධාතු කොට්ඨාසයකි. වර්ණ සණ්ඨානාදීන්ගේ වශයෙන් සුප්‍රකටයි. ඇසින්ද දැකියහැක්කේය. අධ්‍යාත්මික බාහිර වශයෙන් කියයුතු වෙනසද සැරව විස්තරයෙහි කීනයින් දතයුතු. —

මෙසේ මේ කඳුලුනම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍යන්ත පරිච්ඡේදයෙන්ද අවශේෂ කොට්ඨාසයන් කෙරෙන් වෙන්වූ අබන්ධන ගතියෙන් යුත් එක්තරා අධ්‍යාත්මික ආපොධාතු මාත්‍රයකි.

## 8. වසා, (වුරුණුතෙල.)

මේ වනාහි අතුල් පතුල්වලද නාසිකාදීන්ගේ චර්මයෙහිද උපදින තෙලකි. ශිෂ්ණ චර්මයෙහිද මේ වුරුණුතෙල උපදිනබව සැලකියයුතු. වැඩි වශයෙන් ප්‍රකට කොට්ඨාසයක්ද නොවේ. සමහර කලක ඇතිව සමහර කලක නැතිවන ආපොධාතු කොටසක්දවේ. වර්ණසණ්ඨානාදීන්ගේ වශයෙන් සුප්‍රකටයි. ඇසින්ද දැකිය හැක්කේය, —

මෙසේ මේ වුරුණු තෙලනම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පර්‍යන්ත පරිච්ඡේදයෙන්ද අවශේෂ කොට්ඨාසයන් කෙරෙන් වෙන්වූ අබන්ධන ගතියෙන්යුත් එක්තරා අධ්‍යාත්මික ආපොධාතු මාත්‍රයකි.

### 9. ඛෙළො, (කෙල.)

මේ වනාහි මුඛයෙහි ඇතිවන ආපොධාතු කොටසකි. වර්ණ සණ්ඨානාදීන්ගේ වශයෙන් සුප්‍රකටයි. ඇසින්ද දැකිය හැක්කේය.——

මෙසේ මේ කෙලනම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පය්‍ර්‍යන්ත පරිච්ඡේදයෙන්ද අවශෙෂ කොඨාසයන් කෙරෙන් වෙන්වූ අබන්ධන ගතියෙන්යුත් එක්තරා අධ්‍යාත්මික ආපොධාතු මාත්‍රයකි.

### 10. සිඞ්ඝාණිකා, (සොටු.)

මේ වනාහි හිස් මොල දියවී කුණුවීමෙන් නාසිකාපුටයට බැස ගන්නාවූ ආපො කොඨාසයකි. වර්ණ සණ්ඨානාදීන්ගේ වශයෙන් සුප්‍රකටයි. ඇසින්ද දැකිය හැක්කේය ——

මෙසේ මේ සොටුනම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පය්‍ර්‍යන්ත පරිච්ඡේදයෙන්ද අවශෙෂ කොඨාසයන් කෙරෙන් වෙන්වූ අබන්ධන ගතියෙන්යුත් එක්තරා අධ්‍යාත්මික ආපොධාතු මාත්‍රයකි.

### 11. ලසිකා, (සඳමිඳුළු.)

මේ වනාහි ඒ ඒ ඇට අක්මුල් සම්බන්ධ සන්ධිස්ථාන නොරිදී නොගෙවී නමනු දිගඅරිනු පිණිස ශෙලෂ (මැලියම්) ලෙපයක්සේ ඉතා තුනීයට පිහිටි වස්තු කොටසකි.

වර්ණ වශයෙන් ශෙවතවර්ණයෙන් යුක්තවූ ආපොකොටසකි. සටහනින් සැරයටිකොණක ලෙපනයකරනලද සොටු ස්වල්පයකට බඳු සටහන් ඇත්තේය. සන්ධිස්ථානයන්හි පිහිටි හෙයින්ම මීට සඳමිදුලුයයි ව්‍යවහාර කරනු ලැබේ.

පය්‍ර්‍යන්ත පරිච්ඡෙදය සුගමයි. සඳමිදුලු ස්වල්ප වශයෙන් පිහිටි අයගේ සන්ධිපත් නැමීමේදී "කටකට"යන අනුකරණ ඇතිකරයි. ගමන්යාමේදී සන්ධි රුදැකරයි. දනාසන්ධිය ශීඝ්‍රව නැමියහැකිවෙයි. එහි වාතය ඇතිකරයි.——

මෙසේ මේ සඳමිදුලුනම් වර්ණයෙන්ද සටහනින්ද පිහිටි ස්ථානයෙන්ද පය්‍ර්‍යන්ත පරිච්ඡේදයෙන්ද අවශෙෂ කොඨාසයන් කෙරෙන් වෙන්වූ අබන්ධන ගතියෙන්යුත් එක්තරා අධ්‍යාත්මික ආපොධාතු මාත්‍රයකි.

### 12. මුත්තං, (මුත්‍ර.)

මේ වනාහි වැහීමෙන් වස්ති කොෂයෙහි එකතුවන ආපො කොඨාසයකි. වස්ති කොෂයද අතුණුබහනයයි කියන

ලද බඩවැල් දරණයට යටවී යටිබඩේ පිහිටා තිබේ. ඊට මූත්‍ර
ඇතුල්වීමට ඡිද්‍රයක් නැතත් එයින් මූත්‍ර පිටවීමට නම් ධමනි
නහර පසිප්පයක් පිහිටා තිබේ. ඒ ධමනි නහර පසිප්පයට
මූත්‍ර මාර්ගයයි ව්‍යවහාරකරනු ලැබේ.

ඉංග්‍රීසියෙන් Filter. (පිල්ටර්)යයි ව්‍යවහාරකරනලද ගල්
පෙරහනක් දියසැලියකදමා තැබූවිට යම්සේ එහි වැහීමෙන්
එකතුවී ජලය පිරෙසිද එපරිද්දෙන් මේ වසති කොෂයෙහි
වැහීමෙන් එකතුවී මූත්‍රපිරෙනබව සැලකියයුතු.

අනුභවකරනලද ආහාර වර්ග ආමාශයට පැමිණියායින්පසු
පාචකාග්නියෙන් පැසවනලදුව සප වෙන්වීමෙන් ඉතිරියූෂ
ගවරවලක ජලයමෙන් පැසි පැසී පෙණනගින්ට පටන්ගන්
නේය. ඒ නගින පෙණවල ඖදාරික කොටස සෙමට එකතු
වීමෙන් සෙම වැඩිදියුණුවීයනබව හා ඉතිරි සිනිඳු පෙණවල
රසඔජස පාචකාග්නි ජනිත වායුවෙගයෙන් පිඹහරිනලදුව
ආමාශයෙන් පිටතට වැහීමෙන් ඒඒ ශරීර ප්‍රදෙශයෙන් අවුත්
ආමාශයට වැද සිටි රස ගෙනයන්නාවූ නහරවලට ප්‍රවිෂ්ටව
සිරුර සැමතැනම පැතිරයමින් අඩුතැන් පූරව පූරවා ශරීරය
පොෂ්‍යයකරනබව දතයුතු.

ආමාශයේ පිටසම වනාහි පටල තුනකට බෙදී සැදීතිබේ.
එයින් පිටම පටලය තරමක් ඖදාරික සම් වැහැරි සරසට
ගෙතීමෙන්ද මැදපටලය තරමක මොළොක් මාංස සිවි එකි
නෙක දිග අතට මනා පිළිවෙළකට ගෙතීමෙන්ද ඇතුල්ම
පටලය ඉතා සියුම් සිනිඳු මාංස සිවි එකිනෙක තට්ටුවෙන්
තට්ටුව ගෙතීමෙන්ද සැදීතිබේ. මෙසේ පටල තුනකින් යුක්
තව ආමාශයේ පිටසම සැදීතිබෙනබව දතයුතු.

ඔජාවයයි කියනලද ආහාරරස පළමුකොට ඇතුල්පටලයටද
එයින් මැදපටලයටද නැවත එයින් පිටම පටලයටද වැහී
මෙන් රසාහරණී නම් නහරදිගේ ගොස් ක්ෂණයකින් ශරීර
යෙහි පැතිරයමින් ඒ පැතිරගිය සැමතන්හිම ලේ මස් ආදිය
පොෂ්‍යයකරනබව දතයුතු.

ඒ එසේමැයි ආහාර රසනම් ශීඝ්‍රව වැගෙන්නාවූද ශීඝ්‍රව පැ
තිරයන්නාවූද ජලය සමග මිශ්‍රවූවිට ජලය යටකොට තුමූ
මතුවී සිටින්නාවූද ධාතු කොටසකි. ලේ මස් පොෂ්‍යයකරන්
නාවූ ආහාර සොනහයන් නික්මගියායින්පසු ඉතිරි ඖදාරික
යූෂ හා සපත් පාචකාග්නි ජනිත වායුවෙගයෙන්ම පිඹහෙළ
නලදුව ආමාශයෙන් පහළට බැසයන්නාහුය.

එසේ බැස යන සප යූෂ දෙකොටසද පක්වාශයට පැමිණෙනතුරුම පාචකාග්නියෙන් පැසව පැසවා පැමිණෙන්නාහුය. ඒ පැසවීමෙන්ද සප යූෂ දෙකොටසෙන් පෙරීනික්මෙන ආපො කොටස පාචකාග්නි ජනිත වායුවෙගයෙන්ම පිඹහරිනලදුව බඩවැලෙන් පිටවී ගොස් වස්තිකොෂයට වැඟීමෙන් මූත්‍ර භාවයට පැමිණෙන්නේය. ඉතිරි සපවැඟීමට තරම් ආපොගතියක් නැතිව බඩවැලදීගේ ආකාශකුහරය බලාගොස් අධොමාර්ගයෙන් නික්මයනබව සැලකියයුතු.

අධොමාර්ගය දක්වා පැසව පැසවා ගෙන යනහෙයින්ම ආකාශකුහරය බලායන සපයෙන්ද බඩවැල් දරණ දශයක් එකොළොසක් පමණවනතුරු ආහාර ඔජ නික්මෙනබව දතයුතු. එයින් ඔබ්බෙහි වනාහි පාචකාග්නිය දුර්වලවීමෙන්ද නික්මීමට තරම් ඔජවක් නැතිවීමෙන්ද ඒ සපයෙන් නික්මෙන ඔජවක්ය කියා දෙයක් නැත්තේය.

එහෙත් ඒසප බලවත් පාචකාග්නියකින් පැසවනලද්දේවීනම් උවමනාතරම් ආහාර ස්නෙහ ලබාගතහැකිවේ. ඒ එසේමය. ඒ සප සුනඛ සූකරාදීන් විසින් අනුභවකරනලදුව ඔවුන්ගේ ආමාශයට පැමිණ පාචකාග්නියෙන් පැසවනලද්දේවීනම් එයින් නික්මෙන ආහාර ස්නෙහයෙන්ද ඒ සුනඛ සූකරාදීන්ගේ ශරීර පොෂ්‍යයවියහැක්කේය.

යට පෘථිවීධාතු **යෙවාපනක** නිර්දේශයෙහි දක්වනලද උණ්ඩුකමාංස ගඩුදෙකෙන් ධමනී නහරදෙකක් නික්ම අවුත් වස්තිකොෂය හා සම්බන්ධව පවත්නාහුය. ශරීර මධ්‍යගත මහා ධමනී නහරයෙන් උණ්ඩුක මාංස ගඩුකරා ගමන්කරන ලේ ඒ ධමනී නහරදීගේ වස්තිකොෂය කරාද පැමිණෙන්නාහුය.

ඒ ලේ වස්තිකොෂයට මඳ මඳ ඉනීමෙන් වස්තිකොෂයෙහි මූත්‍ර කහපාටවන්වත් රතුපාටවන්වත් පිළිවන. එසේම තුනටියෙහි ශීතියම්වාතය අධිකවීමෙන් උණ්ඩුක මස්ගඩුදෙක උණුවී එහි ඇතුළත තැළුණීනම් එයින්ද ලේ බොහෝකොට බැස අවුත් මූත්‍රකොෂයට වැඟීමෙන් සියලුම මූත්‍ර ලේවීයන්ට පිළිවන, උණ්ඩුක මස්ගඩුදෙකෙන් ලේ බැසරීම ප්‍රමාණයට වඩා අධිකවීනම් මරණයද පැමිණීය හැක්කේය.

මෙසේ වස්තිකොෂයට මූත්‍ර ඇතුල්වන අඳුමත් ඒ ඇතුල්වූ මූත්‍ර විපර්‍යාසවන අන්දමත් දතයුතු.

වර්ණ වශයෙන් අධ්‍යාත්මික මූත්‍රද බාහිර මූත්‍ර හා සමාන වර්ණ ඇත්තේය. සණ්ඨානය මූත්‍රාධාර වස්තිකොෂය ගැන සලකා

බැලීමෙන් දතහැකිවේ. ඒ වස්තිකොෂයද මුත්‍ර පිරීගියවිට තුන්පතක් පමණ ජලය පූරවනලද වට්වූ සිදුම් සම් පස්ය කට බඳු සටහන් ඇත්තේය. ප්‍රමාණයද එපමණක්ම වේ. පරිච්ඡෙද වශයෙන් මේ මුත්‍ර ස්වකීය කොෂපයඃීනතායෙන්ම පිරිසිඳි පිහිටාතිබේ.

මේ වනාහි ස්වරූපවශයෙන් වදූරනලද දෙළොස් වැදෑරුම් අධ්‍යාත්මික ආපො කොඨාසයෝයි.

මෙසේ විස්තරකරනලද දෙළොස් කොටසට ඇතුළත්නොවූ ආපො කොඨාසද මේ ශරීරයෙහි ඇත්තාහ. ඔව්හු කවරහුද? යත්. ක්ෂීර ශුක්‍රාදි ආපොකොඨාසයෝයි. එයින් ශුක්‍රකොඨාසය කායික සුවයට විශෙෂ කාරණවූ තුනටිය සිසාරා සිටි ධමනි නහරතුළ පිරී පවත්නේය. ඒ හැර සාමාන්‍යවශයෙන් ලේ ගමනාගමනයකරන සියලු ශරීරයෙහිද පැතිර පවත්නේය. මුත්‍රමාර්ගයට ආසන්න කලවා මුල්හිද අණ්ඩයෙහිද වස්තිකොෂයෙහිද ශුක්‍රධාතුව අතිශයින් අධිකව පවතිනබව සැලකියයුතු.

වර්ණවශයෙන් සමහර කාලෙක ශුක්‍ර ශ්වෙතවර්ණයෙන්ද සමහර කාලෙක රක්ත වර්ණයෙන්ද සමහර කාලෙක මාංසෙජ්‍යෂ්ට වර්ණයෙන්ද යුක්තවන්නේය. සටහන හා පරිච්ඡෙදයත් ශුක්‍ර පිහිටි ස්ථාන ගැන සලකා බැලීමෙන් දතහැකිවේ.

ක්ෂීරධාතුව ක්ෂීරාහරණීනම් ධමනි නහරතුළ පිරී පවත්නේය. සාමාන්‍යවශයෙන් ශුක්‍රධාතුවමෙන් සකල ශරීරයෙහිද පැතිර පවත්නේය. විශෙෂවශයෙන් පයොධරයන්හි අධිකව පවත්නේය.

උතුරුකුරුදිවයින් වැස්සන්ගේ අතේ මාපටගිල්ලෙන් දරුවන්ට කිරිපෙවීම චාරිත්‍රයක්ව පවතිනහෙයින් ඔවුන්ගේ අත්ලද ක්ෂීරයට විශෙෂ ආධාරස්ථානවන බැව් සැලකියයුතු. වර්ණ වශයෙන් අධ්‍යාත්මික කිරද පිටතට නික්ම ආවාවූ බාහිර කිරට බඳු වර්ණ ඇත්තේය. සටහන හා පරිච්ඡෙදයත් පිහිටි ස්ථාන ගැන සලකාබැලීමෙන් දතහැකිවේ. මේ ක්ෂීර ශුක්‍ර ධාතු දෙකොටස වනාහි ඉතා කුඩා කාලයෙහිද ශරීරයෙහි පවතින නමුත් පිහිටි ස්ථානයෙන් සෑලීමක් මිදීමක් නැතිහෙයින් ළදරු අයට විද්‍යමානබව පවා අප්‍රකටයි.

පුරුෂ ශරීරයෙහි ශුක්‍රධාතුව හා ස්ත්‍රී ශරීරයෙහි ක්ෂීරධාතුව අධිකව පවත්නේය.

මේ ආදීන් ස්වරූපවශයෙන් නොවදූරනලද ආපො කොඨාස සියල්ලක් "යෙවාපනක" නාමයෙහි සඞ්ග්‍රහවනබව දතයුතු.

මේ "යෙවා පනක" ආපො කොඨාසයෝයි.

මෙසේ කියනලද යෙවාපනක ආපොකොඨාසත් සමග අධ්‍යාත්මික ආපො කොඨාස දෙළොස පිත්ත කොඨාසයෙහි පටන් මූත්තකොඨාසය දක්වා අනුලොම වශයෙන්ද මූත්තකොඨාසයෙහි පටන් පිත්තකොඨාසය දක්වා ප්‍රතිලොම වශයෙන්ද වාචොද්ගතව පුහුණුවීම දක්වා මුවෙන් බිණීමෙන් පළමු කොට සජ්ඣායනා කටයුතු.

එසේ සජ්ඣායනාකිරීමෙන් වාචොද්ගතව පුහුණුවූවිට පිත් සෙම් ආදී ඒ ඒ කොඨාස යට කියනලද පරිද්දෙන් වර්ණය සණ්ඨානය පිහිටි ස්ථානය පරිච්ඡේදය යන සතරාකාරය සංඥාවෙන් හැඳින විඥානයෙන් දැන ඒ දැනගත් ඇඳිනගත් පරිද්දෙන් නුවණින් පැහැදිලිව පෙණීයනතුරු අනුලොම ප්‍රතිලොම වශයෙන් නැවත නැවත මෙනෙහිකටයුතු.

සතර දිනක්පස් දිනක් මෙනෙහිකරතු. එපමණකින් නොවැටහීනම් දසදිනක් පසළොස් දිනක් පමණ නමුත් සාමාන්‍ය වශයෙන් මෙනෙහිකටයුතු.

එසේ මෙනෙහිකරගෙන යනවිට ක්‍රමක්‍රමයෙන් අධ්‍යාත්මික ආපොකොඨාස කොයිවත් වර්ණසණ්ඨානාදීන්ගේ වශයෙන් වෙන වෙනම වැටහීයනවා ඇත.

නැවත ඝන නමැති හසනයෙන් බාහිර ගංගාජලය ස්වල්පයක්ද අධ්‍යාත්මික පිත්ජලය ස්වල්පයක්ද බඳුන් දෙකකට වෙන වෙනම ගෙන මෙසේ විශෙෂ වශයෙන්ද මෙනෙහිකටයුතු.

මේ බාහිර ගංගාජලයෙහි මමය කියා ගැනීමට කෙනෙක් නැත්තේය. මාසතුය කියා ගැනීමට දෙයක්ද නැත්තේය. හුදෙක් මේ බාහිර ජලය ආබන්ධන ලක්‍ෂණ ආපොධාතු මාත්‍රයක්මය. මේ අධ්‍යාත්මික පිත්ජලයද මමය කියා ගැනීමට කෙනෙක්ද නොවන්නේය. මාසතුය කියා ගැනීමට දෙයක්ද නොවන්නේය. හුදෙක් ආබන්ධන ලක්‍ෂණ ආපොධාතු මාත්‍රයක්මය. මේ අධ්‍යාත්මික පිතය බාහිර ජලය යන ආපොධාතු දෙවර්ගයමත් මමය කියා ගැනීමට කෙනෙක්ද නොවන්නේය. මාසතුය කියා ගැනීමට දෙයක්ද නොවන්නේය. හුදෙක් ආබන්ධන ලක්‍ෂණ ආපොධාතු මාත්‍රයක්මය.

මේ නයින්ම සෙම් සැරව ලේ ඩහදිය ආදී ඉතිරි ආපොකොටස් එකොළොසද වෙන වෙනම එක එක බැගින් ගෙන බාහිර ආපොයයි කියනලද ගංගාජලය හා සමව පෙණී වැටිහී යනතුරු සසඳා මෙනෙහිකටයුතු.

කලින්කල ඇතිවන්නාවූ සැරව ආදී අනියත ආපොකොටස් වූකලී ශරීරයෙහි විද්‍යමානව පවතිත්නම් මෙනෙහිකිරීම වටී නොපවතිත්නම් ඒ සඳහා උත්සාහගැනීම ප්‍රයොජනමදවේ.

තවද අධ්‍යාත්මික අපොකොට්ඨාස කලින්කල ඥාණ නමැති ආවුධයෙන් සිඳ බිඳ ඒ ඒ තැන දමා බැලීමෙන්ද කලින්කල එකට ගෙන බැලීමෙන්ද මෙනෙහිකටයුතු. බාහිර ජලය වෙනුවෙන් ගංගාජලයම නොව ඇල දොල ලිං පොකුණු ජලය ආදී සියලුම ජලය හා සමඟද සෙම් සැරව ලේ ආදී ඉතිරි ආපො කොට්ඨාසත් ගෙන සසඳාබලමින් මෙනෙහිකට යුතු.

මෙසේ පිත් සෙම් ආදී අධ්‍යාත්මික ආපොකොට්ඨාස ගංගා ඇල දොල ලිං පොකුණු ජලය ආදී බාහිර ජලය සමග සසඳා බලමින් මෙනෙහිකරගෙන යනවිට අධ්‍යාත්මිකය බාහිරය කියා වෙනසක් නොපෙණී පිත් සෙම් ආදී අධ්‍යාත්මික ආපොකොට්ඨාස සියල්ලම ගංගා ඇල දොල ලිං පොකුණු ජලය ආදී බාහිර ජලය හා සමානවම ශූනයට විශූනයට පෙණීයනවා ඇත. වැටහීයනවා ඇත. සිතේ ඇඳීයනවා ඇත. එසේ පෙණී වැටහී ඇඳීගියාධින්පසු ගංගා ඇල දොල ලිං පොකුණු ජලය ආදී බාහිර ආපොකොට්ඨාස කෙරෙහි මේ ගංගා ජලය මමය මාගේය. මේ ඇල ජලය මමය මාගේය. මේ දොල ජලය මමය මාගේය. මේ ලිං ජලය මමය මාගේය. මේ පොකුණුජලය මමය මාගේය කියා මෙසේ ගැනීමක් යම්සේ නොවන්නේද එපරිද්දෙන්ම පිත් සෙම් සැරව ලේ ඩහදිය ආදී අධ්‍යාත්මික ආපොකොට්ඨාස කෙරෙහිද මේ පිත මමය මාගේය. මේ සෙම මමය මාගේය. මේ සැරව මමය මාගේය. මේ ලේ මමය මාගේය. මේ ඩහදිය මමය මාගේය යනාදි වශයෙන් ගැනීමක්ද ඇතිනොවන්නේමය.

එසේ ගැනීමක් ඇතිනොවූවිට ගංගා ඇල දොල ලිං පොකුණු ආදියෙහි ජලය පානයකරන අය පානයකරමින් සනානය කරන අය සනානයකරමින් උණුකරන අය උණුකරමින් තම තමන්ට කැමතිවූ පරිද්දක් කළාට එයින් මේ ධාතුමනසකාරයෙන් යුක්ත සැදැහැවතුන්ට අහෝ! අහෝ!! මනුෂ්‍යයෝ අවුත් අප පානයකරත්. අප සනානයකරත්. අප උණුකරත් යයි මෙසේ මරහඬදීමක් වැළපීමක් යම්සේ නොවන්නේද. එපරිද්දෙන්ම පිත් සෙම් සැරව ලේ ඩහදිය ආදී අධ්‍යාත්මික ආපොකොටස් පානයකරන අය පානයකරමින් සනානයකරන අය සනානය කරමින් උණුකරන අය උණුකරමින් තම තමන්ට කැමති පරිද්දක් කළාට එයින් මේ ධාතුමනසකාරයෙන් යුක්ත සැදැහැවතුන්ට අහෝ! අහෝ!! මිනිස්සු අවුත් අප පානයකරත් අප සනානයකරත්. අහෝ! අහෝ!! මිනිස්සු අවුත් අප උණුකරත්යයි මෙසේ මරහඬදීමක් වැළපීමක් ඇතිනොවන්නේමය.

මෙසේ කියනලද පරිද්දෙන් පිත් සෙම් ආදී අධ්‍යාත්මික ආපොකොට්ඨාසද ගංගා ඇල දොළ ජලය ආදී බාහිර ආපොකොට්ඨාසද ආබන්ධනලක්ෂණමාත්‍රය මුත් මමය කියා කෙනෙක්ද මාසතුය කියා දෙයක්ද නොවන්නේමයයි පැහැදිලිව නුවණින් දැක ඒ පිත් සෙම් සැරව ලේ ආදී අධ්‍යාත්මික ආපොකොට්ඨාසයන්කෙරෙහි අනවරාග්‍ර සංසාරයෙහි පටන් පවත්වා ගෙන එනලද සත්කායදෘෂ්ටි නැමති අපායාග්නිබීජයන්ද තෘෂ්ණා නැමැති සංයොජනරැහැන්ද පහකිරීමෙන් කිසිකලෙකත් නොදිටුවිරූ පරමරමණීය ශාන්තප්‍රණීත විරාගපදය ප්‍රත්‍යක්ෂකරන්නාහුමය.

එහෙයින් උද්දෙශගාථායෙහි “නෙසො හමස්මි නෙතං මෙ එවං තත්ථ විරජ්ජති”යි කියනලදී.

“හත්ථතලෙ ඨපෙත්වාන, පෙක්ඛිත්වා ඤාණචක්ඛුනා
යථා ඉදං තථා එතං, යථා එතං තථා ඉදං
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච, ආපස්මිං වො විරජ්ජථ”.

සාධවෙ, සත්පුරුෂවරුනි ! වො, (සත්පුරුෂවූ) තෙපි; හත්ථතලෙ, අත්ලෙහි; ඨපෙත්වාන, (අධ්‍යාත්මික බාහිර ආපොධාතුවය ඤාණනැමති හස්තයෙන් ගෙන) තබා; ඉදං, මේ (පිත් සෙම් ආදී අධ්‍යාත්මික) ආපොධාතු සමූහය; යථා අහං න අස්මි, යම්සේ මම නොවෙම්ද; තථා, එපරිද්දෙන්; එතං, තෙල (ගංගා ඇල දොළ ජලය ආදී බාහිර)ආපොධාතු සමූහය; අහං න අස්මි, මම නොවෙමි; එතං, තෙල (ගංගා ඇල දොළ ජලය ආදී)බාහිර ආපොධාතු සමූහය; යථා අහං න අස්මි, යම්සේ මම නොවෙම්ද; තථා, එපරිද්දෙන්; ඉදං, මේ (පිත් සෙම් ආදී අධ්‍යාත්මික) ආපොධාතු සමූහය; අහං න අස්මි, මම නොවෙමි. ඉති, මෙසේ; ඤාණචක්ඛුනා, නුවණැසින්; පෙක්ඛිත්වා, බලා; අජ්ඣත්තඤ්ච ආපං, (පිත් සෙම් ආදී) අධ්‍යාත්මික ආපොධාතුසමූහය කෙරෙහිද; බහිද්ධඤ්ච ආපං, (ගංගා ඇල දොළ ජලය ආදී) බාහිර ආපොධාතුසමූහය කෙරෙහිද විරජ්ජථ, නොඇලෙව්.

**මෙතෙකින් ආපොධාතු නිර්දේශය නිමි.**

# III. තෙජෝධාතු නිර්දේශය.

මේ වනාහි බාහිර තෙජොය අධ්‍යාත්මික තෙජොයයි * දෙවැදෑරුම්වේ. එයින් බාහිර අප්‍රාණික සන්තානයෙහි කල්පවිනාශක ගින්න, නිරය ගින්න, ලැව් ගින්න, අකුණු ගින්න, ලොකාන්තරික නිරයෙහි පවතින දරුණු සිහිල් ගින්න, උතුරු දිග රටවල සහ හිමාලකඳුවලත් පවතින අධික සිහිල්ගින්න, ලක්දිව නුවරඑළිය පලාතේ සහ ශ්‍රීපාද අඩවියෙහිත් පවතින අධික සිහිල් ගින්න ආදී උෂ්ණලක්‍ෂණ ශීතලක්‍ෂණ සියලුම ගිනි බාහිර තෙජොධාතුහු නම්වෙත්

අධ්‍යාත්මික සන්තානයෙහි 1. උස්මාතෙජො, 2. පාචකතෙජො, 3. සන්තාපන තෙජො, 4. දාහතෙජො, 5. ජීරණතෙජො යන උෂ්ණලක්‍ෂණ ශීතලක්‍ෂණ තෙජො කොට්ඨාසයෝ පස්දෙන අධ්‍යාත්මික තෙජොධාතුහු නම්වෙත්.

මේ පඤ්චවිධ තෙජොධාතුකොට්ඨාසයන් උෂ්ණය ශීතය යන තමතමන්ට අයත් ලක්‍ෂණ වශයෙන්ද දැවීම තැවීම යන තමතමන්ට අයත් කෘත්‍යවශයෙන්ද පිහිටි ස්ථානවශයෙන්ද පිරිසිඳ දතයුතු.

### 1. උස්මාතෙජො, (උණුසුම් ගින්න )

මේ උස්මාගින්න ඇතුළත පිටත සැමතැනම පැතිරයමින්ද සියලුශරීරයම උණුහුම් කරවමින්ද දවන්නාවූ ගින්නකි. ශරීරයෙහි අතපතබා බැලූවිට අතට දැනෙන උණුහුම උස්මාගින්නායයි සැලකියයුතු. මේ උස්මාගින්න කිසිකලෙක ශරීරාවයවයන්ගේ පිටපැත්තෙහිද කිසිකලෙක මුළු ශරීරයේම පිටපැත්තෙහිද කිසිකලෙක හස්තපාදාග්‍රයන්හිද නිරුද්ධවීයනතේය. මුළුශරීරයෙහිම මේ උස්මාගින්න නිරුද්ධවීගියහොත් මරණයද පැමිණියහැක්කේය.

මෙසේ මේ උස්මාගින්නනම් ලක්‍ෂණවශයෙන්ද කෘත්‍යවශයෙන්ද පිහිටි ස්ථානවශයෙන්ද අවශෙෂ කොට්ඨාසයන්කෙරෙන් වෙන්වූ එක්තරා අධ්‍යාත්මික උණුසුම් ලක්‍ෂණ තෙජොධාතු මාත්‍රයකි.

### 2. පාචකතෙජො, (පැසවන ගින්න.)

මේ වනාහි සාමාන්‍යවශයෙන් ග්‍රීවාවාටයෙහි පටන් ගුදමාර්ගය දක්වා බඩවැල් කුහරයෙහිද ආමාශයයි කියනලද ආහාර

---

* තෙජො අග්ගි ගිනි වහ්නි යනාදිය ගින්නට නම්බව සැලකියයුතුයි.

බොක්කෙහිද අධිකවශයෙන් පවතිමින් කන බොන ලද ආහාරපානවශී පැසවන්නාවූද බඩවැල සහ එහි ප්‍රවිෂ්ටවන ආහාර ද්‍රව්‍යයන් නිතර දවන්නාවූද උෂ්ණ ගින්නකි.

සමහර කලෙක මේ පාචක ගින්න ආමාශයෙහි පමණක් ශෙෂව ඉතිරි බඩවැල් කුහරයෙහි නිරුද්ධව නැතිවීයනබව දතයුතු. ආමාශයෙහිත් මේ පාචක ගින්න නිරුද්ධව නැතිවී ගියහොත් මරණය පැමිණිය හැකිබව සැලකියයුතු.

කුසගත ගින්නක් බැවින් මිට මනුෂ්‍යයෝ බඩගින්න කියාද **ජඨරාගනිය** කියාද ව්‍යවහාරකරති.

මෙසේ මේ පාචක ගින්න නම් ලක්‍ෂණවශයෙන්ද කෘත්‍යවශයෙන්ද පිහිටි ස්ථානවශයෙන්ද අවශෙෂ කොඨාසයන් කෙරෙන් වෙන්වූ එක්තරා අධ්‍යාත්මික උෂ්ණලක්‍ෂණ තෙජොධාතු මාත්‍රයකි.

### 3. සන්තාපනතෙජො, (දූඹිසේ තවන ගින්න).

මේ වනාහි උස්මාගින්නයයි කියනලද ප්‍රකෘති උෂ්ණත්වමට වඩා දියුණු තියුණුවූ ගිනි විශෙෂයකි.

මාන්දන් උණ, ග්‍රහණී උණ, සන්නිපාත උණ, මුර උණ, ඇඟදැවිල්ල, ඇස්දැවිල්ල, බඩදැවිල්ල, ශරීරදැවිල්ල, ඊයම්පට් අසඩක්‍රමණයෙන් හටගන්නාවූ උෂ්ණ, දෙඅත්ල එකට ගැටීමෙන් හටගන්නාවූ උෂ්ණ, තමාගේ හෝ අනුන්ගේ උපක්‍රමයෙන් හටගන්නාවූ උෂ්ණ, සූය්‍ය්‍යරශ්මි ස්පර්ශයෙන් හටගන්නාවූ උෂ්ණ, ගිනිස්පර්ශයෙන් හටගන්නාවූ උෂ්ණ, ගුණයෙන් වයසින් වැඩිහිටියවුන් කෙරෙහි වරදවා හැසිරීමෙන් හටගන්නාවූ උෂ්ණ, ඥාතිව්‍යසනාදියෙන් ස්පර්ශකරනලදුව හටගන්නාවූ උෂ්ණ මේ ආදී වශයෙන් ව්‍යවහාරකරනලද උෂ්ණත්වගති සියල්ලක් "සංහුසංතාපෙතීති සන්තාපනො" යනු විග්‍රහාර්ථ හෙයින් සන්තාපන ගින්න නම්වේ. එහි අර්ථ:-(යො තෙජො, යම් තෙජොගින්නක්තෙමේ) සංහුසං, (ප්‍රකෘති උස්මාගින්නට වඩා) දූඹිසේ; තාපෙති, තවයිද; ඉති, එහෙයින්; සො තෙජො, ඒ තෙජොගින්නතෙමේ සන්තාපනො, සන්තාපනම්වේ.

මේ සන්තාපනගින්න වනාහි ශරීරයෙහි නොයෙක් රෝදුක් වෙදනා උපදවමින් සත්වයාට නොයෙක් අනදමින් පීඩාකරණ ගින්නකි. එසේම කිසිකලෙක සකල ශරීරයෙහිද කිසිකලෙක ඒ ඒ ශරීරාවයවයන්හිද පැතිරයමින් සම් මස් ආදිය දවා හලූ කරන්නාවූ ගින්නක්ද වේ.

මෙසේ මේ සන්තාපන ගින්න නම් ලක්‍ෂණවශයෙන්ද කෘත්‍ය වශයෙන්ද පිහිටි ස්ථානවශයෙන්ද අවශෙෂ කොඨාසයන් කෙරෙන් වෙන්වූ එක්තරා අධ්‍යාත්මික උෂ්ණ ලක්‍ෂණවූ තෙජොධාතු මාත්‍රයක්මය.

## 4. දහතෙජො, (දවන ගින්න.)

සන්තාපන ගින්නට වඩා දිගුණු තිගුණුව ඔබ්මොබ හැරෙමින් පෙරළෙමින් කෙඳිරිය ඇතිවන තරම් දවන ගින්නය. මරහඬදිදී හඬනතරම් දවන ගින්නය. මරණසන්නාවන තරම් දවන ගින්නය. මරණයට පැමිණෙන තරම් දවන ගින්නය යන ආදී උෂ්ණලක්ෂණ ගිනිය, එසේම ශරීරයෙහි ප්‍රකෘති ශීතලට වඩා දිගුණු තිගුණුව අතපය හිරිවැටෙන තරම් ශීතළුපදවා දවන ගින්නය. වෙව්ලන තරම් ශීතළුපදවා දවන ගින්නය. හිරිවාත සන්නිරෙගාදිය ඇතිවනතරම් ශීතළුපදවා දවන ගින්නය. වෙව්ලන උණ ඇතිවනතරම් ශීතළුපදවා දවන ගින්නය. ශීතසෘතුව පැමිණීමෙන් ශීත උපදවා දවන ගින්නය කඳුකර වනප්‍රදෙශවලට පැමිණි කල්හි ශීතළුපදවා දවන ගින්නය. ශීත සෘතුවල සනානය කළකල්හි ශීතළුපදවා දවන ගින්නය. පවන්සැලීම් ආදියෙන් ශීතළුපදවා දවන ගින්නය. ගුණයෙන් වයසින් වැඩිසිටිය වුන්ට වරදවා ගටා බිණීම් ආදියකළකල්හි ශීතළුපදවා දවන ගින්නය. වෙෂය හෙතුකොටගෙන සකල ශරීරයෙහි ශීත උපදවා දවන ගින්නය ඔබ්මොබ පෙරලි පෙරලී කෙඳිරිය ඇතිවන තරම් ශීතළුපදවා දවන ගින්නය. මොරගසමින් හඬනතරම් ශීතළුපදවා දවන ගින්නය. මරණසන්නාවන තරම් ශීත උපදවා දවන ගින්නය. මරණයට පැමිණෙනතරම් ශීත උපදවා දවන ගින්නය. අධික දැවීමක් හෝ ශීතලක් නැතත් දද පණුකැවිලි කුෂට අළුහත් අණ්ඩවායු ඝොර බරවා ආදී රොග ඇතිකොට අනුක්‍රමයෙන් නොදැනුවැත්තේම සම් මස් ආදිය දව දවා සුණුවිසුණුකරනතරම් දවන ගින්නය යන ආදී ශීත ලක්ෂණ ගිනිය මෙසේ කියනලද ගිනි සියල්ලක්ම "දහති පරිදහතිති දහො" යනු විග්‍රහාර්ථ හෙයින් දහ ගිනියයි ව්‍යවහාරකරනුලැබේ.

එහි අර්ථ යො තෙජො, යම් ගින්නක්තෙමේ; දහතිපරිදහති, තිගුණු අන්දමින් දවයිද; ඉති, එහෙයින්; සො තෙජො, ඒ ගින්නතෙමේ; දහො, දහගින්න නම්වේ.

මේ දහගින්න පමණක්නොව කොටි කොටි ගිනිත් ස්වකීය ශක්තියේ තරමට දවන ගිනිමය.

එතකුදුවුවත් දහගින්නම දැවීම් කෘත්‍යයෙන් ඉතා ප්‍රකට හෙයින් මෙසේ'දහ'යන නාමයෙන් වෙනස්කොට වදාරනලදී.

භෙද උෂ්ණ ගින්නය ශීත ගින්නයයි දෙවැදෑරුම්වේ.

ඒ ගිනි දෙවගීයද සත්වයන්ට නොයෙක් දුක් දෙම්නස් රෝග පීඩා උපදවා මරණාසන්නාවනතරම් දවන්නාවූ ගිනි මය. උෂ්ණ දාහ ගින්න කිසිකලෙක සකල ශරීරයෙහිද කිසි කලෙක ශරීරාවයවයන්හිද පැතිරයමින් දවනබව හා කිසි කලෙක සකල ශරීරයෙන්ම නිරුද්ධවීයනබවත් දතයුතු.

ශීත ගින්න වනාහි සැමකල්හිම ඇතිව පවත්නා ගින්නක් නොවේ, ශරීරාවයවයන්හි මුත් සකල ශරීරයෙහිම පැතිර යන්නාවූ ගින්නක්ද නොවේ.

ඒ එසේමය. ශීතගින්න සකල ශරීරයෙහිම පැතිරගිය හොත් උස්මාගින්න හා පාචකගින්නත් සහමුලින්ම නිරුද්ධවී යන්නේය. එසේ උස්මා ගින්න හා පාචකගින්නත් නිරුද්ධවී යාමෙන් සත්වයන්ගේ ස්කන්ධපඤ්චකය බාහිර ඍතුජ භාවයට පැමිණිය හැක්කේය.

එහෙයින් භාග්‍යවත්වූ බුදුරජාණන්වහන්සේ විසින් ඛන්ධ වග්ගසංයුත්තකාඵේණපිණ්ඩූපම සූත්‍රයෙහි—

“ආයූ උස්මා ච විඤ්ඤාණං, යදා කායං ජහන්තිමං
අපවිද්ධො තදා සෙති, පරභත්තං අචෙතනං” යිවදාරනලදී.

අර්ථ:- භික්ඛවෙ, මහණෙනි! ආයූච, ජීවිතයද; උස්මාච, (ශාරීරික ප්‍රකෘති) උණුසුමද; විඤ්ඤාණඤ්ච, විඥානයද යන; ඉමෙතයො, මේ ධර්මයෝ තිදෙන; යදා, යම්කලෙක්හි; ඉමං කායං,(පෘථිවී ආපො සඞ්ඛ්‍යාත)මේ ධාතුසමූහය; ජහන්ති, හැර යද්ද; තදා, එකල්හි; අපවිද්ධො, (සොහොන්භූමියෙහි නිරපෙක්ෂකව) දමනලද්දේ; සෙති, ශයනයකරන්නේය; අචෙතනං, (ආයූහන) චෙතනා රහිතවූයේ; පරභත්තං, සොනශෘගාලාදී අන්‍ය සත්වයන්ට භක්ත භොජනවූයේ; සෙති, ශයනයකරන් නේය.—

මෙසේ විස්තරකරනලද දාහගින්නනම් ලක්ෂණවශයෙන්ද කෘත්‍යවශයෙන්ද පිහිටි ස්ථානවශයෙන්ද අවශෙෂ කොට්ඨාස යන් කෙරෙන් වෙන්වූ එක්තරා අධ්‍යාත්මික ශීතොෂ්ණ ලක්ෂණ තෙජෝධාතු මාත්‍රයකි.

## 6. ජීරණතෙජො, (දිරවන ගින්න.)

යට කියා නිමවනලද සිව්වැදෑරුම් ගිනිද එයින් පිටත් ශරීර යෙහි පවත්නා සියලුම උණුගති හා සිහිල්ගතිද උණු සිහිල් ගති පවා නොදැනෙනතරම් අතිශයින් සියුම් ආකාරයෙන් දවන්නාවූ ශීතොෂ්ණගතිද යන මේ ගිනි සියල්ලක්ම තම තමන් විසින් ඇවිලගන්නාලද පෘථිවි ආපොධාතු දෙවගීය

සත්වයා ළදරුකාලයෙහි පටන් දවසින් දවස වෙනස්කරමින් මුහුකරවා දිරවා හරින්නාවූ ජීරණ ශක්තිය ඇතිහෙයින් ජීරණ ගින්නයයි කියනුලැබේ.

මේ ජීරණගින්නෙහි ලක්ෂණය කෘත්‍යය පිහිටි ස්ථානය යන සියල්ලම සුගමයි.

### මේ පස්වැදෑරුම් අධ්‍යාත්මිකතෙජොකොට්ඨාසයෝයි.

මේ පඤ්චවිධ අධ්‍යාත්මික තෙජෝධාතූන් සම්බන්ධ උෂ්ණ ශීතලක්ෂණ හා දැවීම් තැවීම් කෘත්‍යයන්ද ඇවිලගන්නාලද ස්ථානයන්ද යහපත්සේ දැන ඉගෙන එම තෙජෝධාතු පඤ්චකය බාහිර තෙජෝධාතූන් හා සසඳාබැලීමෙන් මෙනෙහිකට යුතු. කෙසේද?යත්. මේ අධ්‍යාත්මික තෙජෝධාතූහුතුමූ අවස්ථා කෘත්‍ය ස්ථාන හෙතූන්ගේ වශයෙන් යට කියනලද පරිදි පස් වැදෑරුම්වූ නමුත් උෂ්ණ ශීත යන ලක්ෂණවශයෙන් විප්‍රභෙදමයයි දතයුතු. එසේ දැන රත්කරනලද්දාවූ බාහිර ලොහොගුලියක් හා ලොහොදිය ස්වල්පයක්ද එසේම උෂ්ණලක්ෂණයෙන් යුත් අධ්‍යාත්මික හෘදයමාංස පිණ්ඩය හා ශරීර මධ්‍යගත මහා ධමනී නහරයෙන් ලේ ස්වල්පයක්ද ගෙන වෙන වෙනම තබා පලමුකොට බාහිර ලොහොගුලිය හා ලොහොදිය ස්වල්පයද නැවත අධ්‍යාත්මික හෘදයමාංස පිණ්ඩය සහ ශරීර මධ්‍යගත මහා ධමනී නහරයෙන් ගත්නාලද ලේ ස්වල්පයද යම් අත්දමකින් විමසාබලතහොත් ඒ අධ්‍යාත්මික බාහිර උණුසුම්ගතිවල වෙනසක් නැතිබව දතහැකිවේමය.

එසේ දැනගන්නාලද අධ්‍යාත්මික බාහිර තෙජෝධාතු දෙකොටස එක ධාතුවක්වශයෙන් අවෙනස්ව පෙණීයාමෙන් බාහිර ලොහොගුලි ලොහොදිය දෙකොටසෙහි ඇවිලීපවත්නා තෙජොගින්නෙහි මමයකියා ගැනීමට පුද්ගලයෙක් නැත්තේ යම්සේද මාසතුය කියා ගැනීමට දෙයක් නැත්තේ යම්සේද හුදෙක් උෂ්ණ ලක්ෂණය හා දහනකෘත්‍යය ඇත්තාවූ තෙජෝධාතුමාත්‍රයක්ම වන්නේ යම්සේද එපරිද්දෙන් අධ්‍යාත්මික හෘදයමාංස පිණ්ඩයෙහි සහ ශරීර මධ්‍යගත මහා ධමනී නහරයෙන් ගත්නාලද රුහිරයෙහිත් ඇවිලී පවත්නා තෙජොගින්නෙහි මමය කියා ගැනීමට කෙනෙක් නැත්තේමය, මාසතුය කියා ගැනීමට දෙයක්ද නැත්තේමය.

හුදෙක් උෂ්ණ ලක්ෂණය හා දහනකෘත්‍යයක් ඇත්තාවූ තෙජෝධාතු මාත්‍රයක්ම වන්නේය.

මේ අධ්‍යාත්මික බාහිර තෙජෝධාතු දෙකොටසෙහිමත් මමය කියා ගැනීමට කෙනෙක් නැත්තේමය, මාසතුය කියා ගැනීමට දෙයක්ද .නැත්තේමය.

හුදෙක් උෂ්ණ ලක්‍ෂණය හා දහනකෘත්‍යයක් ඇත්තාවූ තෙජොධාතු මාත්‍රයක්මවන්නේය.

ඒ එසේමැයි, මේ අධ්‍යාත්මික බාහිර තෙජොකොඨාසදෙක්හි ද්‍රව්‍යභාවයෙන් පෙණීයන පූඤ්ජනම් පෘථිවි ආපොධාතුමාත්‍රයකි. එහි දිලිසෙමින් පෙණීයන්නාවූ මේ රත්පැහැයනම් වර්ණධාතු මාත්‍රයකි, ඒ පෘථිවි ආපොධාතුදෙක්හි ඇවිලී පවත්නාවූ මේ උෂ්ණසුම් ලක්‍ෂණයම ඒකාන්තයෙන් තෙජොධාතු නම් වන්නේය.

මෙසේ මේ අධ්‍යාත්මික බාහිර තෙජොධාතු දෙකොට්සෙහිම මමය කියා ගැනීමට කෙනෙක්වත් මාසතුය කියා ගැනීමට දෙයක්වත් නැතිබව දතයුතු.

මෙසේ කියනලද නයින් අධ්‍යාත්මික හෘදයමාංස පිණ්ඩයෙහි ඇවිලීපවත්නාවූ තෙජොධාතුව බාහිර තෙජොධාතුව හා සමව පෙණීයනතුරු නිතරම මෙනෙහිකටයුතු

මේ නයින්ම අවශෙෂ අධ්‍යාත්මික තෙජොකොඨාසද උදුරඋදුරා බාහිර තෙජොධාතුන් හා සසඳාබැලීමෙන් මෙනෙහිකටයුතු.

බාහිර තෙජොධාතූන් වෙනුවෙන්ද රත්කරනලද ලොහොගුලි ලොහොදිය පමණක්නොව උෂ්ණදිය ලිප්ගිනි ලැව්ගිනි ලොහොකුඹු නිරයගිනි අවීචිනිරයගිනි ආදී ගිනිකොඨාසයන්ද උපුටාගැනීමෙන් සසඳාබැලියයුතු.

එසේම ශරීරයෙහි ශීත තෙජොධාතුව පහළවූකල්හි ඒශීත තෙජොධාතුව අයිස් පිනි ආදී බාහිර ශීත තෙජොධාතූන් හා සසඳාබැලීමෙන්ද මෙනෙහිකටයුතු.

මෙහි උෂ්ණ ලක්‍ෂණය අතැන ශීතලක්‍ෂණය ඇතුළත්කොට ගැනීමම වෙනසී.

මෙසේ නැවත නැවත මෙනෙහිකරගෙන යනකල්හි උෂ්ණලක්‍ෂණයෙන් හා ශීත ලක්‍ෂණයෙන් යුත් අධ්‍යාත්මික තෙජොකොඨාසයන් හා බාහිර තෙජොකොඨාසයන්ද එකම ධාතුලක්‍ෂණයක් වශයෙන් පෙණීයනවා ඇත.

එසේ පෙණීගියකල්හි බාහිරතෙජොකොඨාසයන්කෙරෙහි මමය මාගේය කියා ගැනීමක් නැත්තේ යම්සේද එපරිද්දෙන් අධ්‍යාත්මික තෙජොකොඨාසයන් කෙරෙහිද මමය මාගේය කියා ගැනීමක් ඇතිනොවන්නේමය.

අධ්‍යාත්මික තෙජොකොට්ඨාසයන් කෙරෙහි මමය මාගේය කියා ගැනීම පහවීගියකල්හි බාහිර තෙජොධාතුන්ට මනුෂ්‍යයෝ අවුත් කෙතරම් ආක්‍රොෂ කෙළේවීනමුදු බැණවැදුනේවී නමුදු කෙතරම් දඬුවම්කළේවීනමුදු ඒ වෙනුවෙන් මේ ධාතු මනස්කාරයෙන් යුත් සැදැහැවතුන්ට අහෝ ! අහෝ !! ගම්වාසීහු අවුත් අපට ආක්‍රොෂකරත්. අහෝ ! අහෝ !! ගම්වාසීහු අවුත් අපට දඬුවම්කරත්යයි මෙසේ මොරගැසීමක් වැළපීමක් යම්සේ ඇතිනොවන්නේද එපරිද්දෙන් අධ්‍යාත්මික තෙජොධාතුන්ට මනුෂ්‍යයෝ අවුත් කෙතරම් බැණවැදුනේවී නමුත් කෙතරම් දඬුවම්කළේවී නමුත් ඒ ආක්‍රොෂය හා දඬුවම්කිරීම හෙතුකොටගෙන මේ ධාතුමනස්කාරයෙන් යුත් සැදැහැවතුන්ට ඒ වෙනුවෙන් මොරගැසීමක් හැඬීමක් වැළපීමක් ඇති නොවන්නේමය.

මෙසේ නැවත නැවත මෙනෙහිකිරීමෙන් බාහිර තෙජොකොට්ඨාසයන් හා අධ්‍යාත්මික තෙජො කොට්ඨාසයන්ද ලක්‍ෂණ වශයෙන් උෂ්ණ ලක්‍ෂණවූ තෙජොධාතුමාත්‍රයක්මයයි පැහැදිලිව පෙණීගියාවූ සත්පුරුෂයෝ වනාහි අනවරාග්‍රසංසාරයෙහි පටන් මමය මාගේය කියවමින් පැවත එන්නාවූ ආත්ම දෘෂ්ටිය හා ආත්මීය තෘෂ්ණාවද පහකිරීමෙන් පරමරමණීය ශාන්ත විරාගපදය ප්‍රත්‍යක්‍ෂ කරන්නාහුමය.

එහෙයින් උද්දෙශගාථායෙහි "නෙසො හමස්මි නෙතං මෙ එවං තත්‍ථ විරජ්ජති"යි කියනලදී.

"හත්‍ථතාලෙ ඨපෙත්වාන, පෙක්ඛිත්වා ඤාණචක්ඛුනා
යථා ඉදං තථා එතං, යථා එතං තථා ඉදං
අජ්ඣත්තඤ්ච බහිද්ධාච, තෙජස්මිං වො විරජ්ජථ"

සාධවෙ, සත්පුරුෂවරුනි ! වො, සත්පුරුෂවූ තෙපි; හත්‍ථතලෙ, අත්ලෙහි; ඨපෙත්වාන, (අධ්‍යාත්මික බාහිර තෙජොධාතුවය ඤාණනමැති හස්තයෙන් ගෙන) තබා; ඉදං, මේ (උස්මා පාචක ආදි)අධ්‍යාත්මික තෙජොධාතු සමූහය; යථාඅහං න අස්මි, යම්සේ මම නොවෙම්ද; තථා, එපරිද්දෙන්; එතං, තෙල (ලොහොදිය ලොහොගුලි ආදි බාහිර) තෙජොධාතු සමූහයද; අහං න අස්මි, මම නොවෙමි; එතා, තෙල (ලොහොගුලි ලොහොදිය ආදි බාහිර)තෙජොධාතු සමූහය; යථා අහං න අස්මි, යම්සේ මම නොවෙම්ද; තථා, එපරිද්දෙන්; ඉදං, මේ(උස්මා පාචක ආදී අධ්‍යාත්මික) තෙජොධාතු සමූහය; අහං න අස්මි, මම නොවෙමි; ඉති, මෙසේ; ඤාණචක්ඛුනා, නුවණැසින්; පෙක්ඛිත්වා, බලා; අජ්ඣත්තඤ්ච තෙජස්මිං, (උස්මා

පාචක ආදී) අධ්‍යාත්මික තෙජොධාතු සමූහය කෙරෙහිද; බහිඩා තෙජස්හිං, (ලොහොදිය ලොහොගුලි ආදී) බාහිර තෙජොධාතුසමූහය කෙරෙහිද; විරජ්ජථ, නොඇලෙව්.

**මෙතෙකින් තෙජොධාතු නිර්දේශය නිමි.**

---

## IV. වායොධාතු නිර්දේශය.

වායොධාතුතොමෝද අධ්‍යාත්මික වායොධාතුය බාහිර වායොධාතුය කියා දෙවැදෑරුම්. එයින් උඩ අජවාකාශයෙහි ඔබ්මොබ හමන්නාවූ වාතය, යට අජවාකාශයෙහි ඔබ්මොබ හමන්නාවූ වාතය, කල්පවිනාශක වාතය, වෙරම්භ වාතය, අරණ්‍යවෘක්ෂ ශාඛාදිය කම්පාකරවමින් හමන්නාවූ වාතය, ඔරු පාරු නැව් හම්බන් ආදිය යාත්‍රාකරවන වාතය, උමග ගුහා ආදී අවකාශ කුහරගත වාතය, පක්ෂීන්ගේ පියාපත් වාතය, විජිනිපත් වාතය මේ ආදී සියලුම විස්තම්භන සමීරණ ලක්ෂණ වාතයෝතුමූ බාහිර වායෝධාතුහු නම්වෙත්.

සත්වසන්තානයෙහි 1. ආශ්වාස ප්‍රාශ්වාස වාතය, 2. ඌර්ධ්වඞ්ගම වාතය, 3. අධොගම වාතය, 4. කුච්ජිසය වාතය, 5. කොඨ්ඨසය වාතය, 6. අඞ්ගමඞ්ගානුසාරීවාතය යන සවැදෑරුම් වාතයෝතුමූ අධ්‍යාත්මික වායොධාතුහු නම්වෙත්.

මෙහි ආශ්වාස ප්‍රාශ්වාස වාතයනම් ඉහළ පහළ හෙළන නාසිකාවාතයයි, ඌර්ධ්වඞ්ගම වාතයනම් කුක්ෂියෙන් පටන්ගෙන උඩට නැඟී ඉහළ සිදුරුවලින් නික්මෙන වාතයයි, අධොගම වාතයනම්, කුක්ෂියෙන් පටන්ගෙන පහළට බැස යට සිදුරුවලින් නික්මෙන වාතයයි, කොඨ්ඨසය වාතයනම් බඩවැල ඇතුළේ පවත්නා වාතයයි, කුච්ජිසය වාතයනම් බඩවැලෙන් පිට හෘදයකුහර කුක්ෂිකුහර දෙක්හි පවත්නා වාතයයි. අඞ්ගමඞ්ගානුසාරී වාතයනම් අත්පය ආදී ඒ ඒ කායාඞ්ග අනුව ගමනාගමනයකරන වාතයයි.

මෙසේ කියනලද සවැදෑරුම් වායොධාතුන්ගේ ලක්ෂණය නම් පෘථිවි ආපොධාතුවය පොපියවා (පුම්බවා) ලීමයි.

මේ සවැදෑරුම් අධ්‍යාත්මික වායොධාතුන් අතුරෙන් යම්කලෙක කුච්ජිසය වාතය කුපිතව විපරීතවේද එකල කුක්ෂිගර්භ හෘදයගර්භ දෙකට අතර(පිරිසිඳ) සිටි දලබුසිවිය පූපූරායාමෙන් මරණය පවා පැමිණීයහැක්කේය. එසේ දලබුසිවිය පූපූරා මරණය පැමිණියත් හෘදය පැලීමළේයයි ව්‍යවහාරකරනුලැබේ. හෘදයගර්භ කුක්ෂිගර්භ පැලෙනතරමට කුච්ජිසය වාතය තීව්‍රණුවූ

කල්හි ඊට "සඞ්ක" වාතයයි ව්‍යවහාරකරනබව දතයුතු. අඞ්ගමඞ්ගානුසාරි වාතය යම්කලෙක කුපිතව විපරීතවේද එකල ඔලුව අතපය ඇස් කන් නාසා ආදී කායාඞ්ගයන්හි නහර සිඳියාම නහර ගැටගැසීම් ඔලුව පිටිඅතට හැරීම බෙල්ල ඇද වීම අතපය අප්‍රාණිකවීම කොරවීම ඇස් වපරවීම ආදී නානා රෝග හටගතහැක්කේය.

එසේ කියනලද රොග ඇතිවනතරමට අඞ්ගමඞ්ගානුසාරී වාතය තියුණුවූකල්හි ඊට "ඛුරක" වාතයයි ව්‍යවහාරකරනු ලැබේ.

මෙසේ කියනලද අධ්‍යාත්මික වාතය පෘථිවි අපොධාතුවය පොපියවීම් (පුම්බවීම්) කෘත්‍යයෙන හා සැලීම් ලක්‍ෂණයෙන් එකත්වයට පැමිණෙන නමුත් කෘත්‍ය ස්ථාන හෙතුන්ගේ ප්‍රභෙදයෙන් සයවැදෑරුම් වන්නේය.

මේ බාහිර වායොධාතුත් හා අධ්‍යාත්මික වායොධාතුත්ද එකිනෙක සසඳාබැලීමෙන් මෙසෙ නොහි තටයුතු.

කෙසේද? යත්. බාහිර මයිනහමේ නළයෙන් පිටවෙන වාතයෙහි සමීරණ(සැලීම්)ලක්‍ෂණ මාත්‍රයමුත් මමය කියා ගැනීමට කෙනෙක් හෝ මාසතුය කියා ගැනීමට දෙයක් නැත්තේ යම්සේද එපරිද්දෙන් අධ්‍යාත්මික නාසිකාවාතයෙහිද සමීරණ ලක්‍ෂණමාත්‍රයමුත් මමය කියා ගැනීමට කෙනෙක් හෝ මාසතුය කියා ගැනීමට දෙයක්ද නැත්තේමය.

අධ්‍යාත්මික බාහිර වාතවයෙහිමත් සමීරණ ලක්‍ෂණ මාත්‍රයමුත් මමය කියා ගැනීමට කෙනෙක් හෝ මාසතුය කියා ගැනීමට දෙයක්ද නැත්තේමය.

මෙසේ අධ්‍යාත්මික ආශ්වාසප්‍රාශ්වාස වායොධාතුව බාහිර මයිනහමේ නළයෙන් පිටවෙන වායොධාතුව හා කිසි වෙනසක් නැතිව එකම සැලීම් ලක්‍ෂණයෙන් පෙණියනාතුරු නැවත නැවත මෙනෙහිකටයුතු. කුච්ජිසය වාතය සහ කොඨසය වාතයත් දියේ දමා දෙකොණින් ගෙන මිරිකනලද ඝන වස්ත්‍රයක තැනින්තැන පිරී පිපීසිටි සුළඟ හා උපමාකර බැලීමෙන් මෙනෙහිකටයුතු.

ඌර්ධ්වඞ්ගම අධොගම වාතවය යනු බොයිලේරුවල ඉහළින් පහළින් පිටවෙන සුළඟහා උපමාකර මෙනෙහිකටයුතු.

අතුපතරින් යුක්තවූ වෘක්‍ෂයක් වූකලී පෘථිවි ආපො ආදි ධාතු රූසක් බැවින් ස්වශක්තියෙන් නොසෙලවියහැක්කේය. එසේ නොසෙලවියහැකි ද්‍රව්‍යපිණ්ඩයක්වූ නමුත් යම්සේ සුළං වැදී

මෙන් සෙලවීයන්නේද එපරිද්දෙන්ම මේ ශරීරයෙහි පෘථිවී ආපො ආදි ධාතුපිණ්ඩවූ හස්තපාද ශීර්ෂ චර්ම මාංසාදි අවයව යන්ද ස්වශක්තියෙන් නොසෙලවියහැකි ද්‍රව්‍යපිණ්ඩයන්වූ නමුත් අඞ්ගමඞ්ගානුසාරී සුළං වැදීමෙන් සෙලවීයනබව සැලකියයුතු.

මෙහි වෘක්ෂය සොලවාලන්නාවූ සුළඟෙහි සමීරණලක්ෂණ මාත්‍රයමුත් මමය කියා ගැනීමට සත්වයෙක් හෝ මාසතුයකියා ගැනීමට දෙයක් යම්සේ නැත්තේද එපරිද්දෙන්ම අඞ්ගමඞ්ගානුසාරී වාතයෙහිද සමීරණලක්ෂණ මාත්‍රයමුත් මමය කියා ගැනීමට කෙනෙක් හෝ මාසතුය කියා ගැනීමට දෙයක් නැත්තේමය.

මේ අධ්‍යාත්මික බාහිර සුළං දෙකොටසෙහිමත් සමීරණ ලක්ෂණ මාත්‍රයමුත් මමය කියා ගැනීමට කෙනෙක් හෝ මාස තුය කියා ගැනීමට දෙයක් නැත්තේමය.

මෙසේ අඞ්ගමඞ්ගානුසාරී වාතය වෘක්ෂ සොලවාලන බාහිර වාතය හා කිසි වෙනසක් නැතිව එකම සැලීම් ලක්ෂණමාත්‍ර යෙන් පෙණීයනතුරු නැවත නැවත නුවණින් මෙනෙහි කට යුතු.

මෙනයින්ම ඉඟටිය, පපුව, නිකට, දිව, තොල, කපොල, ඇස්, ඇස්පෙඳි, ඇස්බැම, ආදි ශරීරාවයවයන් සොලවාලන් නාවූ අඞ්ගමඞ්ගානුසාරී වාතයන්ද බාහිර වෘක්ෂාදීන් සොලව න ප්‍රකෘති වාතය හා සසඳාබැලීමෙන් මෙනෙහි කටයුතු.

ආහාරරස, කිරි, ලේ, ශුක්‍රාදී ආබන්ධනලක්ෂණ ආපොධා තූන්ද ස්වශක්තියෙන් ගමනාගමනය කටහැකි සෙලවියහැකි වස්තුකොටසක් නොවනහෙයින් ඒ ආහාර රස ලේ කිරි ශුක්‍රාදී ආපොධාතූන්ද අඞ්ගමඞ්ගානුසාරී වාතයෙන් පිඹහරින ලද්දෑහුම ඒ ඒ කායාඞ්ගයන්හි ගමනාගමනය කරනබව දත යුතු.

අප බුදුන් ජීවමානකාලයෙහි නාගසමාලනම් තෙරණුකෙ නෙක් පිඩුපිණිස වඩිනුවෝ මහා මාර්ගයමැද නානා ආභරණ යෙන් අලඞ්කෘතව ඉතා දැකුම් කටයුතු අන්දමින් මේ අඞ්ගම ඞ්ගානුසාරී වාතය හෙතුකොටගෙන අඞ්ගවික්ෂෙපයකරමින් හෙවත් නටමින් උන් එක්තරා නළඟනක් දැක අහෝ! බෙද යක. මේ නළඟන මාරයාගේ පාසයකැයි (මලපුඩුවකැයි) මෙ සේ කාරණානුකූලව මෙනෙහිකිරීමෙන් සංවේග උපදවා විද සුන්වඩා එකෙණෙහිම අර්හත්ඵලය දක්වා ලොකොත්තර ධර්ම ප්‍රතිවෙධය කොට ඉක්බිති ස්වකීය ශිෂ්‍ය පිරිසට:—

"අලඞ්කතා සුවසනා, මාලිනී චන්දනුස්සද,
මජ්ඣෙ මහාපථෙ නාරී, තුරියෙ නච්චති නාටකී.

පිණ්ඩිකාය පවිට්ඨොහං, ගච්ඡන්තො නං උදික්ඛිසං,
අලඞ්කතං සුවසනං, මච්චුපාසංව ඔඩ්ඩිතං.

තතො මෙ මනසීකාරො, යොනිසො උදපජ්ජථ,
ආදීනවො පාතුරහු, නිබ්බිදා සමතිට්ඨථ,

තතො චිත්තං විමුච්චිමෙ, පස්ස ධම්මසුධම්මතං,
තිස්සො විජ්ජා අනුප්පත්තා, කතං බුද්ධාන සාසනං".

යනුවෙන් තමන්වහන්සේ විසින් පැමිණෙනලද යොනිසො මනස්කාරය පූර්වාඞ්ගමකොට ඇත්තාවූ විශෙෂාධිගමය ප්‍රකාශ කොට වදාළේය.

එහි අර්ථ:—ආවුසො, ඇවත්නි! සුවසනා, මොනවට ඇඳි වස්ත්‍ර ඇත්තාවූ; අලඞ්කතා, (ගිගිරිවලලු මුදු ආදී නානා ආභරණයෙන්) අලඞ්කෘතවූ; චන්දනුස්සද, ඇඟ ගල්වනලද සඳුන් සුවඳ කල්ක ඇත්තාවූ; මාලිනී, මොනවට පැළඳි මල්මාලා ඇත්තාවූ; නාරී, තරුණ වියෙහි සිටියාවූ; නාටකී, නළඟනක් තොමෝ; මජ්ඣෙමහාපථෙ, මහා මාර්ගමධ්‍යයෙහි; තුරියෙ, තූර්‍ය්‍යනාද පවත්වමින්; නච්චති, නටයි.

ආවුසො, ඇවැත්නි! පිණ්ඩිකාය, පිඩුපිණිස; පවිට්ඨො, (ගමට) ප්‍රවිෂ්ටවූ; අහං, මම; ගච්ඡන්තො, යනුයේ; ඔඩ්ඩිතං, (මාරයා විසින්) නංවනලද්දාවූ; මච්චුපාසංව, මාරපාසයකට (මලපුඩුව කට) බඳුවූ; සුවසනං, මොනවට ඇඳි වස්ත්‍රඇත්තාවූ; අලඞ්කතං, (ගිගිරිවලලු මුදු ආදී නානාභරණයෙන්) අලඞ්කෘතවූ; නං, ඒ නළඟන; උදික්ඛිසං, දිටිමි.

ආවුසො, ඇවත්නි! තතො, ඒ නළඟන දිටු කාලයෙහි; මෙ, මාහට; යොනිසො, කාරණානුකූලව; මනසීකාරො, මනස්කාරයක්; උදපජ්ජථ, උපන. ආදීනවො, (රූපශබ්දාදි කාමයන්ගේ) ආදීනවය; පාතුරහු, පහළවීය. නිබ්බිදා, නිර්වෙදඥානය; සමතිට්ඨථ, මොනවට පිහිටියේය. තතො, එහෙයින්; මෙ, මාගේ; චිත්තං, චිත්තය; විමුච්චි, කෙලෙසුන් කෙරෙන් වෙසෙසින්; මිදුණේය.

ආවුසො, ඇවත්නි! ධම්මසුධම්මතං, ධර්මසුධර්මතාව; හෙවත් මාවිසින් නිතර සිහිනුවන උපදවා වඩනලද සමථවිදර්ශනා ධර්මයන්ගේ ඇඳනැති පිරිසිදුගතිය; පස්ස, බලව්. (පස්ස යනු වචන විපර්‍ය්‍යාසයකි) තිස්සොවිජ්ජා, පූ. දි. ආ. යයි කියනලද ත්‍රිවිද්‍යාවෝ; මයා, මා විසින්; අනුප්පත්තා, අනුප්‍රාප්තයහ; බුද්ධානං, බුදුවරුන්ගේ; සාසනං, ශාසනය; කතං, (පිළිවෙත් පිරීමෙන්) සම්පූර්ණකරනලද්දේය.

මෙසේ මේ අඞ්ගමඞ්ගානුසාරී වාතයනම් ඒකාන්තයෙන් අවිද්‍යමාන සත්වාකාරයක් ඉදිරියට පාමින් පෘථිවි ආපොධාතු ලක්‍ෂණ නොදත් අය මුළාකරවන ධාතුවකි.

එහෙයින් ඊට මුළානොවනු පිණිස සකල සත්පුරුෂයන් විසින් යටත්පිරිසෙයින් සතරමහාභූතයන්ගේ ලක්‍ෂණමාත්‍රය වත් හොඳින් දැන ඉගෙනීම පිණිස උත්සාහ කටයුතුමය

තවද මේ ෂට්විධ වායොධාතු කොට්ඨාසයන් එකට ගෙන නැව් හම්බන් ආදියෙහි රුවල්ගසාහරින සුළඟ හා සසඳාබැලී මෙන්ද කඩදාසියෙන් තනා ආකාශයෙහි දල්වා හරිනලද පහන්කූඩු බැලූම් ඔසවාගෙන යන්නාවූ ධූමවාෂ්පමිශ්‍රවූ සුළඟ හා සසඳාබැලීමෙන්ද මෙනෙහිකටයුතු.

ඊට මෙහි සඞ්ග්‍රහමාත්‍රයක් දක්වනුලැබේ.

නාවාමාලුත වෙගෙන, අග්‍යගාරඤ්ච වාතූනා,
යථායාති තථාකායො, යාතිවාතාහතො අයං

එහි අර්ථ:-නාවා, නෞකාතොමෝ; මාලුතවෙගෙන, සුළං වේගයෙන්; යාතියථාච, ජලය මතුපිට යම්සේ යාත්‍රාකරන්නීද. අග්‍යාගාරං, පහන්කූඩුව හෝ බැලූම්යන්ත්‍රය; වාතූනා, දුම් මිශ්‍රවූ සුළඟින්; යාතියථාච, ආකාශයෙහි ඉහළ නගින්නේ යම්සේද. තථා, එපරිද්දෙන්; අයං කායො, මේ ශරීරයවූ පෘථිවි ආපොධාතුසමූහය; වාතාහතො, අඞ්ගමඞ්ගානුසාරී වාත යෙන් වික්‍ෂෙපිතවූයේ හෙවත් තල්ලූකරනලද්දූයේ; යාති, (සැලි සැලී) ගමන්කරන්නේය.

මෙසේ නැවත නැවත මෙනෙහිකරගෙන යනවිට අධ්‍යා ත්මික බාහිර වායොධාතු දෙකොටස එකකට එකක් අවෙ නස්ව පෙණීයනවා ඇත.

එසේ පෙණීගියකල්හි බාහිර වායොධාතුන් කෙරෙහි මමය මාගේය කියා ගැනීමක් නැත්තේ යම්සේද එපරිද්දෙන් අධ්‍යා ත්මික වායොධාතුන් කෙරෙහිද මමය මාගේය කියා ගැනීමක් ඇතිනොවන්නේමය.

බාහිර වායොධාතූන් මනුෂ්‍යයෝ ගිනිතැබීම් දැවීම් අපවිත්‍ර කිරීම් පිඹහැරීම් ආදියෙන් විනාශකරනුලබන කල්හි අහෝ! අහෝ!! ලොකවාසීහු අප ගිනිතබත් අප දවත් අප අපවිත්‍ර කරත් අප පිඹහරිත් අප විනාශකරත්යයි මෙසේ මොරගැසී මක් වැළපීමක් යම්සේ නොකරද්ද එසේම මේ අධ්‍යාත්මික වායොධාතූන්ටද ලෝවැසියෝ කොතරම් බැණවැදුනත් දැවීම් කැපීම්කෙටීම් විනාශකිරීම් ආදියෙන් කොතරම් දඬුවම්කළත්

ඒ වෙනුවෙන් මේ ධාතුමනසකාරයෙන් යුත් සැදැහැවතුන්ට අහෝ! අහෝ!! ලොකවාසීහු අපට බැණවදිත්; දැවීම් කැපීම් කෙටීම් විනාශකිරීම් ආදියෙන් අපට දඬුවම්කරත්යයි මෙසේ මොරගැසීමක් වැලපීමක් ඇතිනොවන්නේමය.

මෙසේ අධ්‍යාත්මික බාහිර වායොධාතු දෙකොටස එකකට එකක් අවෙනස්ව පෙණීගියාවූ සත්පුරුෂයෝ අධ්‍යාත්මික වායොධාතුන් කෙරෙහි අනවරාග්‍ර සංසාරය මුළුල්ලෙහි පවත්වාගෙන එනලද මම්යමායෙය්ය යන සත්කායදෘෂ්ටිබන්ධනය හා තෘෂ්ණා ආලයත් පහකිරීමෙන් පරමරමණීය ශාන්ත ප්‍රණීත විරාගපදය සාක්ෂාත් කරන්නාහුමය

එහෙයින් උද්දෙශගාථායෙහි "නෙසො හමස්මි නෙතං මෙ එවං තත්‍ථ විරජ්ජති"යි කියනලදී.

හත්‍ථතලෙ ඨපෙත්වාන, පෙක්ඛිත්වා ඤාණචක්ඛුනා,
යථා ඉදං තථා එතං, යථා එතං තථා ඉදං,
අජ්ඣත්තඤ්ච බහිද්ධාච, වායුස්මිං වො විරජ්ජථ

සාධවෙ, සත්පුරුෂවරුනි! වො, සත්පුරුෂවූ තෙපි; හත්‍ථතලෙ, අත්ලෙහි; ඨපෙත්වාන, (ඤාණ නමැති හස්තයෙන් අධ්‍යාත්මික බාහිර වායොධාතුවය ගෙන) තබා; ඉදං, මේ (ආශ්වාස ප්‍රාශ්වාසාදි අධ්‍යාත්මික) වායොධාතු සමූහය; යථා අහං න අස්මි, යම්සේ මම නොවෙම්ද. තථා, එපරිද්දෙන්; එතං, තෙල(මයිනහම්නලවාතය ආදි)බාහිර වායොධාතු සමූහය; අහං න අස්මි, මම නොවෙමි. එතං, තෙල (මයිනහම්නලවාතය ආදි)බාහිර වායොධාතු සමූහය; යථාඅහං න අස්මි, යම්සේ මම නොවෙම්ද. තථා, එපරිද්දෙන්; ඉදං, මේ(ආශ්වාස ප්‍රාශ්වාසාදි) අධ්‍යාත්මික වායොධාතු සමූහය; අහං න අස්මි, මම නොවෙමි. ඉති, මෙසේ; ඤාණචක්ඛුනා, නුවණැසින්; පෙක්ඛිත්වා, බලා; අජ්ඣත්තඤ්ච වායුස්මිං, අධ්‍යාත්මික වායොධාතුසමූහය කෙරෙහිද; බහිද්ධාච වායුස්මිං, බාහිර වායොධාතු සමූහය කෙරෙහිද; විරජ්ජථ, නොඇලෙව්.

**මෙතෙකින් වායොධාතු නිද්දේශය නිමි.**

---

## V. ආකාශධාතු නිද්දේශය.

ආකාශධාතුතොමෝද අධ්‍යාත්මික ආකාශ ධාතුය බාහිර ආකාශධාතුය කියා දෙවැදෑරුම් වන්නීය.

එයින් මේ මහා බොල් පොළොවට යටින් පිහිටි අජටාකාශය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට උඩින් පිහිටි අජටාකාශය,

චන්ද්‍ර සූර්‍ය්‍ය නක්‍ෂත්‍ර තාරකාවන් ගමන්කරන ආකාශය, උමඟ ගුහා ගෘහ විහාරාදියෙන් පිරිසිඳිනලද ආකාශය, ගස්බිල් තුඹස් බිල්වල පවත්නා ආකාශය, යනාදි බාහිර පෘථිවිධාතු ආපොධාතූන්ගෙන් අසම්බන්ධව (හිස්ව) පවත්නා සියලුම ආකාශයෝ බාහිර ආකාශධාතූහු නම්වෙත්.

සත්වසන්තානයෙහි 1. කන් සිදුරු, 2. නාස් සිදුරු, 3. මුව සිදුරු, 4. ප්‍රවෙශ සුෂිරයයි කියනලද ග්‍රීවාසිදුර, 5. ස්ථාන සුෂිර යයි කියනලද ආමාශයකුහරය, 6. නිෂ්ක්‍රමණ සුෂිරයයි කියන ලද දිරූ ආහාර නික්මෙන සිදුර යන පෘථිවි ආපොද්‍රව්‍යධාතූන්ගෙන් අසම්බාධව හිස්වූ සවැදෑරුම් ආකාශයෝතුමූ අධ්‍යාත්මික ආකාශධාතූහු නම්වෙත්. මේ අධ්‍යාත්මික ආකාශධාතු බෙදා දක්වීමයි.

මෙසේ බෙදා දක්වනලද අධ්‍යාත්මික ආකාශධාතුවිභාගය යහපත්සේ ඉගෙන බාහිර ආකාශධාතූන් හා සසඳාබලමින් අධ්‍යාත්මික බාහිර ආකාශධාතු දෙකොටස එකකට එකක් අවෙනස්ව පෙණීයනතුරු නැවත නැවත මෙනෙහි කටයුතු. කන් සිදුරු ආදි ඒ ඒ අධ්‍යාත්මික සිදුරු තුඹස් සිදුරු හා සමාන යහ. බාහිර තුඹස් සිදුරුතුළ මමය කියා ගැනීමට කෙනෙක් හෝ මාසතුය කියා ගැනීමට දෙයක් නැත්තේ යම්සේද එපරිද්දෙන් මේ ශරීරයෙහි කන්සිදුරු ආදි ඇතුල් සිදුරුතුළ මමය කියා ගැනීමට කෙනෙක් හෝ මාසතුය කියා ගැනීමට දෙයක් නැත්තේමය හුදෙක් පෘථිවි ආපොධාතූන්ගෙන් අසම්බාධව හිස්වූ ආකාශමාත්‍රයක්ම ඇත්තේය. මේ නයින් නාසිකාසිදුරු මුඛසිදුරු ආදි ඉතිරි අධ්‍යාත්මික ආකාශධාතූද තුඹස්සිදුරු ආදි බාහිර ආකාශධාතූන් හා සසඳාබැලියයුතු. අධ්‍යාත්මික බාහිර ආකාශධාතු දෙකොටස එකකට එකක් අවෙනස්ව පෙනීමෙන් මමය මාගේය කියා පවත්වාගෙන එනලද සත්කායදෘෂ්ටි තෘෂ්ණා බන්ධනයන් පහවී යනතුරු නැවත නැවත සසඳා මෙනෙහිකටයුතු.

බාහිර ආකාශධාතු වෙනුවෙන්ද තුඹස්සිදුරුම නොව උමඟ ගුහා ගෘහසිදුරු ආදි අනෙකවිධවූ බාහිර ආකාශධාතූන් සමගද සසඳා බැලියයුතු.

එසේ සසඳා මෙනෙහිකරගෙන යනකල්හි නාස්සිදුරු ආදි අධ්‍යාත්මික ආකාශධාතූන් සියල්ලම බාහිර ආකාශධාතූන් හා සදෘශව පෙනියාමෙන් ඉතිරි අධ්‍යාත්මික ආකාශධාතූන් කෙරෙහිද මමය මාගේය කියා පවත්වාගෙන එනලද සත්කායදෘෂ්ටි තෘෂ්ණාබන්ධනයන් පහවීයනවා ඇත,

එසේ සත්කායදෘෂ්ටි තෘෂ්ණාබන්ධනයන් පහවීගියකල්හි බාහිර ආකාශධාතුත්ට කෙතරම් බැණවැදුනත් කෙතරම් දඬුවම්කළත් අපට බැණවදිත් අපට දඬුවම්කරත්යයි මෙසේ මොරගැසීමක් වැළපීමක් යම්සේ නොවන්නේද එපරිද්දෙන් මේ අධ්‍යාත්මික ආකාශධාතුත්ට යම්කෙනෙක් බැණවැදුනත් දඬුවම්කළත් ඒ වෙනුවෙන්ද මේ ධාතුමනස්කාරයෙන්යුත් සැදැහැවතුන්ට අහෝ! අහෝ!! ලොකවාසීහු අපට බැණවදිත් අපට දඬුවම්කරත් අප විනාශකරත්යයි මෙසේ මොරගැසීමක් වැළපීමක් ඇතිනොවන්නේමය.

මෙසේ කියනලදනයින් අධ්‍යාත්මික බාහිර ආකාශධාතු දෙකොටස අවෙනස්ව පෙනීගියාවූ සත්පුරුෂයෝතුමූ අනවරාග්‍ර අතීත සංසාරයෙහි පවත් මමය මාගේය කියා පවත්වාගෙන එනලද සත්කායදෘෂ්ටි තෘෂ්ණාබන්ධනයන් සිඳලීමෙන් පරම රමණීයවූ ශාන්තප්‍රණීත විරාගපදය ප්‍රත්‍යක්ෂ කරන්නාහුමය.

එහෙයින් උද්දෙශගාථායෙහි "නෙසො හමස්මි නෙතං මෙ එවං තස්ස විරජ්ජති"යි කියනලදී.

හත්ථතලෙ ඨපෙත්වාන, පෙක්ඛිත්වා ඤාණචක්ඛුනා,
යථාඉදං තථා එතං, යථා එතං තථා ඉදං,
අජ්ඣත්තඤ්ච බහිද්ධාච, ආකාසෙ වො විරජ්ජථ.

සාධවෙ,සත්පුරුෂවරුනි! වො,තෙපි; හත්ථතලෙ,අත්ලෙහි; ඨපෙත්වාන, (අධ්‍යාත්මික බාහිර ආකාශධාතුවය ඤාණනැමැති හස්තයෙන් ගෙන)තබා; ඉදං, මේ(කන්සිදුරු නාස්සිදුරු ආදී) අධ්‍යාත්මික ආකාශධාතු සමූහය; යථාඅහං න අස්මි, යම්සේ මම නොවෙම්ද තථා, එපරිද්දෙන්; එතං, තෙල (තුඹස්සිදුරු ගස් සිදුරු ආදී) බාහිර ආකාශධාතුසමූහය; අහං න අස්මි, මම නොවෙමි. එතං, තෙල (තුඹස්සිදුරු ගස්සිදුරු ආදී) බාහිර ආකාශධාතු සමූහය; යථා අහං න අස්මි, යම්සේ මම නොවෙම්ද. තථා, එපරිද්දෙන්; ඉදං, මේ (කන්සිදුරු නාස්සිදුරු ආදී) අධ්‍යාත්මික ආකාශධාතු සමූහයද; අහං න අස්මි, මම නොවෙමි. ඉති, මෙසේ; ඤාණචක්ඛුනා, නුවණැසින්; පෙක්ඛිත්වා, බලා; අජ්ඣත්තඤ්ච ආකාසෙ, අධ්‍යාත්මික ආකාශධාතු සමූහය කෙරෙහිද; බහිද්ධාච ආකාසෙ, බාහිර ආකාශධාතුසමූහය කෙරෙහිද; විරජ්ජථ, නොඇලෙව්.

**මෙතෙකින් ආකාශධාතු නිදේශය නිමි.**

නැවතත් රූපය සාමාන්‍ය වශයෙන් දක්වනුලැබේ.

“**රුප්පතීති ඛො භික්ඛවෙ තස්මා රූපන්ති වුච්චති**” භික්ඛවෙ, මහණෙනි; යං (ධම්මජාතං) යම් (පෘථිවී ආදී) සවභාව ධර්මයක්තෙමේ; ඛො, ඒකාන්තයෙන්; රුප්පති, ස්ථිරව සිටියනොහී ක්ෂණයෙන් ක්ෂණය විපරීතවෙයිද ඉති තස්මා, එහෙයින්; තං (ධම්මජාතං) ඒ (පෘථිවී ආදී) සවභාව ධර්මයතෙමේ, රූපන්ති, රූපයයි; වුච්චති, කියනුලැබේ.

මෙසේ “**ඛන්ධවග්ගසංයුත්තකපාළි**”යෙහි භාග්‍යවතුන්වහන්සේ විසින් වදාරනලද නිර්වචනාර්ථයවූ පරිද්දෙන් යට දක්වනලද පෘථිවිකොට්ඨාස විස්ස, ආපොකොට්ඨාස දොළොස, තෙජොකොට්ඨාස පස, වායොකොට්ඨාස සය, යන තෙසාළිස්වැදෑරුම් ධාතුකොට්ඨාසයෝතුමූ ශීතයෙන ස්පර්ශකරනලද්දුවද නොයෙක් අයුරෙන් සිඳෙමින් බිඳෙමින් විපර්‍ය්‍යස්තාවත්නාහුය. හෙවත් පෙරළෙත්නාහුය. උෂ්ණයෙන් ස්පර්ශකරනලද්දුවද නොයෙක් අයුරෙන් සිඳෙමින් බිඳෙමින් විපර්‍ය්‍යස්තාවත්නාහුය. සාගිනෙන් ස්පර්ශකරනලද්දුවද නොයෙක් අයුරෙන් සිඳෙමින් බිඳෙමින් විපර්‍ය්‍යස්තාවත්නාහුය. සාපිපාසයෙන් ස්පර්ශකරනලද්දුවද නොයෙක් අයුරෙන් සිඳෙමින් බිඳෙමින් විපර්‍ය්‍යස්තාවත්නාහුය. අව්වෙන් ස්පර්ශකරනලද්දුවද නොයෙක් අයුරෙන් සිඳෙමින් බිඳෙමින් විපර්‍ය්‍යස්තාවත්නාහුය සුළඟින් ස්පර්ශකරනලද්දුවද නොයෙක් අයුරෙන් සිඳෙමින් බිඳෙමින් විපර්‍ය්‍යස්තාවත්නාහුය. ඩැහැ ලේ බොන මැස්සන් විසින් ස්පර්ශකරනලද්දුවද නොයෙක් අයුරෙන් සිඳෙමින බිඳෙමින් විපර්‍ය්‍යස්තාවත්නාහුය. විදලේ බොන මදුරුවන් විසින් ස්පර්ශකරනලද්දුවද නොයෙක් අයුරෙන් සිඳෙමින් බිඳෙමින් විපර්‍ය්‍යස්තාවත්නාහුය. සර්පයන් විසින් ස්පර්ශකරනලද්දුවද නොයෙක් අයුරෙන් සිඳෙමින් බිඳෙමින් විපර්‍ය්‍යස්තාවත්නාහුය.

මෙසේ දක්වනලද විරොධප්‍රත්‍යයන්ගෙන් වන සුප්‍රකට විපරීතගතියෙන් යුක්තවූ හෙයින් ඒ තෙසාළිස් වැදෑරුම්අධ්‍යාත්මික රූපධාතුසමූහය සාමාන්‍යයෙන් රූපයයි ව්‍යවහාරකරනුලැබේ.

මෙසේ සාමාන්‍ය විශෙෂවශයෙන් කියනලද අධ්‍යාත්මිකරූපධාතුසමූහය වෙන් වෙන් වශයෙන් නොපිහිටා ඒකඝනව පිහිටිහෙයින්ද බාහිර සතරමහාභූතයන්මෙන් වෙන් වෙන් වශයෙන් නොපෙණී ඒකඝනව පෙණීයාමෙන්ද මේ සත්වයන්ට ඒ තෙසාළිස් වැදෑරුම් අධ්‍යාත්මික රූපකොට්ඨාසයන් කෙරෙහිම සත්වයෙක, පුද්ගලයෙක, ස්ත්‍රියක, පුරුෂයෙක යන ආදීන්ගේ වශයෙන් වරදවා වැටහීම වරදවාගැනීම ඇතිව

පවත්නේය. බාහිර සතරමහාභූතවූ පස්දිය ගිනි සුළං වූකලී ඝනබඩව නොපිහිටි හෙයින් වෙන් වෙන් වශයෙන් පෙණී යන්නාහුය. එහෙයින් ඒ බාහිර සතරමහාභූතයන්කෙරෙහි සත්වයෙක පුද්ගලයෙක ස්ත්‍රියක පුරුෂයෙක යන ආදීන්ගේ වශයෙන් වරදවා වැටහීමක් වරදවා ගැනීමක් ඇති නොවන් නේය. ඉදින් අධ්‍යාත්මික සතරමහාභූතයෝද බාහිර සතර මහාභූතයන්මෙන් වෙන් වෙන් වශයෙන් පවතින්නම්, වෙන් වෙන් වශයෙන් පෙණීයෙන්නම්,ඒ අධ්‍යාත්මික සතරමහාභූත යන් කෙරෙහිද සත්වයෙක, පුද්ගලයෙක,ස්ත්‍රියක, පුරුෂයෙක යන ආදීන්ගේ වශයෙන් වරදවා වැටහීමක් වරදවාගැනී මක් ඇතිනොවන්නේමය. යම්හෙයකින් අධ්‍යාත්මික රූපසමූහය සත්වයෙක පුද්ගලයෙක ස්ත්‍රියෙක පුරුෂයෙක යන ආදීන්ගේ වශයෙන් කියා අනමුදු ඔහුගේ ඒ කීම පවා බාරනොගෙන ඔහට පින්වත! තොපි නොදක නොදන කියන්නෙක. තො පගේ වැටහීම වැරදි වැටහීමක තොපගේ කීම වැරදිකීමක යනාදීන් අවවාද කරන්මැයි.

මෙසේ අධ්‍යාත්මික පස් දිය ගිනි සුළං යන සතරමහාභූත සමූහය වෙන් වෙන් වශයෙන් නොපිහිටා ඒකඝනව පිහිටි හෙයිනුත් බාහිර සතරමහාභූතයන්මෙන් වෙන් වෙන් වශ යෙන් නොපෙණී ඒකඝනව පෙණීයාමෙනුත් මේ සත්වයන්ට අධ්‍යාත්මික සතරමහාභූතයන් කෙරෙහිම සත්වයෙක, පුද්ගල යෙක, පුරුෂයෙක, යන ආදීන්ගේ වශයෙන් වැරදිගැනීම් වැරදි වැටහීම් සියල්ලක් ඇතිවී පවත්නේය.

### මේ අර්ථය ප්‍රකාශවීමට නිදර්ශනයක්නම්.

ලොකයෙහි කෙළිසෙල්ලම් සහිත පෙළහර පවත්වන කාලවල සමහර උසුලුවිසුලුකාරයෝ ඇත් අස් ඔටු ගව මහි ෂාදි රූප තනා ඒ රූපතුළට ඇතුල්වී නොයෙක් විකාර ක්‍රියා පවත්වමින් ගමන්කරති.

ඒ දුටු නොදන්නා ළදරුවන්ට ප්‍රාණය සහිත ඇත් අස් ගව මහිෂාදි සත්වයෝයයි අවබොධවීමෙන් සන්තොෂවියයුතු ස්ථානයන්හි සන්තොෂයද භයවියයුතු ස්ථානයන්හි භයද තැතිගැනියයුතු ස්ථානයන්හි තැතිගැනීමද ඇතිවන්නේය.

කුමාර කුමාරිකාදි රූප තනා නටවන තැනකට පැමිණී කල්හිද එබදු ළදරුවන්ට යාම් ඊම් ආදියෙන් යුක්තවූ ඒ රූප යන් දැකීමෙන් සැබෑ කුමාරයෙක, කුමාරියක, අමාත්‍යයෙක යන ආදි වශයෙන් අවබොධවීමෙන් එයින් එක රූකඩයක්

අතික් රූකඩයකට පහරදෙනු දක්නාලද්දේනම් පීඩාකරනු. දක්නා ලද්දේනම් ඒ ළදරුවන්ගේ සිත්සතන්හි මහත් දයාවක් හා කනගාටුවක්ද ඇතිවන්නේය.

නැවත ඒ ළදරුවෝ දැනකියාගෙන තලතුනාබවට පත්වූ වාසින්පසු යට කියනලද රූපයන් පිළිබඳව මේ කඩදාසිය, මේ උණපතුරුය, මේ පිදුරුය, මේ රෙදි වැහැරිය, මේලණුය, මේ යකඩඇණය යනාදීන්ගේ වශයෙන් ඒ රූප සාදාතිබෙන අවයව වෙන් වෙන් වශයෙන් පෙණීගියවිට මේ රූපතුළ ස්ව ශක්තියෙන් චඤ්චලවියහැකි ප්‍රාණවත්කමක් නැත්තේය. හුදෙක් එහි තුළට ප්‍රවිෂ්ටවූ මනුෂ්‍යයන් විසින් සොලවාහරින ලදුවම චඤ්චලවන්නාහුයයි තත්වාකාරයෙන් පෙණීයාමෙන් ඔවුන්තුල ළදරුකාලයෙහි ඇතිවීතිබුනාවූ සත්වසංඥාදී වැරදි සංඥා සියල්ලක් වැරදි ගැනීම් සියල්ලක් අත්හැරීයන්නේය.

තවත් නිදර්ශනයක්නම්.

කැටකැබිලිති බොරලු ගල් මුල් අඟුරු පස් තණපරඬැල් ආදී කසළ සම්භාරයක් පොදිබැඳ මේ මසුරන්පොදිය ගනුවයි යමෙක් වඤ්චාකොට දුන්කල්හි ඊට රුචිවී සැබෑ මසුරන්පොදියක්යයි ආසාවෙන් ගෙන තබාගත් අඥාන ළදරුවා නැවත දැනකියාගෙන තලතුනාබවට පත්වූවාසින්පසු පොදිය ලිහා මේ කැබිලිතිය, මේ ගල්කැටය, මේ බොරලුය, මේ අඟුරුය, මේ මැටිය, මේ දරපතුරුය, මේ තණපරඬැල්ය කියා මෙසේ අවයව වෙන් වෙන් වශයෙන් දැක මසුරන් පොදියක්නොව කැබිලිති ගල්කැට ආදී නිශ්සාර කසළ රැසක්යයි තත්වාකාරයෙන් දැනගත්කල්හි ඔහුතුල පළමු ළදරු අවස්ථාවෙහි ඇතිවී තුබුනාවූ විපරීත සංඥාදී වැරදි වැටහිලි සියල්ලම අත්හැරීයන්නේය.

ස්ත්‍රී පුරුෂාදී යම්කිසි කෙනෙක් මේ නයින් තමතමන්ගේ ශරීරය සම්බන්ධවූ කෙස් ලොම්, නිය, දත්, සම්, මස්,ආදී ධාතු කොට්ඨාස වෙන් වෙන් වශයෙන් නොදැක්කාහුනම් නිදසුන්වල කී අඥාන ළදරුවන් හා ඔව්හු සමානවන්නාහුමය. එහෙයින් අප බෞද්ධාගම්කාර සකල සත්පුරුෂයෝම ස්වකීය ශරීරකූඩු කෙරෙහි අනවරාග්‍රසංසාරයෙහි පවත් පවත්වාගෙන එනලද අඥානගති නැමැති ඝනාන්ධකාරයන්ගෙන් මිදී සම්‍යක්දෘෂ්ටි ඥාන නැමැති ශාසනාලොකයෙන් ආලොකමත්වනු පිණිස තමතමන්ගේ කෙස්, ලොම්, ආදී අධ්‍යාත්මික ධාතුපුඤ්ජයන් බාහිර ධාතුන් හා සදෘශව වෙන් වෙන් වශයෙන් පෙණීයන තුරු නැවත නැවත නොපසුබට වීර්‍ය්‍යයෙන් යටදැක්වූ නයින් බෙද බෙදා වෙන්කොට මෙනෙහිකරමින් උත්සාහ වඩත්වා.

## මස්සැළි උපමාවක්ද දක්වනුලැබේ.

මස් රාත්තල් ගණනක් කඩකඩකොට කපාදමා අඩක් පමණ ජලය වත්කොට තම්බනලද මස් සැළියෙක්හි පෘථිවී ආදී ධාතුපඤ්චකය බෙදා වෙන්කර ගන්නා ක්‍රමය දතයුතු. කෙසේද? යත්, ඒ සැළියෙහි කෑලිවූ සපකොටස වනාහි අතට දැනියන තදගතියෙන් හෝ මොළොක් ගතියෙන් යුක්තවන හෙයින් පෘථිවීධාතුනම්වේ. ඉස්මවූ ද්‍රවය වනාහි ආබන්ධන ගතියෙන් හෝ පග්ඝරණගතියෙන් යුක්තවනහෙයින් ආපො ධාතු නම්වේ. අත පෙව්විට දැනියන උණුහුම වනාහි දැවීම් කෘත්‍යයෙන් යුක්තවනහෙයින් තෙජොධාතුනම්වේ. සපද්‍රව දෙවර්ගය සල සලා සැළිපත්ලෙන් නගින වේගය හා ඒ සප ද්‍රව දෙවර්ගයෙන් ''ශූශූ'' යන අනුකරණයෙන් නගින වේගයද සැලීම්කෘත්‍යයෙන් යුක්තවනහෙයින් වායොධාතු නම්වේ. සපද්‍රව දෙවර්ගයට උඩින් සැළියේ ඇතුළත පිරිසිඳි සිටි ආකාශය පෘථිවී ආපොධාතු දෙකින් සම්බාධයක් නැතිහෙයින් ආකාශධාතු නම්වේ.

මෙහි උණුසුම් ලක්‍ෂණය සප නොවන්නේය. සපද උණුසුම් ලක්‍ෂණය නොවන්නේය. උණුසුම් ලක්‍ෂණයනම් තෙජොධාතුවයි, සපනම් පෘථිවීධාතුවයි, තෙජොධාතුව අතට දැනියනතරම් තදගතිය හෝ මොළොක්ගතිය ඇති ධාතුවක්ද නොවන්නේය. තදගතිය හෝ මොළොක්ගතිය නැතිබවද තනි ගිනිදැල්ලක් අල්වා තදකර බැලූකල්හි,දතහැකිවේ.

ඒ මස්සැළියෙහි ඉස්මවලට අතතබා බැලූකල්හි උණුසුම් ලක්‍ෂණය දැනියනවාඇත. ඒ උණුසුම්ලක්‍ෂණයනම් ඉස්ම නොවන්නේය. ඉස්මද උණුසුම්ලක්‍ෂණය නොවන්නේය. උණුසුම්ලක්‍ෂණයනම් තෙජොධාතුවයි, ඉස්මනම් ආපොධාතුවයි, ''ශූශූ'' යන අනුකරණයෙන් නගින හුමාලයට අත තබා බැලූකල්හි උණුසුම්ලක්‍ෂණය දැනියනවාඇත. මෙහිද හුමාලවේගය උණුසුම නොවන්නේය, උණුසුමද හුමාලවේගය නොවන්නේය. හුමාලවේගයනම් වායොධාතුවයි, උණුසුමනම් තෙජොධාතුවයි, තෙජොධාතුවද පෘථිවී ආපො වායො යන ත්‍රිවිධධාතූන්හි ඇවිලීගෙන ඒ ධාතුත්‍රිකය දවන්නාවූ ගින්නයි. මෙ සැළි නිදර්ශනයෙන් උණුසුම් තෙජොධාතුව කරණකොටගෙන උණුවූ ධාතුපඤ්චකයෙහි ආකාරය දක්වයි.

ශීත තෙජොධාතුව කරණකොටගෙන සිසිල්වූ ධාතුපඤ්චකයාගේ ලක්‍ෂණ තේරුම්ගැනීම පිණිස උෂ්ණ තෙජොධාතුවට කී පරිද්දෙන්ම අයිස්දමා මිශ්‍රකරනලද මස් සැළියක් සාදා ඊට සමකර බැලියයුතු.

මේ මස් සැළියෙහි ධාතුබෙදන ක්‍රමය යහපත්සේ දැන ඉගෙන එක එක චක්‍රවාටයක් එක එක මස්සැළියක් හා සසඳා තබා අනන්ත චක්‍රවාටගත බාහිර ධාතුසියල්ලක් ඥානමැති හස්තයෙන් නැවත නැවත අවුස්සා මස්සැළියේ ධාතූන් හා සමකරබැලීමෙන් ඒ ඒ ධාතුලක්‍ෂණ වෙන් වෙන් වශයෙන් ගෙන මෙනෙහිකටයුතු. මස්සැළියෙහි ධාතුපඤ්චකය වෙන් වෙන් වශයෙන් පෙනීයන්නාක්මෙන් අනන්ත චක්‍රවාටගත පෘථිවී ආදී සියලු ධාතුසම්භාරයන්ද වෙන් වෙන් වශයෙන් පෙනියනවා ඇත. එසේ මෙනෙහිකිරීමෙන් බාහිරධාතූන් පෙනී ගියවිට අධ්‍යාත්මික ධාතුපඤ්චකයද මස් සැළිය හා සඳෘශවම පෙනීයනතුරු නුවණින් පරීක්‍ෂාකරමින් මෙනෙහිකටයුතු.

මේ ශරීරයෙහි චර්මනැමති කටාහය සැළියව සමකර තබා ඒ චර්මකටාහයතුළ පිහිටි මස්නහර ආදී සප රොඩු සියල්ලක් පෘථිවිධාතුවන්නේමැයි. ලේ ඉස්ම සියල්ලක් ආපොධාතුවන්නේමැයි. සියලුම උණුසුම් දෘහගති හා ශීතගති තෙජොධාතුවන්නේමැයි. පුම්බවීම්ගති හා සැලීම්ගති සියල්ල වායොධාතුවන්නේමැයි. කුහර ගුහා අභ්‍යවකාශ සියල්ලක් ආකාශධාතුවන්නේමැයි කියා මෙසේ අධ්‍යාත්මිකවූ මුළු ශරීරයෙහි චිත්ත චෛතසිකසඞ්ඛ්‍යාත නාමධාතූන් හැර මේ පෘථිවී ආදි පඤ්චවිධ ධාතූන්ගෙන්පිටත්වූ පරමාණුවක් පමණකුදු අන්කිසිවක් නැති බව දතයුතු. යට උපමාවලින් දක්වනලද අශ්ව ඔටු ගව මහිෂාදී රූපයන් හා කසල පොදියද අවයවවශයෙන් බෙදා ගත් කල්හි ඒ ඒ ද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් යම්සේ පෙනීයන්නාහුද එපරිද්දෙන් අධ්‍යාත්මික ශරීරයද මේ පෘථිවී ආදි පඤ්චවිධ ධාතුකොඨාසයන්ගේ වශයෙන් බෙදාගත්කල්හි ඒඒ ධාතුකොඨාස වෙන් වෙන් වශයෙන් පෙනියන්නාහුමය. එහෙයින් එසේ පෙනීයනතුරු අකුශිතව නැවත නැවත බෙදා බලමින් නුවණින් මෙනෙහිකටයුතු.

කලින්කල ස්වකීය ශරීරයද මස්සැළියක්කොටගෙන බාහිර මස්සැළිය හා සසඳාබැලීමෙන්ද මෙනෙහිකටයුතු.

කලින්කල පරසන්තානද ස්වසන්තානයමෙන්ම ධාතුපඤ්චකයාගේ වශයෙන් බෙදා බැලියයුතු.

මෙසේ කියනලද පෘථිවී ආදි ධාතුපඤ්චකය 'මමය' කියා පමණක්නොව 'ඔබය' 'ස්ත්‍රීපුරුෂයා' 'රජය' 'බමුණුය' 'ඇමතිය' යනාදි වශයෙන්ද ගතයුතු නොවේමය, මේ පඤ්චවිධ ධාතූන් අතුරෙන් ආකාශධාතුව යහපත්සේ දක්කාවූ ධාතුමනසිකාර යොගින්ට මේ ශරීරය නොයෙක් තන්හි කුහරඇත්තාවූ තුඹ

සක් ගස්බිලයක්මෙන්ද වායොධාතුව යහපත්සේ දක්නාවූ ධාතුමනසිකාර යොගීන්ට මේ ශරීරය මයිනසමක පුළුංනළයක් බොයිලේරුවක දුම්නළයක් පුළුංකොට්ටයක් පුළුං මෙට්ටයක් පුළුඟින් සැලෙන වෘක්ෂයක් බැලූම්යන්ත්‍රයක් මෘතදෙහයක් මෙන්ද තෙජෝධාතුව යහපත්සේ දක්නාවූ ධාතුමනසිකාර යොගීන්ට මේ ශරීරය කඩපිම්මේ තම්බනලද පිපිපොට්ටනියක් උණුඅළුපල්ලේ තම්බනලද අලගෙඩියක් උණුඅළු තීරයෙහි උපන් නිරිසතෙකුමෙන්ද ආපොධාතුව යහපත්සේ දක්නාවූ ධාතුමනසිකාර යොගීන්ට මේ ශරීරය නොයෙක්තැන කුහරවී නොයෙක්තැන දෙබල් සෑදී නොයෙක් තැන සිදුරු සෑදී ජලය පිරීසිටි දුවකඳක්මෙන්ද පෘථිවීධාතුව යහපත්සේ දක්නාවූ ධාතුමනසිකාර යොගීන්ට මේ ශරීරය දුවකඳක් දර මිටියක් මැටිගොඩක් රෙදිවැරළි ගොඩක්මෙන්ද පෙනීයනවා ඇත.

මේ රූපධාතුපඤ්චකය අතුරෙන් පෘථිවීධාතුව යහපත්සේ පෙණුනිනම් ඉතිරි ධාතූන්ද පහසුවෙන්ම පෙනියනවා ඇත.

අධ්‍යාත්මික බාහ්‍යධාතූන් අතුරෙන් අධ්‍යාත්මික ධාතූන්කෙරෙහි ‘මමය’ කියා දෘෂ්ටිග්‍රාහවශයෙන්ද ‘මාගේ’ය කියා තෘෂ්ණාග්‍රාහවශයෙන්ද බාහිර වස්තූන්කෙරෙහි වූකලී ‘මාගේ’ය කියා තෘෂ්ණාග්‍රාහ වශයෙන්මද දැඩිසේ අල්වාගැනීම මේ සත්වයා තුළ ඇතිව පවත්නේය.

ඒ එසේමැයි, මේ සත්වයාහට බාහිර ධාතුසමූහය අධ්‍යාත්මික ධාතූන්ගේ පරිවාර සන්තක භාවයෙන් මුත් ආත්මභාවයෙන් නොවැටහේමය. එහෙයින් ඒ බාහිරධාතූන්කෙරෙහි ‘මම’යයි ආත්මදෘෂ්ටි වශයෙන් ගැනීමක්ද නැත්තේය.

මෙසෙයින් යට කියනලද සියලු උපමාවන් හා සියලු ධාතු බලන ක්‍රමයන්ද යහපත්සේ ඉගෙන අධ්‍යාත්මික ධාතුපුඤ්ජය බාහිරධාතූන් හා සසඳාගැනීමෙන් බාහිර ධාතූන්ප්‍රකෘති චක්ෂුසින් යම්සේ දක්නේවේද එමෙන් සියලුම අධ්‍යාත්මික ධාතූන් ඤාණචක්ෂුසින් පිරිසිඳ දක්නාවූ ධාතුමනසිකාරයොගීන්ට අධ්‍යාත්මිකය බාහිරය කියා වෙනසක් නැතිව ධාතුදෙවර්ගය එකකට එකක් අවෙනස්වම පෙනීයනවා ඇත.

එසේ පෙනීගියවිට බාහිරධාතූන් කෙරෙහි ‘මම’යකියා කෙනෙක් සොයාගැනීමට නැත්තේයයි යම්සේ පෙනියේද එපරිද්දෙන් අධ්‍යාත්මිකධාතූන් කෙරෙහිද ‘මම’ය කියා කෙනෙක් සොයාගැනීමට නැත්තේයයි පෙනීයේමය. එසේ පෙනිගියවිට ‘මම’ය කියා වරදවාගන්නාවූ ආත්මදෘෂ්ටිය පහවීමෙන් ආත්මීය භාවයෙන් (මා සන්තකය යන සංඥාවිපර්‍යාසයෙන්) ගෙන ආශාකරන්නාවූ තෘෂ්ණාගෙධයද නැතිවී ශ්‍රමණකෘත්‍යය මස්තකප්‍රාප්තවන්නේය.

මෙහි 'අධිමුත්තක' 'තාලපුට' යන තෙරුන්වහන්සේලා දෙනමගේ වස්තු දක්වනුලැබෙත්.

"තිණකට්ඨසමං ලොකං, යදා පඤ්ඤාය පස්සති,
මමත්තං සො අසංවින්දං, නත්ථි මෙති න සොචති."

අර්ථ:—යො, යම් පුද්ගලයෙක්තෙම; ලොකං, (මමය මාගේ යයි දෘෂ්ටිවශයෙන් ගන්නාලද ස්කන්ධපඤ්චක සඞ්ඛ්‍යාත) සත්ව ලොකය; තිණකට්ඨසමං, තෘණයක් කාෂ්ටයක් හා සමකොට; යදා, යම්කලෙක්හි; පඤ්ඤාය, ප්‍රඥාචක්ෂුසින්; පස්සති, දක්නේවේද. තදා, එසේ දක්නාවූ කාලයෙහි; මමත්තං, (මමයකියා ගතයුතු) ආත්මසාරයක්; අසංවින්දං, නොලබනුයේ; සො, ඒ පුද්ගලතෙම; මෙ, මාගේ; සන්තකං, සතුය කියා ගතයුතු වස්තුසාරයක්; නත්ථි, නැත්තේයයි. ඉති, මෙසේ දැක; නසොචති, (අර්හත්ඵලය ප්‍රතිවේධකිරීමෙන් කිසිම කරුණකිනුදු) ශොක නොකරන්නේය.

මෙසේ බුදුන් ජීවමාන කාලයෙහි 'අධිමුත්තකනම්' එක්තරා ක්ෂීණාශ්‍රවයන්වහන්සේ නමක් විසින් වදාරනලද මේ ගාථාවෙහි ආපරිද්දෙන් සකල සත්පුරුෂයන් විසින්ම මෙම ධාතුමනස්කාරයන් පුරුදු පුහුණුකිරීමෙන් රාගාදි සකල ක්ලෙශ ව්‍යාපාරයන්ගෙන් මිදුනාවූ නිවන්සැප පසක්කරනු පිණිස ව්‍යායම් කටයුත්තේය.

මේ අධිමුත්තක ස්ථවිර වස්තු යි.

---

"කදානුකට්ඨෙච තිණෙලතාච
ඛන්ධෙ ඉමෙහං අමිතෙච ධම්මෙ
අජ්ඣත්තිකානි චෙව බාහිරානිච
සමං තුලෙය්‍යං තදිදං කදාමෙ".

අර්ථ:—අහං, මම; කට්ඨෙච, දූවකඩදවූ; තිණෙච ඛන්ධෙ අතුපතර තණපරඬැල් සමූහදවූ; ලතාචඛන්ධෙ, වැල් සමූහදවූ; බාහිරානිච, බාහිර රූපධාතූන්ද; අමිතෙ, මෙතෙකැයි ප්‍රමාණනොකොට හැක්කාවූ; අජ්ඣත්තිකානි, අධ්‍යාත්මිකවූ; ඉමෙච ධම්මෙ, මේ නාමරූප ධර්මයන්ද; කදානු. කවරනම් කලෙක්හි; සමංතුලෙය්‍යං, සමකර බලන්නෙම්ද. තදිදං, එසේ (සමකරබැලීමෙන් අධ්‍යාත්මික බාහිරධාතු දෙකොටස එකසමානව) පෙනීයන කාලයක්; මෙ, (තාලපුටනම්වූ) මාහට; කදා, කවරනම් කලෙක්හි; භවිස්සති, වන්නේද.

මෙසේ බුදුන් ජීවමාන කාලයෙහි 'තාලපුට'නම් එක්තරා තෙරුන්වහන්සේ නමක් ස්වකීය ශ්‍රමණකෘත්‍යය මස්තකප්‍රාප්තකරගැනීමට ප්‍රථමයෙන් ස්වකීය අධ්‍යාත්මික ධාතුසමූහය බාහිරධාතූන් හා සමවී කවරකලෙක්හි පෙනීයේද්‍යෙයි ප්‍රාර්ථනාවෙන් යුක්තව විවේක ස්ථානයකට පැමිණ අධ්‍යාත්මික බාහිරධාතු දෙවර්ගය ප්‍රඥනමැති හස්තයෙන් ගෙන සසඳාබලනුයේ නොබෝකලකින්ම ධාතුදෙකොටස සදෘශව පෙනීයාමෙන් ශ්‍රමණකෘත්‍යය මස්තකප්‍රාප්තකොටගෙන අනුපාදිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවන්පෑ වදාළසේක.

මේ 'තාලපුට'නම් තෙරුන්වහන්සේමෙන් අධ්‍යාත්මිකබාහිර ධාතුදෙකොටස එකිනෙක සසඳාබැලීමෙන් සදෘශව පෙනී සත්කායදෘෂ්ටිය පහකරදමා නිවන්පැමිණි බුද්ධපුත්‍රයන්වහන්සේලා මෙතෙකැයි ප්‍රමාණනොකොට හැක්කාහුමය.

එහෙයින් නැණවත් සකල සත්පුරුෂයෝම සියලු දුක් කෙළවරකිරීමෙන් නිර්වාණය ප්‍රත්‍යක්ෂකරනුපිණිස මේ 'තාලපුට' ස්ථවිරයන්වහන්සේමෙන් අධ්‍යාත්මිකධාතු සමූහය බාහිරධාතූන් හා සමානව කවර කලෙක්හි පෙනීයේද්‍යෙ යන ප්‍රාර්ථනාවෙන් යුක්තව පෘථිවි ආදි අධ්‍යාත්මිකධාතුසමූහය බාහිරධාතූන් හා සසඳාබැලීමෙන් භාවනානුයොගීව ශාන්තප්‍රණීත නිර්වාණ සුඛප්‍රතිලාභය පිණිස නිතර උත්සාහවඩත්වා.

මේ තාලපුටස්ථවිර වස්තුවයි.

---

තවද අප භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ විසින් සැවත්නුවර සමීපයෙහිවූ දෙව්රම්වෙහෙර වැඩවෙසෙමින් භික්ෂූන්ට වදාරනලද "නතුම්හාක" සූත්‍රග්‍රන්ථවර්ගී සංයුක්තකපාළියෙන් උපුටාගෙන අර්ථ යොජනාව සමග මෙහි දක්වනුලැබේ.

"යං භික්ඛවෙ නතුම්හාකං තං පජහථ තං වො පහීණං හිතාය සුඛාය භවිස්සති. කිඤ්ච භික්ඛවෙ න තුම්හාකං? රූපං භික්ඛවෙ න තුම්හාකං තං පජහථ තං වො පහීණං හිතාය සුඛාය භවිස්සති. සෙය්‍යථාපි භික්ඛවෙ ඉමස්මිං ජෙතවනෙ යං තිණකට්ඨ සාඛාපලාසං තං ජනොහරෙය්‍ය වා දහෙය්‍ය වා යථාපච්චයං වා කරෙය්‍ය. අපිනු තුම්හාකං එවමස්ස අම්හෙ ජනො හරති වා දහති වා යථාපච්චයං වා කරොතීති. නො හෙතං භන්තෙ! තං කිස්සහෙතු? නහි එතං භන්තෙ අත්තා වා අත්තනියංවාති, එවමෙව ඛො භික්ඛවෙ රූපං නතුම්හාකං තං පජහථ තං වො පහීණං හිතාය සුඛාය භවිස්සති."

අපි:—භික්ඛවෙ, මහණෙනි! යං, යම් වස්තුවක්; න තුම්හාකං, තොප හෝ තොපසතු නොවන්නේද; තං, ඒ (තොප හෝ තොපසතු නොවන්නාවූ) වස්තුව; පජහථ, පහකරව්; තං, ඒ තොප හෝ තොපසතු නොවන්නාවූ වස්තුව; පහීණං, පහකරනලද්දේ; වො, තොපට; හිතාය, හිතපිණිස; සුඛාය, සැප පිණිස; භවිස්සති, වන්නේය.

භික්ඛවෙ, මහණෙනි! කිඤ්ච, කවරනම් වස්තුවක්; නතුම්හාකං, තොප හෝ තොපසතු නොවන්නේද? භික්ඛවෙ, මහණෙනි; රූපං, පෘථිවී ආදි පඤ්චවිධරූපසමූහය; නතුම්හාකං, තොප හෝ තොපසතු නොවන්නේය; තං, ඒ තොප හෝ තොපසතු නොවන්නාවූ පෘථිවී ආදි රූපධාතුසමූහය; පජහථ, පහකරව්; තං, ඒ තොප හෝ තොපසතු නොවන්නාවූ පෘථිවී ආදි රූපධාතු සමූහය; පහීණං, පහකරනලද්දේ; වො, තොපට; හිතාය, හිතපිණිස; සුඛාය, සැප පිණිස; භවිස්සති, වන්නේය.

භික්ඛවෙ, මහණෙනි! සෙය්‍යථාපි, උපමාවනම්, ඉමස්මිං ජෙතවනෙ, මේ ජෙතවනනම් උද්‍යානයෙහි; යං තිණකට්ඨසාඛාපලාසං, යම් තෘණකාෂ්ට ශාඛාපත්‍රසමූහයක්; අත්ථි, ඇද්ද. තං, ඒ තෘණකාෂ්ට ශාඛාපත්‍රසමූහය; ජනො, ජනතෙම; ආගන්ත්වා, අවුත්; හරෙය්‍යවා, ගෙනයන්නේවීනමුදු; දහෙය්‍යවා, දවන්නේවීනමුදු; යථාපච්චයං, තමතමන් කැමති පරිද්දක්; කරෙය්‍යවා, කරන්නේවීනමුදු; අථ, එසේ කරන කාලයෙහි; තුම්හාකං, තොපට; අම්හෙ, අප; ජනො, ජනතෙම; හරතිවා, ගෙනයයි කියා හෝ; දහතිවා, දවයි කියා හෝ; යථාපච්චයං, තමතමන්ට කැමති අන්දමක්; කරොතිවා, කරයි කියා හෝ; ඉති, මෙසේ මොරගැසීමක් වැළපීමක්, අපිත්‍රුඅසසා ඇතිවන්නේද?

භන්තෙ, ස්වාමීනි! අම්හාකං, අපට; එතං, එසේ මොරගැසීමක් වැළපීමක්; නොහි, නොවේමය; තං, එසේ නොවීම; කිස්සහෙතු, කවරහෙයින්දයත්?

භන්තෙ, ස්වාමීනි! එතං, ඒ තෘණකාෂ්ට ශාඛාපත්‍රසමූහය; අත්තාවා, ආත්මයක්ද; නහි, නොවේමය; අත්තනියං වා, ආත්මයසතු දෙයක්ද; නහි, නොවේමය. එහෙයිනි.

භික්ඛවෙ, මහණෙනි! එවමෙව ඛො, එපරිද්දෙන්ම; රූපං, පෘථිවී ආදි රූපධාතුපඤ්චකය; නතුම්හාකං, තොප හෝ තොපසතු නොවන්නේය; තං, ඒ තොප හෝ තොපසතු නොවන්නාවූ පෘථිවී ආදි රූපධාතුපඤ්චකය; පජහථ, පහකරව්; තං, ඒ

තොප හෝ තොපසතු නොවන්නාවූ පෘථිවි ආදි රූපධාතුප ස්කන්ධය; පහීණං, පහකරනලද්දේ; වො, තොපට; හිතාය, හිතපිණිස; සුඛාය, සැපපිණිස; භවිස්සති, වන්නේය.

මෙසේ භාග්‍යවත්වූ බුදුරජාණන්වහන්සේ විසින් වදාරන ලද්දාවූ අනාත්ම ප්‍රතිසංයුක්ත ධර්මදේශනාව ශ්‍රවණයකළ භික්ෂූන්වහන්සේලාද බුදුන් විසින් දේශනාකරනලද පරිද්දෙන් පෘථිවි ආදි රූපධාතුපස්කන්ධය ආත්මයක් හෝ ආත්මය සතු දෙයක් නොවනබව යහපත්සේ නුවණින් විමසාබලා අවබොධකොටගෙන ඒ පෘථිවි ආදි පඤ්චවිධ රූපධාතූන් පිළිබඳව පවත්නාවූ සත්කායදෘෂ්ටිය පහකරදැම්මෙන් නිවන් පුර පැමිණ වදාළෝය. එහෙයින් මේ ධාතුමනස්කාරය පුහුණු කරනුකැමති නැණවත්හු වනාහි භාග්‍යවතුන්වහන්සේ විසින් වදාරනලද පරිද්දෙන් අධ්‍යාත්මික රූපධාතුපස්කන්ධය ආත්මයක් හෝ ආත්මයසතු දෙයක් නොවනබව දක්නාපිණිසද "පජහථ"යයි වදාළ පරිද්දෙන් ඒ භික්ෂූන්වහන්සේලාමෙන්ම රූප ධාතුපස්කන්ධය පහකරදමා නිර්වාණය ප්‍රත්‍යක්ෂකරනු පිණිසද "සුඛාය භවිස්සති" යනුවෙන් දෙනලද විවරණශ්‍රීයවූ පරිද් දෙන් සැප ලබනු පිණිසද යටකියනලදපරිද්දෙන් උත්සාහ වඩත්වා.

"අට්ඨිනහාරු සංයුත්තො, ලොහිත මංසලෙපනො,
චම්මකඤ්චුක සඤ්ඡන්නො, නානාධාතුස්ස පූරිතො.

එතාදිසෙන කායෙන, යොමඤ්ඤෙ උන්නාමෙතවෙ,
පරං වා අවජානෙය්‍ය, කිමඤ්ඤත්‍ර අදස්සනා.

යෙ මං කායං මමායන්ති, අන්ධබාලා පුථුජ්ජනා,
වඩ්ඪෙන්ති කටසිංඝොරං, ආදියන්ති පුනබ්භවං.

යෙ මං කායං විවජ්ජෙත්වා, ගූථලිත්තංව පන්නගං,
භවමූලං වමිත්වාන, පරිනිබ්බිංසු අනාසවා.

තස්මා වො නුස්සරං තෙසං, සුඛාය ධාතුභණ්ඩිකං,
මුඤ්චිත්වා අනුපෙක්ඛථ, කුසලො ඨිතිකං යථා.

හත්ථතලෙ ඨපෙත්වාන, පෙක්ඛිත්වා ඛණචක්ඛුනා,
යථා ඉදං තථා එතං, යථා එතං තථා ඉදං,
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච, ධාතුසු මහිං විරජ්ජථ".

අර්ථ:—අයංකායො, මේ කය, අට්ඨිනහාරු සංයුත්තො, (ඇ ට්ත් නිමවි නහරින් වෙළිගියහෙයන්) ඇට නහර දෙකොට සින් යුක්තය; ලොහිතමංසලෙපනො, ලෙයින් තෙමා මසින් ලෙපනයකරනලද්දකි; චම්මකඤ්චුකසඤ්ඡන්නො, චර්මනැමැති

කඤ්චුකයෙන් (සැට්ටයෙන්) හාත්පස වසනලද්දකි; නානා ධාතුස්ස, පෘථිවී ආදී නානා ධාතුසමහාරයෙන්; පූරිතො පිරී පවත්නේය.

යො, යම්කෙනෙක්; එතාදිසෙන, මෙබඳු ස්වභාවක් ඇත්තාවූ; කායෙන, (ධාතුරාශියක්වූ නිසරු) කයින්; උන්නාමෙතවෙ, (ස්වකීය ජාතිගොත්‍ර ධනවන්තතාදිය සලකමින් උඩඟු අහංකාරකම් නැමැති ධ්වජය නගාලීමෙන) තමා උසස්කෙනෙක්කොට; මඤ්ඤෙ, හඟීද. පරංවා, අනිකෙකු හෝ; අවජානෙය්‍ය, (ජාතිගොත්‍රාදී වශයෙන්) පහත් කෙනෙකු කොට හඟීද. තස්ස ඒ පුද්ගලයාගේ; එතං, මේ වැරදී හැඟීමට; අදස්සනා, අධ්‍යාත්මික ආත්මභාව සඞ්ඛ්‍යාත ධාතුරාශිය නුවණැසින් වෙන් වෙන් වශයෙන් (අවුස්සා) නොදැක්ම; අඤ්ඤත්‍ර, හැර; අඤ්ඤං, කියයුතු අනික් කරුණක්නම්, කිං, කිම?

අනධබාලා, (ධාතුචක්ෂුස උපදවා නොගත්හෙයින් අධ්‍යාත්මිකධාතූන් නොපෙනීමෙන්)අඥාන බාලවූ; යෙපුථුජ්ජනා, යම් පෘථග්ජන සත්වකෙනෙක්; ඉමංකායං, (ධාතුරාශියක්වූ) මේ කුණුකය; මමායන්ති, (තෘෂ්ණාවට වාල්ව මමය මාගේයයි) ආලයකරත්ද. තෙ, ඒ පෘථග්ජන සත්වයෝ; ඝොරං, භයානකවූ; කටසිං, ස්වකීය සොහොන්භූමිය හෙවත් ස්වකීය ආත්මභාව සඞ්ඛ්‍යාත නාමරූපධාතුපිණ්ඩය; වඩ්ඪන්ති, වර්ධනය කරත්නාහුය; පුනබ්භවං, නැවත නැවත (භවොත්පත්තිය ගෙනදෙන්නාවූ පුණ්‍ය පුණ්‍ය ආනෙඤ්ජසංස්කාර සඞ්ඛ්‍යාත) කුශලාකුශලකර්මයම; ආදියන්ති, රැස්කරත්නාහුය. යෙ, යම් නුවණැති සත්පුරුෂ කෙනෙක්; ගූථලිත්තං, අසූචි වැකුණාවූ; පන්නාගංඉව, (දුගඳ වහනයවන) සර්පයෙකුමෙන්; ඉමංකායං, (ධාතුරාශියක්වූ) මේ කුණුකය; විවජ්ජෙත්වා, (පිළිකුල්කොට) හැරදමා; භවමූලං, (සංසාරයාගේ පැවැත්මට හෙතුවූ තෘෂ්ණා නමැති) භවමූලය; වධිත්වාන, නසා; අනාසවා, ආශ්‍රව රහිතවූවාහු; හුත්වා, වී, පරිනිබ්බිංසු, පිරිනිවන් පැමිණියාහුද. තස්මා, එහෙයින්; සාධවෙ, සත්පුරුෂවරුනි! වො, තොපි; තෙසං, ඒ පිරිනිවන් පැමිණියාවූ උත්තමයන්වහන්සෙලා; අනුස්සරං, සිහිකරමින්; කුසලො, දක්ෂස්වර්ණභාණ්ඩකයෙක්; ඵව්කං, (වඤ්චාකොට දෙනලද රන්)පොදිය; මුඤ්චිත්වා, ලිහා, යථාපෙක්ඛති, යම්සේ බලයිද; තථා, එපරිද්දෙන්; සුඛාය සැපපිණිස; ධාතුභණ්ඩිකං, (පෘථිවී ආදී අධ්‍යාත්මික) ධාතු පොදිය; මුඤ්චිත්වා, මුදා (ලිහා) අනුපෙක්ඛථ, නුවණැස් යොමා නැවත නැවත බලව්.

සාධවෙ, සත්පුරුෂවරුනි! වො, තෙපි; හත්ථතලෙ,අත්ලෙහි; ඨපෙත්වාන,(ඥාණනැමැති හස්තයෙන් අධ්‍යාත්මික බාහිරධාතු නැමැති මස් සැළිදෙක) තබා; ඉදං, මේ (අධ්‍යාත්මික) ධාතු නැමැති මස්සැළිය; යථා අහං න අස්මි, යම්සේ මම නො වෙම්ද. තථා, එපරිද්දෙන්; එතං, තෙල (බාහිර) ධාතුනැමැති මස්සැළියද, අහං න අස්මි, මම නොවෙමි. එතං, තෙල (බාහිර) ධාතුනැමැති මස්සැළිය; යථා අහං න අස්මි, යම්සේ මම නොවෙම්ද. තථා, එපරිද්දෙන්; ඉදං, මේ (අධ්‍යාත්මික) ධාතුනැමැති මස්සැළියද; අහං න අස්මි, මම නොවෙමි. ඉති, මෙසේ; ඤාණචක්ඛුනා, ඥානචක්ෂුසින්; පෙක්ඛිත්වා, බලා; අජ්ඣත්තිකාසුච ධාතූසුපි, අධ්‍යාත්මික ධාතු නැමැති මස්සැළිය කෙරෙහිද; බහිද්ධාච ධාතූසුපි, බාහිරධාතුනැමැති මස්සැළිය කෙරෙහිද; විරජ්ජථ, නොඇලෙව්.

මේ අධ්‍යාත්මික ධාතූන් එකට ගෙන මෙනෙහිකරන
පිළිවෙළයි.

මෙසේ උද්දෙශයෙහි "නෙසොහමස්මි නෙතං මෙ" යනුවෙන් දක්වනලද පරිද්දෙන් 'මම'ය 'මාගේ' යයි ගන්නාවූ ආත්ම දෘෂ්ටිය හා තෘෂ්ණාවත් පහකිරීමට උපකාරවන්නාවූ පෘථිවි ආදී අධ්‍යාත්මික රූපධාතූන්ගේ සූත්‍රාන්ත ශූන්‍යතානය වශයෙන් විභාගය කියා නිමවනලදී.

**මේ සාමාන්‍යරූපධාතු නිර්දේශයයි.**

---

# VI. විඥානධාතු නිර්දේශය.

"විජානාතීති ඛො භික්ඛවෙ තස්මා විඤ්ඤාණන්ති වුච්චති"

භික්ඛවෙ, මහණෙනි! යං, යම් ධර්මස්වභාවක්; විජානාති, නොයෙක් අයුරෙන් (අරමුණු) දනීද, ඉති, එහෙයින්; තං, ඒ ධර්මස්වභාව; විඤ්ඤාණන්ති, විඥානයයි; වුච්චති, කියනුලැබේ.

මෙසේ "සංයුත්තනිකායෙහි" භාග්‍යවතුන්වහන්සේ විසින් වදාරනලද වචනාර්ථයවූ පරිද්දෙන් විඥානය* නම් නොයෙක් අයුරෙන් රූප ශබ්දාදී අරමුණු දැනීමයි.

හෙද චක්ෂුර්විඥානය, ශ්‍රොත්‍රවිඥානය, ඝ්‍රාණවිඥානය, ජිහ්වාවිඥානය, කාය විඥානය, මනොවිඥානය කියා සවැදෑරුම්වේ.

1. නිල් රත්වන් ආදී ඒ ඒ වර්ණ හමුවූවිට ඇසතුළ පහළවන්නාවූ දැකීම චක්ෂුර්විඥාන නම්

---

* විඥානය, චිත්තය, මානසය යනාදිය සිතට නම්බව සැලකියයුතු.

2. ඒ ඒ විතතජ සංතුජ ශබ්ද හමුවූවිට කනතුළ පහළවන්නාවූ ශ්‍රවණය (ඇසීම) ශ්‍රොත්‍රවිඥාන නමි.

3. ඒ ඒ සුගඳ දුගඳ හමුවූවිට නාසයතුළ පහළවන්නාවූ ගන්ධාඝ්‍රාණය (ගඳගැනීම) ඝ්‍රාණවිඥාන නමි.

4. ලුණුඇඹුල් ආදී ඒ ඒ රස හමුවූවිට දිවතුළ පහළවන්නාවූ රස දැනීම ජිහවාවිඥාන නමි.

5 තද මොළොක් උණුසිසිල්ගති හා සුළං යන මොවුන් අතුරෙන් යම්කිසි ස්පර්ශයක් හමුවූවිට ශරීරයෙහි ඒ ඒ තැන පහළවන්නාවූ දැනීම කායවිඥාන නමි.

6. ශ්‍රද්ධා ශීල ශ්‍රැතත්‍යාගාදිවූද ලොභ ද්වෙෂ මොහාදිවූද යම්කිසි කුසලාකුසල දහම් අරමුණක් හමුවූවිට හෘදයකොෂයතුළ නොයෙක් අයුරෙන් පහළවන්නාවූ දැනීම මනොවිඥාන නමි.

මෙසේ කියනලද විඥානධාතුන් පිළිබඳව ඇතිවන්නාවූ සියලු දුකට මූලාධාරවූ සත්කායදෘෂ්ටියද ඒ සත්කායදෘෂ්ටිය පහකිරීමට උපායවූ ධර්මව්‍යවස්ථා ඥානාලොකය උපදවාගන්නාවූ අන්දමද සැකෙවින් දක්වනුලැබේ.

ඇසතුළ පහළවන්නාවූ චක්ෂුවිඥානයයි කියනලද සිතට ඒ ඒ වර්ණසටහන් පෙනීයනවිට "මම දක්නෙමි" කියා ඇතිකරගන්නාලද වරදවාගැනීම චක්ෂුවිඥානය උඩට නගාගත් සත්කායදෘෂ්ටිය නම්වේ.

කනතුළ පහළවන්නාවූ සිතට ඒ ඒ ශබ්ද ඇසෙනවිට "මම ශබ්ද අසමි" කියා ඇතිකරගන්නාලද වරදවාගැනීම ශ්‍රොත්‍රවිඥානය උඩට නගාගත් සත්කායදෘෂ්ටිය නම්වේ.

නාසයතුළ පහළවන්නාවූ සිතට ඒ ඒ ගඳසුවඳ දැනීයනවිට "මම ගඳ සුවඳ දනිමි" කියා ඇතිකරගන්නාලද වරදවාගැනීම ඝ්‍රාණවිඥානය උඩට නගාගත් සත්කායදෘෂ්ටිය නම්වේ.

දිවතුළ පහළවන්නාවූ සිතට ඒ ඒ රස දැනීයනවිට "මම රස දනිමි" කියා ඇතිකරගන්නාලද වරදවාගැනීම ජිහවාවිඥානය උඩට නගාගත් සත්කායදෘෂ්ටිය නම්වේ.

ශරීරයෙහි ඒ ඒ තැන පහළවන්නාවූ සිත්වලට ස්පර්ශ දැනීයනවිට "මම ස්පර්ශ දනිමි" කියා ඇතිකරගන්නාලද වරදවාගැනීම කායවිඥානය උඩට නගාගත් සත්කායදෘෂ්ටිය නම්වේ

ශ්‍රද්ධා ශීල ශ්‍රැතත්‍යාගාදිවූද ලොභ ද්වෙෂ මොහාදිවූද ඒ ඒ කුසලාකුසල දහම් අරමුණු හෘදයකොෂයතුළ වස්තුරූපාශ්‍රයෙන් පහළවන්නාවූ සිත්වලට නොයෙක් අයුරෙන් දැනීයන

විට "මම දනිමි" කියා ඇතිකරගන්නාලද වරදවාගැනීම මනොවිඥානය උඩට නගාගත් **සත්කායදෘෂ්ටිය** නම්වේ.

එහෙයින් ඇස් කන් නාසාදි ඒ ඒ වාරයන්හි දැකීම් ඇසීම් ආදි ඒ ඒ කෘත්‍යඇත්තාවූ ඒ ඒ විඥානධාතූන් පහළවනවිට අමතුවෙන් පහළවන්නාවූ ආගන්තුක විඥානධාතුමාත්‍රයක්යයි පිරිසිඳ දැනගැනීම පිණිස සියලු සැදැහැතියන් විසින්ම උත්සාහ කටයුත්තේය.

කෙසේද? යත්. රූප කය මහත් විශාල වෘණයක් (වණයක්) මෙන්ද ඇස් කන් නාසාදි ඒ ඒ වාරයන්හි පහළවන්නාවූ සිත් ඒ වණයෙහි ඇතිවූ සංසෙදජ පණුවන්මෙන්ද ගෙන පිරිසිඳියයුතු.

තවද ඇස් කන් නාසාදි වස්තුරූප අතිශයින් ප්‍රසන්නාවූ දිය බුබුලුමෙන්ද වස්තුරූපාශ්‍රයෙන් උපදින්නාවූ සිත් ඒ දියබුබුලුවල දර්ශනයවන ඡායාකාරයෙන්ද ගෙන පිරිසිඳියයුතු.

විඥානයවූකලී නාමධාතුමාත්‍රයක්ය. එහෙයින් ඒ විඥානය ද්‍රව්‍යවශයෙන් ගතයුතු ධාතුවක් නොවන නමුත් ඇස් කන් නාසාදි ප්‍රසාදරූප මතුයෙහි වෙනම පහළවන්නාවූ ආගන්තුක ධාතුවක් වශයෙන් නුවණැසට පෙනීයනතුරු ද්‍රව්‍යාකාරයෙන් ගෙන පිරිසිඳියයුතු. නැවත නැවත මෙනෙහිකිරීමෙන් ධාතු දක්නාවූ නුවණැස පැහැදීගියවිට නාමධාතු ආකාරයෙන්ම පෙනීයනවා ඇත. එසේ නොපෙනී ඒ ඒ විඥානධාතූන් ඡායා කාරයෙන් හෝ දියබුබුළු ආකාරයෙන් හෝ පිළිබිඹු ආකා ර යෙන් හෝ පෙනිගියත් වරදක් නැත්තේය.

දැකීම වෙනම ධාතුමාත්‍රයක, ඇසීම වෙනම ධාතුමාත්‍රයක, ගඳ දැනීම වෙනම ධාතුමාත්‍රයක, යනාදි වශයෙන් ඒඒ විඥාන ධාතූන් වෙන් වශයෙන් පෙනියාමම සත්කායදෘෂ්ටිවිනොදන යට ප්‍රමාණවත්නේය.

ඒ එසේමැයි. ආකාර සලකාබැලීමෙන් දර්ශනයකටයුතු විඥානධාතුව අහකතිබියදී ඒ දර්ශනය "මමය" කියා කෙනෙකු උඩට නගාගෙන "මම දකිමි"යයි ගතහොත් ධර්මව්‍යවස්ථා ඥානය නොලැබීයන්ට පිළිවන. ධර්මව්‍යවස්ථාඥානය නොලැබී නම් සත්කායදෘෂ්ටියෙන් මිදිය නොහේමය.

එහෙයින් චක්ෂුර්විඥානාදි ඒඒ විඥානධාතූන් වෙනම උපදනාවූ ආගන්තුක ධාතුමාත්‍රා වශයෙන් දැක ධර්මව්‍යවස්ථා ඥානාලොකය ඇතිකරගනු පිණිස සකල සත්පුරුෂයන් විසින්ම උත් සාහ කටයුතු. නිර්දේශපාළියෙහි "**විජ්ජුප්පාදුව ආකාසෙ, උප්ප**

ජායන්ති වයන්තිච” යනු වදාළහෙයින් ඒ ඒ විඥානධාතූන්ගේ විදුලියක්සේ ඉතා ශීඝ්‍රව ඉපද නිරුද්ධවන ආකාරයද නුවණැසට පෙනීයන පරිද්දෙන් ගෙන පිරිසිඳියයුතු.

1. නාම රූපධාතු දෙකම ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිවී යනහෙයින් අනිත්‍යය.

2. එසේ අනිත්‍යවූ හෙයින්ම ඒ අනිත්‍යවූ නාමරූපධාතූන් කෙරෙහි බැඳුනු තෘෂ්ණාආලය ඇති සත්වයන්ට කෙළවරක් නැත්තාවූ නාමරූප සැපයීම් දුක්ගෙනදෙමින් කෙළවරක් නැත්තාවූ පිළිදුගුන් දුක් ගෙනදෙමින් කෙළවරක් නැත්තාවූ ආරක්ෂාමූලක දුක් ගෙනදෙමින් කෙළවරක් නැත්තාවූ ජාති ජරා මරණාදි දුක්ගෙනදෙමින් කෙළවරක් නැත්තාවූ අපායික දුක් ගෙනදෙමින් නැවත නැවත පීඩාකරනහෙයින් ඒ නාම රූප ධාතුසමූහය ඒකාන්තයෙන් දුක්පිඩක්ම වන්නේය.

3. ඒ නාම රූප ධාතුසමූහය විදුලියකට දියබුබුලකට බඳුව නිශ්සාර අස්ථිර භාවයෙන් අනාත්ම ධාතුමාත්‍රයක්ම වන්නේ යයි මෙසේ දක්නාවූ විදර්ශනා ඥානාලෝකය වනාහි නිත්‍යය, සැපය, ආත්මය, සත්වයාය, පුද්ගලයාය, ස්ත්‍රිය, පුරුෂයාය යනාදි වශයෙන් වරදවාගන්නාවූ විපරීත දෘෂ්ටි සියල්ලක් විධ්වංසනයකරන්නේය.

මෙසේ කියනලද පරිද්දෙන් නාමරූපධාතූන්ගේ ඇතිව නැතිවීම විදුලියකට බඳුව පෙනීගිය නුවණැත්තන්ට අනිත්‍යය, දුඃඛය, අනාත්මය යන ත්‍රිලක්ෂණයද නාමරූපධාතුසමූහය සත්වයෙක් පුද්ගලයෙක් නොවනබවද මොනවට පෙනීයේමය.

එසේ පෙනීයාමෙන්ම ධර්මව්‍යවස්ථා ඥානාලෝකය මස්තක ප්‍රාප්තකරගන්නේය. එහෙයින් ධර්මසේනාධිපති අනුබුද්ධවූ “ශාරිපුත්‍ර” ස්ථවිරයන්වහන්සේ විසින් යමකී විදුලි උපමාව ගෙනහැරදක්වා වදාරනලදී.

මේ භාවනානුයෝගී සැදැහැවතුන්ගේ ප්‍රයෝජනාය පිණිස සැකෙවින් කියනලද විඥානධාතු ව්‍යවස්ථානයයි.

---

දැන් ඒ විඥානධාතුවූ සිත විස්තරවශයෙන් දැනගනු කැමතියන්ගේ ප්‍රයොජනය පිණිස “අභිධර්මාර්ථසඞ්ග්‍රහ”යෙහි ආ පරිද්දෙන් විස්තරකරනුලැබේ.

විඥානධාතුවූ සිත වනාහි කාමසිතය, රූපසිතය, අරූප සිතය, ලොකොත්තරසිතය කියා භූමිභෙදයෙන් සිව්වැදෑරුම් වේ.

කාමතෘෂ්ණාවට වසගවූ සිත කාමසිත නම්. රූපතෘෂ්ණාවට වසගවූ සිතරූප සිත නම්. අරූපතෘෂ්ණාවට වසගවූ සිත අරූපසිත නම්. ඒ තෙවදෑරුම් තෘෂ්ණාවට වසගනොව ත්‍රෛභූමික දුඃඛවෘත්තයෙන් එතරවූ සිත ලොකොත්තරසිත නම්.

---

## කාම සිතේ විස්තර.

1 සොම්නස් සහගත දෘෂ්ටිසම්ප්‍රයුක්ත අසංස්කාරික සිතය.
2 සොම්නස් සහගත දෘෂ්ටිසම්ප්‍රයුක්ත සසංස්කාරික සිතය.
3 සොම්නස් සහගත දෘෂ්ටිවිප්‍රයුක්ත අසංස්කාරික සිතය.
4 සොම්නස් සහගත දෘෂ්ටිවිප්‍රයුක්ත සසංස්කාරික සිතය.
5 උපෙක්ෂා සහගත දෘෂ්ටිසම්ප්‍රයුක්ත අසංස්කාරික සිතය.
6 උපෙක්ෂා සහගත දෘෂ්ටිසම්ප්‍රයුක්ත සසංස්කාරික සිතය.
7 උපෙක්ෂා සහගත දෘෂ්ටිවිප්‍රයුක්ත අසංස්කාරික සිතය.
8 උපෙක්ෂා සහගත දෘෂ්ටිවිප්‍රයුක්ත සසංස්කාරික සිතය.

**මේ ලොභමූල අකුසල් සිත් 8 යි.**

මෙහි සිත සුඛවෙදනාවෙන් යුක්තවීම සොම්නස් සහගතයයිද, මධ්‍යස්තවෙදනාවෙන් යුක්තවීම උපෙක්ෂා සහගතයයිද, මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්තවීම දෘෂ්ටිසම්ප්‍රයුක්තයයිද, මිථ්‍යා දෘෂ්ටියෙන් යුක්තනොවීම දෘෂ්ටිවිප්‍රයුක්තයයිද අන් මෙහෙයීමක් නැතිව ස්වයංබලයෙන් ඇතිවන සිත අසංස්කාරිකයයිද අන් මෙහෙයීමකින් ඇතිවී ඔබලත්වූ සිත සසංස්කාරිකයයිද කියනලදී.

---

1 දෞම්නස් සහගත ප්‍රතිඝසම්ප්‍රයුක්ත අසංස්කාරික සිතය.
2 දෞම්නස් සහගත ප්‍රතිඝ සම්ප්‍රයුක්ත සසංස්කාරික සිතය.

**මේ ද්වෙෂමූල අකුසල් සිත් 2 යි.**

මෙහි සිත දෞම්නස් වෙදනාවෙන් යුක්තවීම දෞම්නස්සහගතයයිද ද්වෙෂයෙන් හෙවත් සැඩපරුෂගතියෙන් යුක්තවීම ප්‍රතිඝසම්ප්‍රයුක්තයයිද කියනලදී.

---

1 උපෙක්ෂාසහගත විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතය.
2 උපෙක්ෂාසහගත උද්ධච්ච සම්ප්‍රයුක්ත සිතය.

**මේ මෝමූහ අකුසල් සිත් 2 යි.**

මෙහි 1. බුදුන්, 2. දහම්, 3. සඟුන්, 4. ත්‍රිශික්ෂාශාසනය, 5. භවයෙන් භවයට සැරිසරා ආ පූර්වකෙළවර, 6. භවයෙන් භවයට සැරිසරා යන්නාවූ අපර කෙළවර, 7. පූර්වාපර දෙකෙළවර,

8. අතීත හෙතුවෙන් ප්‍රත්‍යුත්පන්න ඵලය ප්‍රත්‍යුත්පන්න හෙතුවෙන් අනාගතඵලය යනාදි ක්‍රමයෙන් පවත්නාවූ සංසාර ප්‍රවෘත්තිසඞ්ඛ්‍යාත ප්‍රතීත්‍යසමුත්පාදය යන අටතැන කරන සැකයෙන් යුක්තවූ සිත විචිකිච්ඡා සම්ප්‍රයුක්තයයිද ඖද්ධත්‍යයෙන් හෙවත් නොසන්සුන්ගතියෙන් යුක්තවූ සිත උද්ධච්ච සම්ප්‍රයුක්තයයිද කියනලදී.

අට්ඨා ලොභමූලානි, දොසමූලානි ච ද්වෙ,
මොහමූලානි ච ද්වෙති, ද්වාදසාකුසලා සියුං.

අකුසල් සිත් දොළොස නිමි.

---

1 උපෙක්‍ෂාසහගත චක්‍ෂුර්විඥනය.
2 උපෙක්‍ෂාසහගත ශ්‍රොත්‍රවිඥනය.
3 උපෙක්‍ෂාසහගත ඝ්‍රාණවිඥනය.
4 උපෙක්‍ෂාසහගත ජිහ්වාවිඥනය.
5 දුඃඛසහගත කායවිඥනය.
6 උපෙක්‍ෂාසහගත සම්පටිච්ඡන සිතය.
7 උපෙක්‍ෂාසහගත සන්තීරණ සිතය.

මේ අකුසල විපාක සිත් 7 යි.

මෙහි ඇසතුළ ඉපදී නොයෙක් දෙය දැකීම සිදුකරන්නාවූ සිත චක්‍ෂුර්විඥනයයිද, කනතුළ ඉපදී නොයෙක් ශබ්ද ඇසීම සිදුකරන්නාවූ සිත ශ්‍රොත්‍රවිඥනයයිද, නාසයතුළ ඉපදී නොයෙක් ගඳ සුවඳ ගැනීම සිදුකරන්නාවූ සිත ඝ්‍රාණවිඥනයයිද, දිවතුළ ඉපදී නොයෙක් රසගැනීම සිදුකරන්නාවූ සිත ජිහ්වාවිඥනයයිද පාචකාග්නිය පවත්නාවූ ආමාශය හැර අවශෙෂ ශරීරය ඇතුළත පිටත ඒ ඒ තැන තදගතියෙන් හෝ මොළොක්ගතියෙන් ඒ ඒ දේ අවුත් වැදුණුවිට එය දැනීම සිදුකරන්නාවූ සිත කායවිඥනයයිද, ඇස් කන් නාසාදි පස්තැන අවුත් ගැටෙන අරමුණු බාරගන්නාවූ ආකාරයෙන් හෘදය වස්තුවතුළ උපදින්නාවූ සිතක් සම්පටිච්ඡනයයිද එසේ බාරගත් අරමුණු විමසන්නාවූ ආකාරයෙන් එසිම උපදින්නාවූ සිතක් සන්තීරණයයිද කියනලදී.

---

1 උපෙක්‍ෂාසහගත චක්‍ෂුර්විඥනය.
2 උපෙක්‍ෂාසහගත ශ්‍රොත්‍රවිඥනය.
3 උපෙක්‍ෂාසහගත ඝ්‍රාණවිඥනය.
4 උපෙක්‍ෂාසහගත ජිහ්වාවිඥනය.

5 සුඛසහගත කායවිඥානය.
6 උපෙක්‍ෂාසහගත සම්පටිච්ඡන සිතය.
7 සොම්නස්සහගත සන්තීරණ සිතය.
8 උපෙක්‍ෂාසහගත සන්තීරණ සිතය.

**මේ අහෙතුක කුසල විපාක සිත් 8 යි.**

මෙහි සිත කායිකසුඛවෙදනාවෙන් යුක්තවීම සුඛසහගතයයි කියනලදී. ඉතිරි වචනවල තේරුම යටකී පරිද්දෙන් දතයුතු.

---

1 උපෙක්‍ෂාසහගත පඤ්චවාරාවජ්ජන සිතය.
2 උපෙක්‍ෂාසහගත මනොවාරාවජ්ජන සිතය.
3 සොම්නස් සහගත හසිතොත්පාද සිතය.

**මේ අහෙතුක ක්‍රියා සිත් 3 යි.**

මෙහි "පඤ්චවාරාවජ්ජන" යනම් ඇස් කන් නාසාදි පස්තැන අවුත් ගැටෙන අරමුණු මෙනෙහිකරන්නාවූ ආකාරයෙන් හෘදයවස්තුවතුළ උපදින්නාවූ සිතකි "මනොවාරාවජ්ජන" යනම් හෘදයවස්තු ආශ්‍රයෙන් පවත්නා භවඞ්ග සන්තතියෙහි අවුත් ගැටෙන අරමුණු මෙනෙහිකරන්නාවූ ආකාරයෙන් උපදින්නාවූ සිතකි. "හසිතොත්පාද" යනම් බුදුන් රහතුන්ට ඖදාරික දුශ්චරිත භවොත්පත්තියෙන් මුක්තවූ තමතමන්වහන්සේගේ ආත්මභාවසම්පත්තිය අරමුණුවීමෙන් තුටුපහටු ආකාරය ඇති කරවමින් උපදින්නාවූ සිතකි.

සත්තා කුසලපාකානි, පුඤ්ඤපාකානි අට්ඨධා
ක්‍රියා චිත්තානි තිණීති, අට්ඨාරස අහෙතුකා.

මෙසේ කියා නිමවනලද අකුසල්සිත් දොළොස හා අහෙතුක සිත් අටළොස ශ්‍රද්ධා ස්මෘති හිරි ඔත්තප්ප ආදි කිසිම ශොභන ධර්මයක් හා සමග යෙදීමක් නැතිහෙයින් අශොභන සිත්යයි ව්‍යවහාරකරනුලැබෙත්.

---

**මෙහි වෙදනාභෙදයෙන්**

සුඛ සහගත සිත් 1. දුඃඛ සහගත සිත් 1. සොම්නස් සහගත සිත් 6. දොම්නස් සහගත සිත් 2. උපෙක්‍ෂා සහගත සිත් 20. මේ සියල්ල පිඩුකළවිට සිත් 30 කි.

**සම්ප්‍රයොග විප්‍රයොග භෙදයෙන්**

සම්ප්‍රයුක්ත සිත් 8. විප්‍රයුක්ත සිත් 22. මේ දෙකොටස පිඩු කළවිටද සිත් 30 කි.

### අසංස්කාරික සසංස්කාරික භෙදයෙන්

අසංස්කාරික සිත් 25. සසංස්කාරික සිත් 5. මේ දෙකොටස පිඩුකළවිට ද සිත් 30 කි.

මෙහි චිත්තවිභාගය පහසුවන්නු පිණිස මොමූහ දෙසිත සහ අහෙතුකසිත් අටලොස අසංස්කාරිකයන්කොට දක්වීමු

**අශොභන සිත් සමතිස නිමි.**

---

1 සොම්නස් සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික සිතය.
2 සොම්නස් සහගත ඥානසම්ප්‍රයුක්ත සසංස්කාරික සිතය.
3 සොම්නස් සහගත ඥානවිප්‍රයුක්ත අසංස්කාරික සිතය.
4 සොම්නස් සහගත ඥානවිප්‍රයුක්ත සසංස්කාරික සිතය.
5 උපෙක්ෂා සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික සිතය.
6 උපෙක්ෂා සහගත ඥානසම්ප්‍රයුක්ත සසංස්කාරික සිතය.
7 උපෙක්ෂා සහගත ඥානවිප්‍රයුක්ත අසංස්කාරික සිතය.
8 උපෙක්ෂා සහගත ඥානවිප්‍රයුක්ත සසංස්කාරික සිතය.

**මේ කාමාවචර කුසල් සිත් 8 යි.**

---

1 සොම්නස් සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික සිතය.
2 සොම්නස් සහගත ඥානසම්ප්‍රයුක්ත සසංස්කාරික සිතය.
3 සොම්නස් සහගත ඥානවිප්‍රයුක්ත අසංස්කාරික සිතය.
4 සොම්නස් සහගත ඥානවිප්‍රයුක්ත සසංස්කාරික සිතය.
5 උපෙක්ෂා සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික සිතය.
6 උපෙක්ෂා සහගත ඥානසම්ප්‍රයුක්ත සසංස්කාරික සිතය.
7 උපෙක්ෂා සහගත ඥානවිප්‍රයුක්ත අසංස්කාරික සිතය.
8 උපෙක්ෂා සහගත ඥානවිප්‍රයුක්ත සසංස්කාරික සිතය.

**මේ සහෙතුක කාමාවචර මහාවිපාක සිත් 8 යි.**

---

1 සොම්නස් සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික සිතය.
2 සොම්නස් සහගත ඥානසම්ප්‍රයුක්ත සසංස්කාරික සිතය.
3 සොම්නස් සහගත ඥානවිප්‍රයුක්ත අසංස්කාරික සිතය.
4 සොම්නස් සහගත ඥානවිප්‍රයුක්ත සසංස්කාරික සිතය.
5 උපෙක්ෂා සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික සිතය.
6 උපෙක්ෂා සහගත ඥානසම්ප්‍රකත්ත සසංස්කාරික සිතය.
7 උපෙක්ෂා සහගත ඥානවිප්‍රයුක්ත අසංස්කාරික සිතය.
8 උපෙක්ෂා සහගත ඥානවිප්‍රයුක්ත සසංස්කාරික සිතය.

**මේ සහෙතුක කාමාවචර මහාක්‍රියා සිත් 8 යි.**

---

මෙහි ඥානයෙන් යුක්තවූ සිත ඥානසම්ප්‍රයුක්තයයිද ඥානයෙන් යුක්තනොවූ සිත ඥානවිප්‍රයුක්තයයිද කියනලදී. සෙසු වචනවල තේරුම යටකී නයින් දතයුතු.

වේදනා ඤාණ සඞ්ඛාර, භෙදෙන චතුවීසති,
සහෙතු කාමාවචර, පුඤ්ඤපාක ක්‍රියාමතා.

මෙසේ කියනලද කුසල්සිත් 8 ය, විපාකසිත් 8 ය, ක්‍රියාසිත් 8 ය, යන කාමසිත් (24) ශ්‍රද්ධා සමෘති හිරි ඔත්තප්පාදි ශොභන චෛතසික ධර්මයන් හා යෙදෙන හෙයින් "ශොභන" සිත්යයි ව්‍යවහාර කරනුලැබෙත්.

---

### මෙහි වේදනා භේදයෙන්

සොම්නස් සහගත සිත් 12 ය, උපෙක්ෂා සහගත සිත් 12 ය, යන දෙකොටස පිඩුකළවිට කාමශොභන සිත් (24) කි.

### සම්ප්‍රයොග විප්‍රයොග භෙදයෙන්

සම්ප්‍රයුක්ත සිත් 12 ය, විප්‍රයුක්ත සිත් 12 ය, යන දෙකොටස පිඩු කළවිටද කාමශොභන සිත් (24) කි.

### අසංස්කාරික සසංස්කාරික භෙදයෙන්

අසංසකාරික සිත් 12 ය, සසංස්කාරික සිත් 12 ය, යන දෙකොටස පිඩුකළවිටද කාමශොභන සිත් (24) කි.

### යුග වශයෙන්

පළමුවන දෙවන සිත්දෙක (2) පළමුවන යුගයනම් වේ. තුන්වන සතරවන සිත්දෙක (2) දෙවන යුගයනම්වේ. පස්වන සවන සිත්දෙක (2) තුන්වන යුගයනම්වේ. සත්වන අටවන සිත්දෙක (2) සතරවන යුගයනම්වේ.

මෙසේ කුසලවිපාක ක්‍රියා යන තුන්කොටසෙහිම යුග සතර බැගින් ලැබෙන හෙයින් කාමශොභන සිත් (24) හි යුගදොළොසක් (12) වන්නාහුය.

### කාමශොභන සිත් 24 නිමි.

---

මෙසේ කියනලද කාමශොභන සිත් (24) හා යටකියනලද අශොභන සිත් (30) යන කාමාවචර සිත් (54) හි අකුසල්සිත් (12)කි. කුසල් සිත් (8)කි. විපාක සිත් (23) කි. ක්‍රියාසිත් (11)කි. මේ සතරකොටස පිඩුකළකල්හි කාමාවචර සිත් (54) සම්පූර්ණවේ.

කාමෙ තෙ වීස පාකානි, පුඤ්ඤා පුඤ්ඤානි වීසති,
එකාදස ක්‍රියාචෙති, චතුපඤ්ඤාස සබ්බථා.

**මෙතෙකින් කාමසිතේ විස්තර කිශා නිමවනලදී.**

---

## රූප සිත් විස්තර.

1. ප්‍රථමධ්‍යාන කුසලසිතය.
2. ද්විතීයධ්‍යාන කුසලසිතය.
3. තෘතියධ්‍යාන කුසලසිතය.
4. චතුර්ථධ්‍යාන කුසලසිතය
5. පඤ්චමධ්‍යාන කුසලසිතය.

**මේ රූපාවචර කුසල් සිත් 5 යි.**

---

1. ප්‍රථමධ්‍යාන විපාකසිතය.
2. ද්විතීයධ්‍යාන විපාකසිතය.
3. තෘතීයධ්‍යාන විපාකසිතය.
4. චතුර්ථධ්‍යාන විපාකසිතය.
5. පඤ්චමධ්‍යාන විපාකසිතය.

**මේ රූපාවචර විපාක සිත් 5 යි.**

---

1. ප්‍රථමධ්‍යාන ක්‍රියා සිතය.
2. ද්විතීයධ්‍යාන ක්‍රියා සිතය.
3. තෘතියධ්‍යාන ක්‍රියා සිතය.
4. චතුර්ථධ්‍යාන ක්‍රියා සිතය.
5. පඤ්චමධ්‍යාන ක්‍රියා සිතය.

**මේ රූපාවචර ක්‍රියා සිත් 5 යි.**

---

මෙහි (1) නොයෙක් අන්දමින් කල්පනාකිරීම් ලක්‍ෂණ විතර්කය, (2) අරමුණේ සම්ප්‍රයුක්ත ධර්මයන් හැසිරවීම් ලක්‍ෂණ විචාරය, (3) අරමුණේ සම්ප්‍රයුක්ත ධර්මයන් පිණවීම් ලක්‍ෂණ ප්‍රීතිය, (4)අරමුණේ සුවපහස් විඳීම් ලක්‍ෂණ සුඛය, (5) අරමුණේ සම්ප්‍රයුක්ත ධර්මයන් එකඟකිරීම් ලක්‍ෂණ ඒකාග්‍රතාය, යන අඞ්ග පසින් යුක්තව පළමුකොට උපදින සිත ප්‍රථමධ්‍යාන සිතනම් වේ. එයින් පළමුවන අඞ්ගය හැර ඉතිරි සතර අඞ්ගයෙන් යුක්තව දෙවනුව උපදින සිත ද්විතීයධ්‍යාන සිතනම්වේ. පළමුවන දෙවන අඞ්ගදෙක හැර ඉතිරි තුන් අඞ්ගයෙන් යුක්තව තෙවනුව උපදින සිත තෘතීයධ්‍යාන සිතනම්වේ. පළමුවන දෙවන තුන්වන අඞ්ගතුන හැර ඉතිරි අඞ්ගදෙකින් යුක්තව සතරවෙනුව උපදින සිත චතුර්ථධ්‍යාන සිතනම්වේ. උපෙක්‍ෂාව හා ඒකාග්‍රතාව යන අඞ්ගදෙකින් යුක්තව පස්වෙනුව උපදින සිත පඤ්චමධ්‍යාන සිත නම්වේ. (මේ පඤ්චමධ්‍යාන චිත්තයෙහි සුඛ වෙදනාව නොයෙදී ඒ වෙනුවට උපෙක්‍ෂා වෙදනාව යෙදෙනබව දතයුතු.

යම්සේ රෝද තට්ටු අමරා වීය ඊරියකඳ ආදි අවයව සමූහ යට රථයයි ව්‍යවහාරකරන්නේවේද එමෙන් විතක්කය,විචාරය, ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාය, යන ධර්මසමූහයට ධ්‍යානයයි ව්‍යව හාරකරනබව දතයුතු.

වෙදනා භෙදයෙන් කුසල විපාක ක්‍රියා යන තුන්කොටසෙහි ප්‍රථම ද්විතීය තෘතීය චතුර්ථධ්‍යාන සිත් දොළොස (12) සුඛ වෙද නාවෙන් යුක්තයයිද පඤ්චමධ්‍යාන සිත් තුන (3) උපෙක්ෂා වෙදනාවෙන් යුක්තයයිද දතයුතු.

පඤ්චධාඣාන භෙදෙන, රූපාවචර මානසං,
පුඤ්ඤපාකක්‍රියා භෙදා, තං පඤ්චදසධා භවෙ.

**මෙතෙකින් රූප සිතේ විස්තර කිසා**
**නි ම ව න ල දි.**

---

**අරූපසිතේ විස්තර.**

1. ආකාසානඤ්චායතන කුසලසිතය.
2. විඤ්ඤාණඤ්චායතන කුසලසිතය.
3. ආකිඤ්චඤ්ඤායතන කුසලසිතය.
4. නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසලසිතය.

**මේ අරූපාවචර කුසල් සිත් 4 යි.**

---

1. ආකාසානඤ්චායතන විපාකසිතය.
2. විඤ්ඤාණඤ්චායතන විපාකසිතය.
3. ආකිඤ්චඤ්ඤායතන විපාකසිතය.
4. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන විපාකසිතය.

**මේ අරූපාවචර විපාක සිත් 4 යි.**

---

1. ආකාසානඤ්චායතන ක්‍රියා සිතය
2. විඤ්ඤාණඤ්චායතන ක්‍රියා සිතය.
3. ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා සිතය.
4. නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා සිතය.

**මේ අරූපාවචර ක්‍රියා සිත් 4 යි.**

---

මෙහි (1) ආකාශ කසිණයහැර ඉතිරි නවවිධ කසිණයන් අතු රෙන් යම්කිසි කසිණයකින් උගුළුවාගන්නාලද ආකාශ ප්‍රඥ ප්තිය අනන්තවශයෙන් මෙනෙහි කිරීමෙන් උපදවනලද ධ්‍යාන චිත්තය ආකාසානඤ්චායතන සිතනම්වේ. (2)ආකාසානඤ්චාය

තන ධ්‍යානචිත්තය අනන්ත වශයෙන් මෙනෙහි කිරීමෙන් උප දවනලද ධ්‍යානචිත්තය විඤ්ඤාණඤ්චායතන සිත නම්වේ. (3) ඒ ආකාසානඤ්චායතන ධ්‍යානචිත්තයම කිසිවක් නැත්තේයයි නාසත්තිභාව ප්‍රඥප්තිකොටගෙන මෙනෙහිකිරීමෙන් උපදවන ලද ධ්‍යානචිත්තය ආකිඤ්චඤ්ඤායතන සිත නම්වේ. (4) ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානචිත්තය ශාන්තවශයෙන් ගෙන මෙනෙහිකිරීමෙන් උපදවනලද ධ්‍යානචිත්තය නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සිත නම්වේ.

මේ අරූප සිත් දොළොස(12)රූපපඤ්චමධ්‍යාන චිත්තයමෙන් උපෙක්‍ෂා එකාග්‍රතා යන අඞ්ගවය හා සම්ප්‍රයොගවනහෙයින් පඤ්චමධ්‍යානය යන නාමයෙන් ව්‍යවහාරවනබව දතයුතු.

ආලම්බනප්පභෙදෙන, චතුධාරූප මානසං,
පුඤ්ඤපාක ක්‍රියා භෙදා, පුන වාදසධාසිතං.

**මෙතෙකින් අරූපසිතේ විස්තර කියා නිමවනලදි.**

---

**ලොකොත්තර සිතේ විස්තර.**

1. ශ්‍රොතාප්‍රාප්ති මාර්ගසිතය.
2. සකෘදාගාමි මාර්ගසිතය.
3. අනාගාමි මාර්ගසිතය.
4. අර්හත් මාර්ගසිතය.

**මේ ලොකොත්තර කුසල් සිත් 4 යි.**

---

1. ශ්‍රොතාප්‍රාප්ති ඵලසිතය.
2. සකෘදාගාමිඵල සිතය.
3. අනාගාමි ඵල සිතය.
4. අර්හත් ඵල සිතය.

**මේ ලොකොත්තර විපාක සිත් 4 යි.**

---

මෙහි(1) නිවන් අරමුණුකිරීමෙන් සතරඅපායෙහි උපදවන කෙලෙස් කසට පහකරදමා පළමුකොටම පහළවන්නාවූ අෂ්ටාඞ්ගිකමාර්ගයෙන්යුත් කුසල් සිත ශ්‍රොතාප්‍රාප්ති මාර්ගසිත නම්වේ.

(2) මේ මිනිස්ලොවට ප්‍රතිසන්ධි වශයෙන් වරක් පැමිණීම ඇති පුද්ගලයාගේ අෂ්ටාඞ්ගික මාර්ගයෙන් යුත් කුසල් සිත සකෘදාගාමි මාර්ග සිත නම්වේ.

(3) මේ මිනිස්ලොවට ප්‍රතිසන්ධි වශයෙන් පැමිණීමක් නැති පුද්ගලයාගේ අෂ්ටාඞ්ගික මාර්ගයෙන් යුත් කුසල් සිත **අනාගාමි මාර්ග සිත** නම්වේ.

(4) සියලු කෙලෙසුන්කෙරෙන් දුරුවූ හෙයින් සකල ලොක වාසීන්ගේ මාහැඟි පූජාසත්කාර පිළිගැනීමට සුදුසු රහත් බවට හෙතුවූ අෂ්ටාඞ්ගික මාර්ගයෙන් යුත් කුසල් සිත **අර්හත්මාර්ග සිත** නම්වේ. මේ නයානුසාරයෙන් ඵල සිතද තේරුම්ගතයුතු.

චතුමග්ගප්පභෙදෙන, චතුධා කුසලං තථා,
පාකං තස්ස ඵලත්තාති, අට්ඨධානුත්තරං මතං.

**මෙතෙකින් සංක්ෂෙප ලොකොත්තර සිතේ විභාග කියා නිමවනලදී.**

---

මේ දක්වා කියනලද සංක්ෂෙප සිත් (89) හි **ජාතිවශයෙන්** අකුසල් සිත් (12) ක්ද. කුසල් සිත් (21) ක්ද. විපාක සිත් (36) ක්ද. ක්‍රියා සිත් (20) ක්ද. **භූමි වශයෙන්** කාමසිත් (54) ක්ද. රූපසිත් (15) ක්ද. අරූප සිත් (12) ක්ද. ලොකොත්තරසිත් (8) ක්ද. වන්නාහුය:—

ද්වාදසා කුසලා නෙවං, කුසලා නෙක වීසති,
ඡත්තිංසෙව විපාකානි, ක්‍රියා චිත්තානි වීසති.

චතුපඤ්ඤාසධා කාමෙ, රූපෙ පන්න රසීරයෙ,
චිත්තානි ද්වාදසා රූපෙ, අට්ඨධානුත්තරෙ තථා.

**මේ සංක්ෂෙපනයෙහි ලැබෙන සිත් (89) යි.**

---

ලොකොත්තර සිත **සමාපත්ති** ලාභීන්ට ධ්‍යාන සම්ප්‍රයුක්තව ලැබෙන හෙයින් එකි එකි ලොකොත්තර සිතක් ධ්‍යාන පඤ්චකයාගේ වශයෙන් පස් පස් වැදෑරුම්වේ. ඒ මෙසේයි:—

(1) විතර්කය, විචාරය, ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාය, යන ධ්‍යානාඞ්ග පඤ්චකයෙන් යුක්ත **ප්‍රථමධ්‍යාන ශ්‍රොතාප්‍රාප්තිමාර්ග සිතය.**

(2) විචාරය, ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාය, යන ධ්‍යානාඞ්ග චතුෂ්කයෙන් යුක්ත **ද්විතීයධ්‍යාන ශ්‍රොතාප්‍රාප්තිමාර්ග සිතය.**

(3) ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාය, යන ධ්‍යානාඞ්ග ත්‍රිකයෙන් යුක්ත **තෘතීයධ්‍යාන ශ්‍රොතාප්‍රාප්තිමාර්ග සිතය.**

(4) සුඛය, ඒකාග්‍රතාය, යන ධ්‍යානාඞ්ගද්විකයෙන් යුක්ත **චතුර්ථ ධ්‍යානශ්‍රොතාප්‍රාප්තිමාර්ග සිතය.**

(5) උපෙක්ෂාය, ඒකාග්‍රතාය, යන ධ්‍යානාඞ්ගද්විකයෙන් යුක්ත **පඤ්චමධ්‍යාන ශ්‍රොතාප්‍රාප්තිමාර්ග සිතය.**

**මේ ශ්‍රොතාප්‍රාප්ති මාර්ග සිත් 5 යි.**

---

ඉතිරි ලොකොත්තර සිත් සතද මේ නයින් ධ්‍යානාඞ්ග සම්ප්‍රයුක්තකොට ගත්කල්හි මාර්ගසිත් (20) ක් හා ඵලසිත් (20) ක්ද වීමෙන් ලොකොත්තර සිත සමසතළිස් (40) ප්‍රභෙදවේ.

මේ විස්තර ක්‍රමයෙහි කාමසිත් (54) හැර ඉතිරි රූපාවචර අරූපාවචර ලොකොත්තර යන සියලුම සිත් ප්‍රථමධ්‍යානාදි ධ්‍යාන නාමයෙන් ව්‍යවහාරවනබව දතයුතු.

හේ මෙසේයි :—

| | |
|---|---|
| ප්‍රථමධ්‍යාන සිත් | 11 යි. |
| ද්විතීයධ්‍යාන සිත් | 11 යි. |
| තෘතීයධ්‍යාන සිත් | 11 යි. |
| චතුර්ථධ්‍යාන සිත් | 11 යි. |
| පඤ්චමධ්‍යාන සිත් | 23 යි. |

මේ ධ්‍යාන සිත් (67) සමඟ කාමසිත් (54) පිඩුකළකල්හි සිත් (121) ක් වේ. එයින් ප්‍රථමධ්‍යානය හා සම්ප්‍රයොගවූ කුශල විපාකක්‍රියා වශයෙන් රූපාවචර සිත් තුනය. එසේම ප්‍රථමධ්‍යානය හා සම්ප්‍රයොගවූ මාර්ගඵල වශයෙන් ලොකොත්තරසිත් අටය යන මේ එකොළොස්දෙන ප්‍රථමධ්‍යාන චිත්තයෝයි. මේ එකොළොසෙහි ලෞකික සිත්(3)කි. ලෝකොත්තර සිත්(8)කි. කුසල් සිත් (5) කි. විපාක සිත් (5) කි. ක්‍රියාසිත් (1) කි. මේ නයානුසාරයෙන් චතුර්ථධ්‍යාන සිත් එකොළොස දක්වා චිත්ත පරිච්ඡෙදයත් ස්වරූපවිභාගයත් දතයුතු. පඤ්චමධ්‍යානයට අරූප සිත් දොළොසද ඇතුළත්වනහෙයින් චිත්තසඞ්ඛ්‍යාව තෙවිස්සක් වීතිබේ. ඒ තෙවිස්සෙහි ලෞකිකසිත් (15) කි. ලොකොත්තර සිත් (8) කි. කුසල්සිත් (9) කි. විපාකසිත් (9) කි. ක්‍රියා සිත් (5) කි.

ඉත්ථමෙකූන නවුති, ප්පභෙදං පනමානසං,
එකවීස සතංවාථ, විභජන්ති විචක්ඛණා.

**මේ විස්තරනයෙහි ලැබෙන සිත් (121) යි.**

නානානය වශයෙන් විශෙෂ විභාග කැමැති සත්පුරුෂයන් විසින් අප විසින් ලියනලදුව මුද්‍රණයකර තිබෙන "**පරමාර්ථ ස්වරූප භෙදනිය**" නම්වූ පොත බලා ඉගෙනගතයුතු.

**චිත්තසඞ්ග්‍රහ විභාගය නිමි.**

---

**දැන් චෛතසික සඞ්ග්‍රහවිභාගය කියනුලැබේ.**

මෙසේ බෙදා දක්වනලද සිත නොයෙක් පැහැයෙන් යුත් එලිය නූල් වැටෙන මාණික්‍යරත්නයක්සේ පිරිත් අවුත් සපශී

වන අරමුණු බෙලෙන් හටගන්නාවූ ඵස්සය, වෙදනාව, සංඥාව, ආදි ගති දෙපනසකින් යුක්තවනබව දතයුතු. ඒ ගති දෙපනස සිත හා එකතුව ඉපදීමය (1) සිත හා එකතුව නිරුද්ධවීමය (2) සිත හා එකතුව අරමුණුගැනීමය (3) සිත හා සමාන නිශ්‍රය (4.) යන සතර සම්ප්‍රයොග ලක්‍ෂණයෙන් යුක්තව සිතේ උපදින හෙයින් "**චෛතසික**"යෝයයි ව්‍යවහාරකරනු ලැබෙත්.

ඒ එසේමැයි. සිත අරමුණු දැනීම්මාත්‍රයමුත් අන් යමක් කට හැකි ධර්මයක් නොවේ. **ස්පර්ශය, විඳීමය, ඇඳිනීමය,** තමා හා යෙදෙන ධර්මයන් **මෙහෙයීමය, සිත එකාගකිරීමය,** යන ආදිය වනාහි "**චෛතසික**" ක්‍රියාවෝයි.

එකුප්පාද නිරොධාච, එකාලම්බන වත්ථුකා,
චෙතො යුත්තා විපඤ්ඤාස, ධම්මා චෙතසිකා මතා.

---

ඒ දෙපනස් "චෛතසික" ස්වරූපයෝනම්:—

**ඵස්සය**-අරමුණෙහි සිත සැපීම් ලක්‍ෂණය.
**වෙදනාව**-අරමුණුරස විඳීම් ලක්‍ෂණය.
**සඤ්ඤාව**-අරමුණු හැඳිනීම් ලක්‍ෂණය.
**චෙතනාව**-සම්ප්‍රයුක්ත ධර්මයන් යෙදවීම් ලක්‍ෂණය.
**එකග්ගතාව**-අරමුණෙහි සිත එකගකිරීම් ලක්‍ෂණය.
**ජීවිතෙන්ද්‍රිය**-සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ ජීවනලක්‍ෂණය.
**මනසිකාරය**-අරමුණු මෙනෙහිකිරීම් ලක්‍ෂණය.

**මේ සත්දෙන සියලු සිත්වලම එකහෙළා යෙදෙන හෙයින් සර්ව චිත්ත සාධාරණ චෛතසිකයෝ නම් වෙත්.**

**විතක්කය**-සිත පළමුකොට අරමුණට නැංවීම් ලක්‍ෂණය.
**විචාරය**-සිත අනුප්‍රබන්ධවශයෙන් අරමුණේ ඔබා තැබීම් ලක්‍ෂණය.
**අධිමොක්ඛය** අරමුණු විනිශ්චය කිරීම් ලක්‍ෂණය.
**විරිය**-සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ සූරභාව ලක්‍ෂණය.
**පීතිය**-සම්ප්‍රයුක්ත ධර්මයන් පිණාවීම් ලක්‍ෂණය.
**ඡන්දය**-කටයුතු කිරීමෙහි බලවත් ආශාව.

**මේ සදෙන සමහර සිත්හි පමණක් යෙදෙන හෙයින් ප්‍රකීර්ණක චෛතසිකයෝ නම්වෙත්.**

මෙසේ සර්ව චිත්ත සාධාරණ ප්‍රකීර්ණක වශයෙන් කියනලද "**චෛතසික**"දෙවර්ගය කුශලගතිය එඩිතරකරවනු පිණිස අකුශලයන්කෙරෙන් අන්‍යවූ කුශලයන්හිද අකුශලගතිය එඩිතර කරවනු පිණිස කුශලයන් කෙරෙන් අන්‍යවූ අකුශලයන්හිද යෙදෙනහෙයින් "**අන්‍ය සමාන චෛතසිකයෝ**" නම්වෙත්.

---

**මොහය**-අනුවනගතිය.
**අහිරිකය**-දුසිරිත් කෙරෙහි පිළිකුල් නොකරන ගතිය.
**අනොත්තප්පය**-දුසිරිත් කෙරෙහි භය නොවන ගතිය.
**උද්ධච්චය**-සිත නොතැන්පත් ගතිය.
**ලොභය**-අරමුණු කෙරෙහි ඇලුම් ගතිය.
**දිට්ඨිය**-අරමුණු වරදවා දැකීම.
**මානය**-සිතේ උඩඟු ගතිය.
**දොසය**-(ද්වෙෂය) සිතේ සැඩ ගතිය.
**ඉස්සාව**-අනුන්ගේ සම්පත් නොඉවසීම් ගතිය.
**මච්ඡරිය**-තම සම්පත් සැගවීම් ගතිය. [පසුතැවීම් ගතිය.
**කුක්කුච්චය**-කළ නොකළ දුසිරිත් සුසිරිත් වෙනුවෙන්
**ථීනය**-චිත්තයාගේ අකර්මණ්‍ය ගතිය.
**මිද්ධය**-චෛතසිකයන්ගේ අකර්මණ්‍ය ගතිය.
**විචිකිච්ඡාව**-අරමුණේ විනිශ්චයකට නොපැමිණීම්ගතිය.

**මේ තුදුස්දෙන අකුශල චෛතසිකයෝ නම්වෙත්.**

---

**සද්ධාව**-බුද්ධාදි අකිලිටි අරමුණෙහි සිත පැහැදීම.
**සතිය**-බුද්ධාදි අකිලිටි අරමුණු සිහිකිරීම.
**හිරිය**-දුසිරිත් කෙරෙහි පිළිකුල්කිරීම් ගතිය.
**ඔත්තප්පය**-දුසිරිත් කෙරෙහි භයවීම් ගතිය.
**අලොභය**-අරමුණු කෙරෙහි නොඇලීම් ගතිය.
**අදොසය**-සිතේ සෞම්‍ය ගතිය. (මෛත්‍රිය)
**තත්‍රමජ්ඣත්තතාව**-සම්ප්‍රයුක්ත ධර්මයන් මධ්‍යස්තකරවීම් ගතිය.

**කායපස්සද්ධිය**-චෛතසිකයන්ගේ දැහ රහිත ගතිය.
**චිත්තපස්සද්ධිය**-චිත්තයාගේ දැහරහිත ගතිය.
**කායලහුතාව**-චෛතසිකයන්ගේ ලැහැල්ලු ගතිය.
**චිත්තලහුතාව**-චිත්තයාගේ ලැහැල්ලු ගතිය.
**කායමුදුතාව**-චෛතසිකයන්ගේ මෘදු ගතිය.
**චිත්තමුදුතාව**-චිත්තයාගේ මෘදු ගතිය.
**කායකම්මඤ්ඤතාව**-චෛතසිකයන්ගේ කර්මණ්‍ය ගතිය.
**චිත්තකම්මඤ්ඤතාව**-චිත්තයාගේ කර්මණ්‍ය ගතිය.
**කායපාගුඤ්ඤතාව**-චෛතසිකයන්ගේ ප්‍රගුණ ගතිය.
**චිත්තපාගුඤ්ඤතාව**-චිත්තයාගේ ප්‍රගුණ ගතිය.

මේ චෛතසිකයෝ එකුන්විසි(19)දෙන සංක්‍ෂෙපයෙන් එකුන් සැටක් (59) වූද විස්තරයෙන් එකානූවක් (91) වූද මුළු **ශොභන** සිත්වලම එකහෙළා යෙදෙන හෙයින් **"ශොභන සාධාරණයෝ"** නම්වෙත්.

**සම්මාවාචාව**-සිව්වැදෑරුම් වාග් දුශ්චරිතයෙන් වෙන්වීම.
**සම්මාකම්මන්තය**-තෙවැදෑරුම් කාය දුශ්චරිතයෙන් වෙන්වීම.
**සම්මාආජීවය**-මිථ්‍යා ආජීවයෙන් වෙන්වීම.

**මේ තිදෙන විරති චෛතසිකයෝයි.**

**කරුණාව**-අනන්ත දුඃඛිත සත්වයන් අරමුණුකොට උපදින දයාව.

**මුදිතාව**-අනන්ත සුඛිත සත්වයන් අරමුණුකොට උපදින ප්‍රමෝද්‍යය.

**මේ දෙදෙන අප්‍රමාණ්‍ය චෛතසිකයෝයි.**

**ප්‍රඥෙන්ද්‍රියය**-මොහාන්ධකාරය පහකිරීමෙන් සිත්හි හටගත් නාවූ ඥානාලෝකය.

මෙසේ කියනලද **ශොභන සාධාරණ** එකුන්විස්ස, (19) විරති තුන (3)අප්‍රමාණ්‍යදෙක (2)ප්‍රඥෙන්ද්‍රියය යන පස්විසි (25) දෙන **ශොභන චෛතසිකයෝ** නම්වෙත්.

මෙසේ අන්‍ය සමාන රැසට අයත් චෛතසික තෙළසය(13), අකුසල රැසට අයත් චෛතසික තුදුසය (14), ශොභන රැසට අයත් චෛතසික පස්විස්සය(25), යන මොවුන්ගේ වශයෙන් සියලුම චෛතසිකයෝ දෙපනස්දෙනෙක් (52)වෙති.

තෙරසඤ්ඤ සමානාච-චුද්දසා කුසලා තථා,
සොභනා පඤ්චවීසාති-චිපඤ්ඤාස පවුච්චරෙ.

---

දැන් ස්වරූපවශයෙන් කියා නිමවනලද මේ දෙපනස් චෛතසිකයන්ගේ සම්ප්‍රයොගනය (ඒ ඒ සිත්වල යෙදෙන ක්‍රමය) කියනුලැබේ.

**අන්‍ය සමාන චෛතසික සම්ප්‍රයොගනය.**

**1. ඵස්ස-පෙ-මනසිකාරය යන සබ්බ චිත්ත සාධාරණයෝ සත්දෙන.**

සංක්‍ෂෙපයෙන් එකුන්අනූවක් (89) වූද විස්තරයෙන් එකසිය විසි එකක් (121) වූද සියලු සිත්වලම යෙදෙති.

**2. විතර්ක චෛතසිකය.**

චක්‍ෂුර්විඥානාදි දෙපස් විඥානදශය(10)හැර ඉතිරි කාමසිත් සිව්සාළිසය (44) ප්‍රථමධ්‍යානසිත් එකොළොසය (11) යන පස්පනස් (55) චිත්තයෙහි යෙදෙන්නේය.

### 3. විචාර චෛතසිකය.

විතර්කය යෙදෙන සිත් පස්පනස (55) හා විතර්කයබන සිත් එකොළොස (11) යන සසැට (66) චිත්තයෙහි යෙදෙන්නේය.

### 4. අධිමොක්ෂ චෛතසිකය.

දෙපස්විඥාන දශය (10) විචිකිච්ඡාසහගත චිත්තය යන එකොළොස (11) හැර ඉතිරි අටසැත්තෑ (78) චිත්තයෙහි යෙදෙන්නේය.

### 5. වීර්‍ය්‍ය චෛතසිකය.

දෙපස් විඥාන දශය(10)සන්තීරණ තෙසිතය (3) සම්පටිච්ඡන දෙසිතය (2) පඤ්චද්වාරාවර්ජනය (1) යන සිත් සොළොස (16) හැර ඉතිරි තෙසැත්තෑ (73)චිත්තයෙහි යෙදෙන්නේය.

### 6. ප්‍රීති චෛතසිකය.

උපෙක්‍ෂා සහගත සිත් පස්පනසය (55) චතුර්ථධ්‍යාන සිත් එකොළොසය (11) දෞර්මනස් සහගත දෙසිතය (2) කාය විඥාන දෙසිතය (2) යන සිත් සමසැත්තෑව (70) හැර ඉතිරි එක් පනස් (51) චිත්තයෙහි යෙදෙන්නේය.

### 7. ඡන්ද චෛතසිකය.

අහේතුක සිත් අටළොසය(18)මෝමූහ දෙසිතය (2)යන සිත් සමවිස්ස (20) හැර ඉතිරි එකුන්සැත්තෑ (69) චිත්තයෙහි යෙදෙන්නේය.

පඤ්චපඤ්ඤාසජ්ඣසඞ්ඛි, ඡසත්තති තිසත්තති,
එකපඤ්ඤාස චෙකූන, සත්තති සපකිණ්ණකා.

මේ තෙළෙස් අන්‍ය සමාන චෛතසිකයන්ගේ සත්වැදෑරුම් සම්ප්‍රයොගනය ක්‍රමයෝයි.

---

### අකුසල චෛතසික සම්ප්‍රයොගනය.

1. මොහය, අහිරිකය, අනොත්තප්පය, උද්ධච්චය, යන චෛතසිකයෝ සතරදෙන දොළොස් අකුසල චිත්තයෙහි යෙදෙති.

2. ලොභය, ඊර්ෂ්‍යාව, මාත්සර්‍ය්‍යය, කුක්කුච්චය, යන චෛතසිකයෝ සතරදෙන ද්වේෂමූලික දෙසිතෙහි යෙදෙති.

3. ථීන, මිද්ධ, චෛතසිකයෝ දෙදෙන පස්වැදෑරුම් සසංස්කාරික චිත්තයෙහි යෙදෙති.

4. ලොභ චෛතසිකය,අටවැදෑරුම් ලොභමූලික චිත්තයෙහි යෙදෙන්නේය.

5. දෘෂ්ටි චෛතසිකය, සිව්වැදෑරුම් දෘෂ්ටිසම්ප්‍රයුක්ත චිත්තයෙහි යෙදෙන්නේය.

6. මාන චෛතසිකය, සිව්වැදෑරුම් දෘෂ්ටිවිප්‍රයුක්ත චිත්තයෙහි යෙදෙන්නේය.

**7.** විචිකිච්ඡා චෛතසිකය, විචිකිච්ඡා සහගත චිත්තයෙහි යෙදෙන්නේය.

සබ්බාපුඤ්ඤෙසු චත්තාරො, ලොභමූලෙතයොගතා,
දොසමූලෙසු චත්තාරො, සසඞ්ඛාරෙවයං තථා.

විචිකිච්ඡා විචිකිච්ඡා, චිත්තෙචාති චතුද්දස,
චාදසාකුසලෙ සේවව සම්පයුජ්ජන්ති පඤ්චධා

මේ තුදුස් අකුසල චෛතසිකයන්ගේ පස්වැදෑරුම් සම්ප්‍රයොගනය ක්‍රමයෝයි.

## ශොභන චෛතසික සම්ප්‍රයොගනය.

1. ශ්‍රද්ධාව-පෙ-චිත්තුජ්ජුකතාව යන ශොභන සාධාරණ චෛතසිකයෝ එකුන්විසි (19) දෙන සංක්‍ෂෙපයෙන් එකුන්සැටක්(59)වූද විස්තරයෙන් එකානූවක් (91) වූද සියලුම ශොභන සිත්වල යෙදෙති.

**2.** සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, යන විරති චෛතසිකයෝ තිදෙන (3) අටවැදෑරුම් ලොකොත්තර චිත්තයෙහි නියතවශයෙන්ද අටවැදෑරුම් කාමාවචර කුසලචිත්තයෙහි අනියතවශයෙන්ද මෙසේ සොළොස්(16)සිතක යෙදෙති.

3. කරුණා, මුදිතා, යන අප්‍රමාණ්‍ය චෛතසිකයෝ දෙදෙන රූප ප්‍රථම ද්විතීය තෘතීය චතුර්ථධ්‍යාන සිත් දොළොසය,(12) කාමාවචර කුසල්සිත් අටය (8),එම ක්‍රියාසිත් අටය,(8)යන අටවිසි (28) චිත්තයෙහි යෙදෙති.

**4.** ප්‍රඥෙන්ද්‍රිය චෛතසිකය, ඥානසම්ප්‍රයුක්ත කාමසිත් 12.ය රූපසිත් 15.ය අරූපසිත් 12.ය ලොකොත්තරසිත් 8.ය යන සත්සාළිස් (47) චිත්තයෙහි යෙදෙන්නේය.

එකූනවීසති ධම්මා, ජායන්තෙ කූනසට්ඨිසු,
තයො සොළසචිත්තෙසු, අට්ඨවීසතියං ද්වයං.

පඤ්ඤාපකාසිතා සත්ත, චත්තාලීස විධෙසුපි,
සම්පයුත්තා චතුධෙවං, සොභනෙ සේවව සොභනා.

මේ පස්විසි ශොභන චෛතසියන්ගේ පස්වැදෑරුම් සම්ප්‍රයොගනය ක්‍රමයෝයි.

මෙතෙකින් දෙපනස් චෛතසිකයන්ගේ සොළොස් වැදෑරුම් සම්ප්‍රයොගනය කියා නිමවිය.

### දැන් එකි එකී සිතක යෙදෙන චෛතසිකයන්ගේ ගණන සඞ්ග්‍රහනය කියනුලැබේ.

### ලොකොත්තර චිත්තයෙහි සඞ්ග්‍රහනය.

1. අටවැදෑරුම් ප්‍රථමධ්‍යානික ලොකොත්තරචිත්තයෙහි අන්‍ය සමාන චෛතසික තෙළෙසය(13) අප්‍රමාණ්‍යයන්හැර ශොභන චෛතසික තෙවිස්සය (23)යන චෛතසික සතිස (36) ද.

2. අටවැදෑරුම් විතියධ්‍යානික ලොකොත්තරචිත්තයෙහි ඒ සතිස් චෛතසිකයන්ගෙන් විතර්කය හැර ඉතිරි චෛතසික පන්තිස(35)ද.

3 අටවැදෑරුම් තෘතියධ්‍යානික ලොකොත්තරචිත්තයෙහි ඒ සතිස් චෛතසිකයන්ගෙන් විතර්ක විචාරවය හැර ඉතිරි චෛතසික සූතිස (34) ද.

4. අටවැදෑරුම් ලොකොත්තර චතුර්ථධ්‍යානික චිත්තයෙහි ඒ සතිස් චෛතසිකයන්ගෙන් විතර්ක විචාර ප්‍රීති යන චෛතසිකත්‍රය හැර ඉතිරි චෛතසික තෙතිස (33)ද සඞ්ග්‍රහවන්නාහුය.

5. අටවැදෑරුම් ලොකොත්තර පඤ්චමධ්‍යානික චිත්තයෙහි වනාහි එම චතුර්ථධ්‍යානික චිත්තයෙහි යෙදෙන චෛතසික තෙතිස (33) සුඛ වෙදනාව වෙනුවට මාරුවී ඇතුල්වූ උපෙක්ෂා වෙදනාව සමග සඞ්ග්‍රහවන්නාහුය.

ඡත්තිංසපඤ්චතිංසාච, චතුත්තිංස යථාක්කමං,
තෙත්තිංසවය මිවෙච්චං, පඤ්චධානුත්තරෙ ඨිතා.

මේ ලොකොත්තර චිත්තයෙහි පස්වැදෑරුම් සඞ්ග්‍රහනය ක්‍රමයෝසී.

---

### මහද්ගත චිත්තයෙහි සඞ්ග්‍රහනය.

1. තෙවැදෑරුම් ප්‍රථමධ්‍යානික මහද්ගත චිත්තයෙහි අන්‍ය සමාන චෛතසික තෙළෙසය (13) විරතිත්‍රන හැර ශොභන චෛතසික දෙවිස්සය (22) යන චෛතසික පන්තිස (35) ද.

2. තෙවැදෑරුම් විතියධ්‍යානික මහද්ගත චිත්තයෙහි ඒ පන්තිස් චෛතසිකයන්ගෙන් විතර්කය හැර ඉතිරි චෛතසික සූතිස (34) ද.

3. තෙවදෑරුම් තෘතියධ්‍යානික මහද්ගත චිත්තයෙහි ඒ පන්තිස්චෛතසිකයන්ගෙන් විතර්ක විචාරවය හැර ඉතිරි චෛතසික තෙතිස (33) ද.

4. තෙවැදෑරුම් චතුර්ථධ්‍යානික මහද්ගත චිත්තයෙහි ඒ පන්තිස් චෛතසිකයන්ගෙන් විතර්ක විචාර ප්‍රීතිත්‍රන හැර ඉතිරි චෛතසික දෙතිස (32) ද සඞ්ග්‍රහවන්නාහුය.

5. පසළොස්වැදෑරුම් පඤ්චමධ්‍යානික මහද්ගත චිත්තයෙහි වනාහි ඒ පන්තිස් චෛතසිකයන්ගෙන් විතර්ක විචාර ප්‍රීති තුන හා අප්‍රමාණ්‍යදෙකද හැර ඉතිරි චෛතසික තිස(30) සුඛ වෙදනාව වෙනුවට මාරුවී ඇතුල්වූ උපෙක්‍ෂා වෙදනාව හා සමග සඞ්ග්‍රහවන්නාහුය.

පඤ්චතිංස චතුත්තිංස, තෙත්තිංස ච යථාක්කමං,
ද්වත්තිංසචෙවතිංසෙති, පඤ්චධාව මහග්ගතෙ.

මේ මහද්ගත චිත්තයෙහි පස්වැදෑරුම් සඞ්ග්‍රහනය ක්‍රමයෝයි.

කාමාවචර ධර්මයන්ට වඩා ඡන්දවීර්‍ය්‍ය විමංසාදියෙන් දියුණුවූ හෙයින් මේ රූපාවචර අරූපාවචර චිත්තචෛතසික ධර්මසමූහය මහද්ගත ධර්මයයි ව්‍යවහාරවනබව දතයුතු.

---

## කාම ශොභන චිත්තයෙහි සඞ්ග්‍රහනය.

1. මහාකුසල් පළමුවන යුගයෙහි අන්‍ය සමාන චෛතසික තෙළෙසය (13) ශොභන චෛතසික පස්විස්සය (25) යන චෛතසික අටතිස (38) ද.

2. මහාකුසල දෙවන යුගයෙහි ඒ අටතිස් චෛතසිකයන්ගෙන් ප්‍රඥෙන්ද්‍රියය හැර ඉතිරි චෛතසික සත්තිස (37) ද.

3. මහාකුසල තෙවන යුගයෙහි ඒ අටතිස් චෛතසිකයන්ගෙන් ප්‍රීතිය හැර ඉතිරි චෛතසික සත්තිස (37) ද.

4. මහාකුසල සතරවන යුගයෙහි ඒ අටතිස් චෛතසිකයන්ගෙන් ප්‍රීතිය හා ප්‍රඥෙන්ද්‍රිය හැර ඉතිරි චෛතසික සතිස (36) ද සඞ්ග්‍රහවන්නාහුය.

මේ මහාකුසල චිත්තයෙහි චතුර්විධ සඞ්ග්‍රහනය ක්‍රමයෝයි.

1. මහාක්‍රියා පළමුවන යුගයෙහි අන්‍ය සමාන චෛතසික තෙළෙසය (13) විරතිතුන හැර ඉතිරි ශොභන චෛතසික දෙවිස්සය (22) යන චෛතසික පන්තිස (35) ද.

2. මහාක්‍රියා දෙවන යුගයෙහි ඒ පන්තිස් චෛතසිකයන්ගෙන් ප්‍රඥෙන්ද්‍රිය හැර ඉතිරි චෛතසික සූතිස (34) ද.

3. මහාක්‍රියා තෙවන යුගයෙහි ඒ පන්තිස් චෛතසිකයන්ගෙන් ප්‍රීතිය හැර ඉතිරි චෛතසික සූතිස (34) ද.

4. මහාක්‍රියා සතරවන යුගයෙහි ඒ පන්තිස් චෛතසිකයන්ගෙන් ප්‍රඥෙන්ද්‍රිය හා ප්‍රීතිය හැර ඉතිරි චෛතසික තෙතිස (33) ද සඞ්ග්‍රහවන්නාහුය.

මේ මහාක්‍රියා චිත්තයෙහි චතුර්විධසඞ්ග්‍රහනය ක්‍රමයෝයි.

මහාවිපාක පළමුවන යුගයෙහි අන්‍ය සමාන චෛතසික තෙළෙසය (13) විරතිතුන හා අප්‍රමාණ්‍යදෙකත් හැර ඉතිරි ශොභන චෛතසික විස්සය(20)යන චෛතසික තෙතිස(33)ද.

මහාවිපාක දෙවන යුගයෙහි ඒ තෙතිස් චෛතසිකයන් ගෙන් ප්‍රඥෙන්ද්‍රිය හැර ඉතිරි චෛතසික දෙතිස (32) ද.

මහාවිපාක තෙවන යුගයෙහි ඒ තෙතිස් චෛතසිකයන් ගෙන් ප්‍රීතිය හැර ඉතිරි චෛතසික දෙතිස (32) ද.

මහාවිපාක සතරවන යුගයෙහි ඒ තෙතිස් චෛතසිකයන් ගෙන් ප්‍රඥෙන්ද්‍රිය හා ප්‍රීතිය හැර ඉතිරි චෛතසික එක්තිස (31) ද සඞ්ග්‍රහවන්නාහුය.

මේ මහාවිපාක චිත්තයෙහි චතුර්විධ සඞ්ග්‍රහනය ක්‍රමයෝයි.

අට්ඨතිංස සත්තතිංස, චයං ඡත්තිංසකං සුභෙ,
පඤ්චතිංස චතුත්තිංස, චයං තෙත්තිංසකං ක්‍රියෙ.

තෙත්තිංසපාකෙ බාත්තිංස, චයෙකත්තිංසකං භවෙ,
සහෙතුකාමාවචර, පුඤ්ඤපාකක්‍රියා මනෙ.

මේ කාමශොභන චිත්තයෙහි දොළොස් වැදෑරුම්
සඞ්ග්‍රහනය ක්‍රමයෝයි.

---

## අකුසල චිත්තයෙහි සඞ්ග්‍රහනය.

ලොභමූලික පළමුවන අසංස්කාරික සිතෙහි අන්‍ය සමාන චෛතසික තෙළසය (13) අකුසල සාධාරණ චෛතසික සතරය (4)යන සතළොසව (17) ලොභය හා දෘෂ්ටිය ඇතුළත්කර ගැනීමෙන් චෛතසික එකුන්විස්සක් (19)ද.

ලොභමූලික දෙවන අසංස්කාරික සිතෙහි ඒ සතළොසවම ලොභය හා මානය ඇතුළත්කරගැනීමෙන් චෛතසික එකුන් විස්සක් (19)ද.

ලොභමූලික තෙවන අසංස්කාරික සිතෙහි ප්‍රීතියහැර අන්‍ය සමාන චෛතසික දොළසය(12)අකුසල සාධාරණ චෛතසික සතරය (4) යන සොළසව (16) ලොභය හා දෘෂ්ටිය ඇතුළත් කරගැනීමෙන් චෛතසික අටළොසක් (18) ද.

ලොභමූලික සතරවන අසංස්කාරික සිතෙහි ඒ සොළසවම (16) ලොභය හා මානය ඇතුළත්කරගැනීමෙන් චෛතසික අටළොසක් (18) ද.

ද්වෙෂමූලික පස්වන අසංස්කාරික සිතෙහි ප්‍රීතිය හැර අන්‍ය සමාන චෛතසික දොළසය (12) අකුසල සාධාරණ චෛතසික සතරය (4) ද්වෙෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය කුකෘකුච්ච යන සතර හා සමග චෛතසික විස්සක් (20) ද සඞ්ග්‍රහවෙත්.

ලොභමූලික පළමුවන සසංස්කාරික සිතෙහි අන්‍ය සමාන චෛතසික 13.ය අකුසල සාධාරණ 4.ය යන සතළොසව (17) ලොභ, දෘෂ්ටි, ථීන, මිද්ධ යන සතර ඇතුළත්කරගැනීමෙන් චෛතසික එක්විස්සක් (21) ද.

ලොභමූලික දෙවන සසංස්කාරික සිතෙහි අන්‍ය සමාන චෛතසික 13.ය අකුසල සාධාරණ 4.ය යන සතළොසට (17) ලොභ, මාන, ථීන, මිද්ධ, යන සතර ඇතුළත්කරගැනීමෙන් චෛතසික එක්විස්සක් (21) ද.

ලොභමූලික තෙවන සසංස්කාරික සිතෙහි ප්‍රීතියහැර අන්‍ය සමාන චෛතසික 12.ය අකුසල සාධාරණ 4.ය යන සොළසට (16) ලොභ, දෘෂ්ටි, ථීන, මිද්ධ, යන සතර ඇතුළත්කරගැනීමෙන් චෛතසික විස්සක් (20) ද.

ලොභමූලික සතරවන සසංස්කාරික සිතෙහි ප්‍රීතිය හැර අන්‍ය සමාන චෛතසික දොළසය(12) අකුසල සාධාරණ සතරය (4) යන සොළසට (16) ලොභ,මාන,ථීන, මිද්ධ, යන සතර ඇතුළත්කරගැනීමෙන් චෛතසික විස්සක් (20) ද.

ද්වෙෂමූලික පස්වන සසංස්කාරික සිතෙහි ප්‍රීතිය හැර අන්‍ය සමාන චෛතසික දොළසය (12)අකුසල සාධාරණ සතරය(4) ද්වෙෂ, ඊර්ෂ්‍යා, මාත්සය්‍ය, කුක්කුච්ච, ථීන, මිද්ධ, සදෙනාය යන චෛතසික දෙවිස්ස (22) ද සඞ්ග්‍රහවෙත්.

මොහමූලික උද්ධච්ච සහගත සිතෙහි ඡන්දය හා ප්‍රීතිය හැර අන්‍ය සමාන චෛතසික එකොළොසය (11) අකුසල සාධාරණ සතරය (4) යන චෛතසික පසළොස (15) ද.

මොහමූලික විචිකිච්ඡා සහගත සිතෙහි ඡන්ද, ප්‍රීති, අධිමොක්ෂ, තුන (3)හැර ඉතිරි අන්‍ය සමාන චෛතසිකදශය (10) අකුසල සාධාරණ සතරය (4)විචිකිච්ඡාවය (1)යන චෛතසික පසළොස (15) ද සඞ්ග්‍රහවෙත්.

එකූනවීසඨාරස, වීසෙකවීසවීසති,
වාවීසපන්නරසෙති, සත්තධා කුසලෙඨිතා.

මේ අකුසල චිත්තයෙහි සත්වැදෑරුම් සඞ්ග්‍රහනය ක්‍රමයෝයි.

අහෙතුක චිත්තයෙහි සඞ්ග්‍රහනය.

හසිතොත්පාද චිත්තයෙහි ඡන්දය හැර ඉතිරි අන්‍යසමාන චෛතසික දොළොස (12) ද.

ව්‍යවස්ථාපන චිත්තයෙහි ඡන්දයහා ප්‍රීතිය හැර ඉතිරි අන්‍ය සමාන චෛතසික එකොළොස (11) ද.

සොම්නස්සහගත සන්තීරණ චිත්තයෙහි ඡන්දය හා වීය්‍යය හැර ඉතිරි අන්‍ය සමාන චෛතසික එකොළොස (11) ද.

පඤ්චද්වාරාවර්ජනය,සම්පටිච්ඡන දෙසිත(2) උපෙක්ෂාසන්තීරණතෙසිත(3) යන සිත් පසෙහි ඡන්ද, ප්‍රීති, වීය්‍ය, තුන (3)හැර ඉතිරි අන්‍ය සමාන චෛතසික දශය (10) ද.

දෙපස් විඤ්ඤාණදශයෙහි සබ්බචිත්ත සාධාරණ චෛතසිකයෝ සත්දෙනද (7) සඞ්ග්‍රහවෙත්.

මහාවිපාක දෙවන යුගයෙහි ඒ තෙතිස් චෛතසිකයන් ගෙන් ප්‍රඥෙන්ද්‍රිය හැර ඉතිරි චෛතසික දෙතිස(32) ද.

මහාවිපාක තෙවන යුගයෙහි ඒ තෙතිස් චෛතසිකයන් ගෙන් ප්‍රීතිය හැර ඉතිරි චෛතසික දෙතිස (32) ද.

මහාවිපාක සතරවන යුගයෙහි ඒ තෙතිස් චෛතසිකයන් ගෙන් ප්‍රඥෙන්ද්‍රිය හා ප්‍රීතිය හැර ඉතිරි චෛතසික එක්තිස (31) ද සඞ්ග්‍රහවන්නාහුය.

මේ මහාවිපාක චිත්තයෙහි චතුර්විධ සඞ්ග්‍රහනය ක්‍රමයෝයි.

අට්ඨතිංස සත්තතිංස, ද්වයං ඡත්තිංසකං සුභෙ,
පඤ්චතිංස චතුත්තිංස, ද්වයං තෙත්තිංසකං ක්‍රියෙ.

තෙත්තිංසපාකෙ බාත්තිංස, ද්වයෙකත්තිංසකං භවෙ,
සහෙතුකාමාවචර, පුඤ්ඤපාකක්‍රියා මනෙ.

මේ කාමශොභන චිත්තයෙහි දොළොස් වැදෑරුම් සඞ්ග්‍රහනය ක්‍රමයෝයි.

---

### අකුසල චිත්තයෙහි සඞ්ග්‍රහනය.

ලොභමූලික පළමුවන අසංස්කාරික සිතෙහි අන්‍ය සමාන චෛතසික තෙළසය (13) අකුසල සාධාරණ චෛතසික සතරය (4)යන සතළොසම (17) ලොභය හා දෘෂ්ටිය ඇතුළත්කර ගැනීමෙන් චෛතසික එකුන්විස්සක් (19)ද.

ලොභමූලික දෙවන අසංස්කාරික සිතෙහි ඒ සතළොසම ලොභය හා මානය ඇතුළත්කරගැනීමෙන් චෛතසික එකුන් විස්සක් (19)ද.

ලොභමූලික තෙවන අසංස්කාරික සිතෙහි ප්‍රීතියහැර අන්‍ය සමාන චෛතසික දොළසය(12)අකුසල සාධාරණ චෛතසික සතරය (4) යන සොළසම (16) ලොභය හා දෘෂ්ටිය ඇතුළත් කරගැනීමෙන් චෛතසික අටළොසක් (18) ද.

ලොභමූලික සතරවන අසංස්කාරික සිතෙහි ඒ සොළසටම (16) ලොභය හා මානය ඇතුළත්කරගැනීමෙන් චෛතසික අටළොසක් (18) ද.

ද්වෙෂමූලික පස්වන අසංස්කාරික සිතෙහි ප්‍රීතිය හැර අන්‍ය සමාන චෛතසික දොළසය (12) අකුසල සාධාරණ චෛතසික සතරය (4) ද්වෙෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කුක්කුච්ච යන සතර හා සමග චෛතසික විස්සක් (20) ද සඞ්ග්‍රහවෙත්.

ලොභමූලික පළමුවන සසංස්කාරික සිතෙහි අන්‍ය සමාන චෛතසික 13.ය අකුසල සාධාරණ 4.ය යන සතළොසම (17) ලොභ, දෘෂ්ටි, ථීන, මිද්ධ යන සතර ඇතුළත්කරගැනීමෙන් චෛතසික එක්විසසක් (21) ද.

ලොභමූලික දෙවන සසංස්කාරික සිතෙහි අන්‍ය සමාන චෛතසික 13.ය අකුසල සාධාරණ 4.ය යන සතළොසට (17) ලොභ, මාන, ථීන, මිද්ධ, යන සතර ඇතුළත්කරගැනීමෙන් චෛතසික එක්විස්සක් (21) ද.

ලොභමූලික තෙවන සසංස්කාරික සිතෙහි ප්‍රීතියහැර අන්‍ය සමාන චෛතසික 12.ය අකුසල සාධාරණ 4.ය යන සොළසට (16) ලොභ, දෘෂ්ටි, ථීන, මිද්ධ, යන සතර ඇතුළත්කරගැනීමෙන් චෛතසික විස්සක් (20) ද.

ලොභමූලික සතරවන සසංස්කාරික සිතෙහි ප්‍රීතිය හැර අන්‍ය සමාන චෛතසික දොළසය(12) අකුසල සාධාරණ සතරය (4) යන සොළසට (16) ලොභ,මාන,ථීන, මිද්ධ, යන සතර ඇතුළත්කරගැනීමෙන් චෛතසික විස්සක් (20) ද.

ද්වේෂමූලික පස්වන සසංස්කාරික සිතෙහි ප්‍රීතිය හැර අන්‍ය සමාන චෛතසික දොළසය (12)අකුසල සාධාරණ සතරය(4) ද්වේෂ, ඊර්ෂ්‍යා, මාත්සර්‍ය්‍ය, කුක්කුච්ච, ථීන, මිද්ධ, සදෙනය යන චෛතසික දෙවිස්ස (22) ද සඞ්ග්‍රහවෙත්.

මොහමූලික උද්ධච්ච සහගත සිතෙහි ඡන්දය හා ප්‍රීතිය හැර අන්‍ය සමාන චෛතසික එකොළොසය (11) අකුසල සාධාරණ සතරය (4) යන චෛතසික පසළොස (15) ද.

මොහමූලික විචිකිච්ඡා සහගත සිතෙහි ඡන්ද, ප්‍රීති, අධිමොක්ෂ, තුන (3)හැර ඉතිරි අන්‍ය සමාන චෛතසිකදශය (10) අකුසල සාධාරණ සතරය (4)විචිකිච්ඡාවය (1)යන චෛතසික පසළොස (15) ද සඞ්ග්‍රහවෙත්.

එකූනවීසඨාරස, වීසෙකවීසවීසති,
වාවීසපන්නරසෙති, සත්තධා කුසලෙඨිතා.

මේ අකුසල චිත්තයෙහි සත්වැදෑරුම් සඞ්ග්‍රහනය ක්‍රමයෝයි.

## අහෙතුක චිත්තයෙහි සඞ්ග්‍රහනය.

හසිතොත්පාද චිත්තයෙහි ඡන්දය හැර ඉතිරි අන්‍යසමාන චෛතසික දොළොස (12) ද.

ව්‍යවස්ථාපන චිත්තයෙහි ඡන්දයහා ප්‍රීතිය හැර ඉතිරි අන්‍ය සමාන චෛතසික එකොළොස (11) ද.

සොම්නස්සහගත සන්තීරණ චිත්තයෙහි ඡන්දය හා වීර්‍ය්‍යය හැර ඉතිරි අන්‍ය සමාන චෛතසික එකොළොස (11) ද.

පඤ්චද්වාරාවර්ජනය,සම්පටිච්ඡන දෙසිත(2) උපෙක්ෂාසන්තීරණතෙසිත(3) යන සිත් පසෙහි ඡන්ද, ප්‍රීති, වීර්‍ය්‍ය, තුන (3)හැර ඉතිරි අන්‍ය සමාන චෛතසික දශය (10) ද.

දෙපස් විඥානදශයෙහි සර්ව්චිත්ත සාධාරණ චෛතසිකයෝ සත්දෙනද (7) සඞ්ග්‍රහවෙත්.

ද්වාදසෙකාදසදස, සත්තචාති චතුබ්බිධො,
අට්ඨාරසාහෙතුකෙසු, චිත්තුප්පාදෙසු සඞ්ගහො.

මේ අහේතුක චිත්තයෙහි සිව්වැදෑරුම් සඞ්ග්‍රහනය ක්‍රමයෝයි.

මෙතෙකින් සංක්ෂෙපනයින් 89. ක්වූද විස්තරනයින් 121. ක්වූද චිත්තයෙහි තෙතිස්වැදෑරුම් සඞ්ග්‍රහනය ක්‍රමය කියා නිමවනලදී.

---

මෙසේ බෙදා දක්වනලද විඥානධාතුව යටකී පරිද්දෙන් විදුලියක්සේ අස්ථිරවූ අනිත්‍ය ධාතුමාත්‍රයක්යයි නුවණැසින් දැක විදසුන් වඩා නිවන්පසක්කරනු පිණිස සකල සත්පුරුෂයන් විසින්ම නොපසුබට වෑයමින් උත්සාහකටයුතු.

අනිත්‍ය ලක්ෂණය නුවණැසින් දක්නාවූ පුද්ගලයාහට ආත්ම දෘෂ්ටිය පහවී අනාත්මපරිඥාව ඇතිවන්නේමැයි. එහෙයින්:—

**අඞ්ගුත්තරනිකායෙ නවකනිපාතෙහි** "අනිච්චසඤ්ඤිනො මෙඝිය අනත්තසඤ්ඤා සණ්ඨාති අනත්තසඤ්ඤී අස්මිමාන සමුග්ඝාතං පාපුණාති දිට්ඨෙව ධම්මෙ නිබ්බානං"යි වදාරනලදී. භාවය:—එම්බා මෙඝියනම් මහණ! අනිත්‍යලක්ෂණය නුවණැසින් දක්නාවූ පුද්ගලයාහට අනාත්ම ලක්ෂණයද පෙනීයේමය. අනාත්මලක්ෂණය පෙනීගියාවූ සත්පුරුෂතෙම 'මම'යයි ගන්නාලද අස්මිමානය සමුච්ඡේදවශයෙන් පහකොට ප්‍රත්‍යක්ෂ භවයෙහිම සවුපාදිශේෂ නිර්වාණයට පැමිණෙන්නේය යනුයි.

එහෙයින් උද්දේශගාථාවෙහි "**නෙසො හමස්මි නෙතං මෙ එවං ඤත්වා විරජ්ජති**"යි කියනලදී.

**මෙතෙකින් විඥානධාතු නිර්දේශය නිමි.**

---

1 ලඞ්කා ලඞ්කාර සඞ්කාසං, ථූපාරාම විභූසිතං,
"සෙඞ්ඛණ්ඩ සෙල"සඤ්ඤිතං, පුරං යත්ථ පතිට්ඨිතං.
2 තතො පුබ්බදිසාභාගෙ, අඩ්ඪයොජනමත්ථකෙ,
ගාමෙ "අරංගලා"ඛ්‍යාතෙ, කුලෙජාතෙන ජාතියා.
3 "කොලම්බ"නගරෙ ඉද්ධෙ, සාධුජ්ජනෙහි කාරිතෙ,
රම්මෙ "විසුද්ධාරාමස්මිං" නතවාරමහි හායනෙ.
4 වසතා මහතො භික්ඛු, ගණිස්ස ධම්මවාචිනා,
ධම්මවජ්ජෙහි සාධූහි, යාචිතෙන මයා සුභා.
5 සබ්බසාධූන මත්ථාය, පටිපත්ති රසාවහා.
අනෙක ගන්ථෙ නිස්සාය, කතායං "ධාතුදීපනී".
6 ඉමිනා පුඤ්ඤකම්මෙන, ලඞ්කාසන්දිට්ඨිකං සිවං
පරමත්ථං අරාධෙන්තු, ජනාසබ්බෙපි සුබ්බතා.

බෞද්ධ ඥානාලොකය හෙවත් ධාතුමනසිකාරදීපනිය.
ස මා ප්ත යි.

**නිබ්බානපච්චයො හොතු.**

---

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු